# කාර්යසාධන වාර්තාව

# 2018

# අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

උපරිමාධිකරණ සංකීර්ණය

කොළඹ 12.

www.moj.gov.lk

**අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

**නීතිඥ ගරු තලතා අතුකෝරළ මැතිතුමිය**

**අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්**

**ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල මැතිතුමා**

## ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියාගේ නිරීක්ෂණ

යුක්තිය පසිඳලීම කාර්යක්ෂම කිරීමත් නීති ප්‍රතිසංස්කරණය කිරීමත් බන්ධනාගාර පරිපාලනයත් උදෙසා 2018 වර්ෂය තුළ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට ඉතා විශාල කාර්යභාරයක් ඉටු කිරීමට හැකි විය. අමාත්‍යාංශ විෂයපථය 2018 වසරේ නොවැම්බර් 09 වන දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍යාංශය ලෙස වෙනස් වූ අතර නැවතත් මෙම වසරේ දෙසැම්බර් 28 වන දින සිට මෙම අමාත්‍යාංශය අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ලෙස නම් කරන ලදී. කෙසේ වුවද මෙම අමාත්‍යාංශය සහ එයට අයත් ආයතන 19 තුළින් 2018 වර්ෂය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත.

පුරවැසියන්ට යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය නව නීති හඳුන්වා දීම හා පවතින නීති සංශෝධනය මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීමකි. වසරේ මේ දක්වා මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් පනත් 05ක් පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට හැකි වී ඇත. තවත් වැදගත් පනත් 18ක් සම්මත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. නඩු දිනපතා විභාග කිරීම සඳහා ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ තුනක් පිහිටුවීම සඳහා අධිකරණ සංවිධාන පනත් කෙටුම්පත සංශෝධනය කිරීමද ඒ අතර වේ. ඒ යටතේ එක් ත්‍රිපුද්ගල මහාධිකරණයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දී, පිහිටුවා ඇති අතර අනෙක් මහාධිකරණ දෙක පිහිටුවීමට අවශ්‍ය පහසුකම් කඩිනමින් ලබාදීමට නියමිතය. එසේම මෙම වසර තුළ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශවයන්ට ලබා දුන් පනත් කෙටුම්පත් සංඛ්‍යාව 229කි. හඳුනාගත් නීති ක්ෂේත්‍ර 10ක් ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

අධිකරණ ක්ෂේත්‍රය වෙත එල්ල වී තිබෙන ප්‍රධානම අභියෝගය වන්නේ අධිකරණවල ගොඩගැසී ඇති විශාල නඩු ප්‍රමාණය අවසන් කිරීමෙන් යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් ඉවත් කිරීමයි. නඩු ප්‍රමාදය වැලැක්වීම සඳහා ප්‍රධානම විසඳුම වශයෙන් අධිකරණ පද්ධතියට නව තාක්ෂණය හඳුන්වා දීමයි. ඒ අනුව අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණය (Court Automation) සඳහා මූලික කටයුතු මේවන විට ආරම්භ කොට ඇත.

එසේම අධිකරණවල පැවැත්වෙන නඩු සඳහා රස පරීක්ෂක වාර්තා නොලැබීමෙන් සිදුවන ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව වසරේ මේ දක්වා ලැබුණු නඩු 42,166 න් 36,642කම රස පරීක්ෂක වාර්තා අධිකරණ වෙත ලබා දීමට සමත් වී ඇත. මෙම ක්‍රියාවලිය තවත් වේගවත් කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ස්වයංක්‍රීය ගිනි අවි විශ්ලේෂණ යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම තුළින් එහි ගොඩගැසී ඇති ගොනු ප්‍රමාණය අඩු කිරීමට උත්සාහ කරන ලදී. ඒ අනුව සහකාර රජයේ අධි නීතිඥවරු 30 දෙනෙකු සහ රජයේ අධි නීතිඥවරු 50 දෙනෙකු බඳවා ගෙන ඇත. වසර තුළ නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු ගොනු 14,869ක කටයුතු අවසන් කර ඇත.

එසේම අධිකරණ වෙත ගොඩගැසෙන නඩු ප්‍රමාදය අවම කිරීම සඳහා විකල්ප ක්‍රමවේද ප්‍රවර්ධනය මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාවයි. දිවයින පුරා ස්ථාපිත සමථ මණ්ඩල 329ක් මගින් ඒවාට යොමුවන ආරවුල් විසඳීමේ ප්‍රතිශතය පසුගිය වසර තුළ 67% කට ඉහළ මට්ටමකට රඳවා ගැනීමට සමත් වී ඇත. නිශ්චල දේපළ සම්බන්ධ ණය ගණුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනතාවට සහන සැලසීම සඳහා ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. දැනට කොළඹට සීමා වූ මෙම ආයතනය මහජනතාවට පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා විමධ්‍යගත කිරීමට මේ වන විට එම පනත සංශෝධනය කරමින් පවතී.

නීතිය පිළිබඳව අවබෝධයක් නොමැතිවීම අපරාධ සිදු කිරීම සඳහා මහජනතාව යොමු වීමට ප්‍රධාන හේතුවක් බවට පත් ව තිබේ. මේ සඳහා විසඳුමක් ලෙස ගරු අමාත්‍යතුමියගේ සංකල්පයක් අනුව පාසල් තුළ නීතිය විෂයක් වශයෙන් ඉගැන්වීම සඳහා අවශ්‍ය මූලික පියවර මේ වන විට ගෙන තිබේ. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර ඉදිරියේ දී පාසලේ හය වසරේ සිට ළමුන්ට මූලික නීතියේ සිට නීතිමය අවබෝධය ලබා ගැනිමට හැකියාව ඇති වන පරිදි නීතිය විෂයක් වශයෙන් පාසල්වල ඉගැන්වීමට කටයුතු යොදා ඇත.

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම ඉතා වැදගත් වේ. අළුත්කඩේ පවතින ඉතා පැරණි ගරා වැටුණු අධිකරණ සංකීර්ණය ස්ථාපිත කිරීම "අධිකරණ පියස" ඉදි කිරීමේ ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මෙම වසර තුළ වත්තල අධිකරණ සංකීර්ණය අතිගරු ජනාධිපති තුමාගේ සුරතින් මහජන අයිතියට පත් කිරීමට හැකි වූ අතර තවත් අධිකරණ සංකීර්ණ කීපයකම ඉදිකිරීම් කටයුතු මේවන විට සිදු වෙමින් පවතී. රත්නපුර, වැලිමඩ, තෙල්දෙණිය හා කිළිනොච්චිය අධිකරණ සංකීර්ණ ඉදි කිරීමද 2018 තුළ ආරම්භ කර ඇත.

විනිශ්චයකාරවරුන්ට ස්වාධීනව යුක්තිය පසිඳලීමේ කාර්යය සිදු කිරීම සඳහා ආරක්ෂිත නේවාසික පහසුකම් සැපයීම අවශ්‍ය වේ. මෙම වසර තුළ බිබිල, සියඹලාන්ඩුව, පොළොන්නරුව, විනිසුරු නිල නිවාසවල ඉදිකිරීම් අවසන් කල අතර තවත් නිල නිවාස 08ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. විනිශ්චයකාරවරුන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් දේශීය විදේශීය සම්මන්ත්‍රණ, වැඩමුළු, පාඨමාලා 24ක් වසර තුල පවත්වා ඇත.

දිළිඳුකම හේතුවෙන් නීතියේ පිළිසරණ ලබා ගැනීමට නොහැකි ජනතාවට යුක්තිය කරා ප්‍රවේශයක් ලබා දීමට දිවයින පුරා නීති ආධාර මධ්‍යස්ථාන 83ක් ස්ථාපිත කර ඇත. එම මධ්‍යස්ථාන කරා පැමිණි 163,181 දෙනෙකුට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සේවය ලබා දී ඇත. 2018 වසර තුළ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් ලැබුණු පැමිණිලි 86ක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත.

මෙම වසර තුළ සිදු වූ අමාත්‍යාංශ විෂයපථ සංශෝධනයත් සමග බන්ධනාගාර ප්‍රජා විශෝධනයට අදාළ කටයුතු මෙම අමාත්‍යාංශයට පැවරිණි. වර්තමානයේ බන්ධනාගාරවල රැඳවියන් 24,000ක ගෙන් පමණ පිරී ඉතිරී ඇති අතර එම තදබදය අවම කර ගැනීම සඳහා විවිධ පදනම් යටතේ දඬුවම් ලිහිල් කරනු ලබයි. මෙම වසර තුල සුළු වරද කරුවන් සඳහා ප්‍රජා විශෝධන ආඥා 12,783ක් ලබා ගැනීමට ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන 2018 වර්ෂය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන උපයෝගී කරගෙන තම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර ඇති අතර, එහිදී පුනරාවර්ථන වියදම් 96% ක සාමාන්‍යයක් ඉක්මවා දරා ඇති අතර ප්‍රාග්ධන වියදම් දැරීමේදී 74%ක සාමාන්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරයි. අධිකරණ පරිපාලන අංශය මගින් 2018 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ආයතන තම අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියා කිරීමේදී විවිධ අංශ මනාව සම්බන්ධීකරණය කරගනිමින් මතුවන ගැටළු නිරාකරණය කර ගනිමින් හා පසුවිපරම් කරමින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක වීම පිළිබඳ අමාත්‍යාංශයේ සමාලෝචන රැස්වීම් පැවැත්වීම තුළින් ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වැඩිදුර අවධානයක් යොමු කිරීම මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මගින් ආයතනික අරමුණු ඉටු කර ගැනීමේදී ඉහළ මූල්‍ය විනයක් පවත්වාගෙන යාම සඳහා ආයතන ප්‍රධානීන් මෙහෙයවීමට කටයුතු කිරීමද ඒ සඳහා සියළුම ආයතන ප්‍රධානීන්ගෙන් ලැබී ඇති සහයෝගයද අගය කරමි.

අධිකරණ ක්ෂේත්‍රය තුළ විශාල ප්‍රගතියක් අත්කර ගැනීම උදෙසා අධිකරණ අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන වෙත මග පෙන්වන අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය නීතිඥ ගරු තලතා අතුකෝරාළ මැතිණියට මාගේ හෘදයාංගම කෘතඥතාවය පල කරමි. එසේම මෙම කාර්යයන් ඉටු කිරීම උදෙසා මාවෙත සහයෝගය දක්වන අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලය ද කෘතවේදීව සිහිපත් කරමි.

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල
ලේකම්
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# පටුන

පිටු අංකය

1. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර 09
2. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්යයන් 10
3. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන 11
4. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ කාර්යයන් සංක්ෂිප්තව 13
5. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ කාර්යසාධනය
 5.1 නීති අංශය 14
 5.2 ආයතන අංශය 26
 5.3 සංවර්ධන අංශය 34
 5.4 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය 50
 5.5 මූල්‍ය අංශය 52
 5.6 අභ්‍යන්තර විගණන අංශය 56
6. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන
 6.1 නීතිපති දෙපාර්තමේන්තුව 57
 6.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව 61
 6.3 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව 64
 6.4 රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව 67
 6.5 මහා භාරකාර දෙපාර්තමේන්තුව 69
 6.6 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව 72
 6.7 බන්ධනාගාර දෙපාර්තමේන්තුව 74
 6.8 ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව 78
 6.9 සමථ මණ්ඩල කොමිෂන් සභාව 81
 6.10 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය 84
 6.11 අධිකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු ආයතනය 85
 6.12 ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ (ඇපයෙන් සීමිත) සමාගම 87
**7.** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන
 7.1 නීති ආධාර කොමිෂන් සභාව 88
 7.2 උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය 92
 7.3 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය 93
 7.4 අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 97
 7.5 වාණිජ සමථ මධ්‍යස්ථානය 100
8. අධිකරණ
 8.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය 101
 8.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය **103**
 8.3 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි 104
9. අනුබද්ධිත ආයතන
 9.1 නීති විද්‍යාලය 106

# අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## දැක්ම

- ❖ යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක්

- ❖ ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## මෙහෙවර


- ❖ කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- ❖ පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## 02. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්යයන්


- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාළවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම,පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් වෙනත් කිසිඳු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු.
- සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම.
- උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුළුව සමස්ථ පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව කාර්යක්ෂමව ඉටුකිරීම.
- රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු.
- රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම.
- නීති කෙටුම්පත් කිරීම.
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, එම දඬුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- සමස්ථ ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කම්කරු විනිශ්චය සභා පරිපාලනයට සහ ඊට අදාළ අනෙකුත් කටයුතු.
- නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම.
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම.
- ශ්‍රීලංකා නීති වාර්තා පලකිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්.
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- 2000 අංක 44 ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතට අදාල කටයුතු
- බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය
- ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු

## 03. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

### අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු



## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



## 04.අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්ගේ කාර්යයන් සංක්ෂිප්තව

අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,

i. නීති අංශය
ii. ආයතන අංශය
iii. සංවර්ධන අංශය
iv. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය
vii. මූල්‍ය අංශය
viii අභ්‍යන්තර විගණන අංශය

**i. නීති අංශය**

යුක්තිය පසිඳලීමට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව දැනට පවත්නා නීති සංශෝධනය හා නව නීති සම්පාදනය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීමට කටයුතු කිරීම, නීති වාර්තා පල කිරීම සහ පරිවර්තනය කිරීම.

**ii. ආයතන අංශය**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අධිකරණ වල අනිකුත් සියලුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii. සංවර්ධන අංශය**

සැලසුම් ඒකකය මගින් අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය සිදුකරයි. සංවර්ධන ඒකකය මගින් අධිකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි සංවර්ධන කාර්යයන් ඉටු කිරීම හා සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ. ඉංජිනේරු ඒකකය මගින් අධිකරණ සංකීර්ණ, ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම සිදු කරනු ලැබේ. මෙම අංශ තුනෙහිම රාජකාරි අතිරේක ලේකම් සංවර්ධන විසින් අධීක්ෂණය කරනු ලැබේ.

**vi. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය**

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මඟින් බන්ධනාගාර ආයතන තුළ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා රැඳවි පුනරුත්ථාපන කටයුතු කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට හා විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම අධීක්ෂණය හා පසුවිපරම් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

**vii. මූල්‍ය අංශය**

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**viii. අභ්‍යන්තර විගණන අංශය**

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය

# 05. අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි කාර්යසාධනය

## 5.1 නීති අංශය

**5.1.1 <u>2018 වර්ෂයේ ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 වන විට අධිකරණ අමාත්‍යාංශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද පනත් සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජිත පනත් කෙටුම්පත්</u>**

### අ) සම්මත කර ගන්නා ලද පනත්

**01.** <u>අධිකරණ සංවිධාන (සංශෝධන) පනත</u>

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත යටතේ සිදුකරනු ලබන සංශෝධනයක් වශයෙන්, එකවර විනිශ්වයාසනය හොබවන විනිශ්වයකාරයවරුන් තිදෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයක් ස්ථාපනය සඳහා අවැසි විධිවිධාන සහිතව මෙම සංශෝධනය ඉදිරිපත් කර ඇත.

මෙකී සංශෝධනය ප්‍රකාරව ගරු නීතිපතිවරයා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් වරදේ ස්වභාවය, බරපතලකම සහ සංකීර්ණතාවය සහ වරද සිදු කිරීමේ හා ඒ හා සම්බන්ධ කරුණු ද, සැලකිල්ලට ගෙන ගරු අග විනිසුරුතුමාගේ අභිමතය ප්‍රකාරව මෙකී මහාධිකරණයේ නඩු පැවරීමේ හැකියාව ලැබේ. මෙම පනත් කෙටුම්පත 2018 අංක 09 දරන අධිකරණ සංවිධාන (සංශෝධන)පනත ලෙස පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී.

**02.** <u>භාර ආඥා (සංශෝධන) පනත</u>

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම අවම කිරීම පිණිස මෙම පනතේ විෂය පථය පුළුල් කොට ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ආසියා ශාන්තිකර කණ්ඩායම විසින් පවත්වන ලද ඇගයීම් මගින් සහ මූල්‍ය බුද්ධි ඒකකය මගින් පෙන්වා දී තිබුණි.

එකී විධිවිධාන ඇතුලත් කර 2018 අංක 06 දරන භාර (සංශෝධන) පනත ලෙස පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී.

**03.** <u>සාපරාධී කරුණු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත</u>

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සම්පාදනය කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් ආසියා පැසිෆික් කණ්ඩායමේ කරුණු දැක්වීම සහ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට සහ සයිබර් අපරාධ පිළිබඳ බුඩාපෙස්ට් සම්මුතියට අනුගත වීම පිළිබඳ අවධානය යොමු කරමින්, අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාවය දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව කමිටු අවස්ථාවේ එකඟ වූ සංශෝධන සහිතව 2018 අංක 24 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ (සංශෝධන) පනත ලෙස පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලදී. ඒ අනුව පනතේ දෙවන වගන්තිය යටතේ නියමය අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2088/28 දරන අංක 2018.09.11 දින ප්‍රකාශයට පත් කර ඇත.

**04.** **<u>සංස්ථාගත නීති අධ්‍යාපන සභා ආඥා පනතේ 7 වන වගන්තිය යටතේ සංස්ථාගත නීති අධ්‍යයන සභාව විසින් එහි 2 වන රීතිය සංශෝධනය කිරීම</u>**

උක්ත රීතිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා නීති විද්‍යාලය සඳහා නියෝජ්‍ය විදුහල්පති තනතුරක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. වර්තමානයේ විදුහල්පතිවරයා විසින් සිදු කළ යුතු රාජකාරීවලින් කොටසක් පැවරීම සඳහා දෙවන පාලනාධිකාරියක් ඇති කිරීම මෙම සංශෝධනයේ අරමුණ වේ. ඒ අනුව එකී සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇත.

**05.** **<u>අපරාධයක වගකීම දැරීම සඳහා වූ අවම වයස</u>**

**<u>(අ) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත</u>**

වයස අවුරුදු 12 ට අඩු ළමයකු විසින් සිදුකරන කිසිවක් වරදක් නොවන බව යෝජිත සංශෝධනය විසින් විශේෂයෙන් දක්වා ඇත. තව ද, වයස අවුරුදු 12ට වැඩි 14ට අඩු ළමයකු සම්බන්ධයෙන්, එම ළමයා විසින් සිදුකරන ලද දෝෂාරෝපිත අපරාධය පිළිබඳව ප්‍රමාණවත් චේතනාවක් හෝ අවබෝධයක් දරාගැනීමට හැකියාවක් ඇති විචාරණ බුද්ධියක් එම ළමයා සතුද යන්න නිශ්චය කිරීමේ අභිමතය මහේස්ත්‍රාත්වරයා වෙත ප්‍රදානය කිරීම සඳහා මෙම පනතින් ප්‍රතිපාදන සලසනු ලබයි. මෙම පනත් කෙටුම්පත 2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධිත) පනත වශයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**<u>(ආ) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධත) පනත</u>**

දණ්ඩ නීති සංග්‍රහයට කරනු ලබන උක්ත සංශෝධනයට අමතරව, ළමයා විසින් සිදුකරන දෝෂාරෝපිත වරද සම්බන්ධයෙන් ඔහුගේ හැසිරීම සහ ප්‍රතිවිපාකය විනිශ්චය කිරීමට ප්‍රමාණවත් තරම් පරිණත වූ අවබෝධයක් ළමයා විසින් ලබා තිබේ ද යන්න පිළිබඳ නිරීක්ෂණයට ලක්කොට රජයේ වෛද්‍යවරයාගේ මතය පොලීසිය වෙත වාර්තා කිරීමටත්, ළමයා හට යම් චිකිත්සක ප්‍රතිකාරයක් අවශ්‍ය ද යන්න තීරණය කිරීම සඳහාත් රජයේ වෛද්‍ය නිලධාරියකු වෙත ළමයා ඉදිරිපත් කිරීමට මහේස්ත්‍රාත්වරයාට ඉඩසැලසීම සඳහා විධිවිධාන සැලසීමට මෙම සංශෝධනය හඳුන්වා දෙන ලදී. මෙම පනත් කෙටුම්පත 2018 අංක 11 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධත) පනත වශයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

## ආ) යෝජිත සංශෝධන පනත් කෙටුම්පත්

**01.** **<u>ළමා (අධිකරණ ආරක්ෂාව) පිළිබඳ පනත් කෙටුම්පත</u>**

ශ්‍රී ලංකාව විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අපරානුමත කිරීමත් සමඟම ළමුන්ගේ රැකවරණය සහ ළමා අධිකරණ පද්ධතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩුවලට ඉක්මන් සහ දිගුකාලීන ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය උද්ගත වූණි. වර්තමානයේ මේ සම්බන්ධයෙන් 1939 අංක 48 දරන ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත අදාළ වේ. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස එම විෂයට අදාළ අමාත්‍යාංශ, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ UNICEF සංවිධානය, පොලිසිය, අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන ආදී ප්‍රධාන පෙළේ සේවා සපයන්නන් සමඟ පවත්වන ලද සාකච්ඡාවන් පදනම් කර ගෙන ඉහත ආඥා පනතේ I, II, V සහ VI යන පරිච්ඡේද පරිච්ඡින්න කිරීමටත් ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අඩංගු ප්‍රමිතීන් ඇතුළත් කර ජාත්‍යන්තරය පිළිගත් පනත් කෙටුම්පත් සකස් කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. මේ සම්බන්ධව තවදුරටත් අධ්‍යනය කර වාර්තා කිරීමට කමිටුවක් අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් පත් කර ඇත.

**02** <u>අසභ්‍ය ප්‍රකාශන පනත් කෙටුම්පත</u>

අසභ්‍ය ප්‍රකාශනවලට අදාළ වර්තමාන නීතිය, ළමයින් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම පිණිස 1995 දී සංශෝධනය කරන ලද 1883 පනවන ලද දණ්ඩනීති සංග්‍රහයේ ද, 1983 දී සංශෝධිත 1927 අශ්ශීල ප්‍රකාශන ආඥා පනතේ ද, අන්තර්ගත වේ. මෙම නීති ප්‍රඥප්ති දෙකෙහි අන්තර්ගත නෛතික විධිවිධාන වර්තමානයේ සිදු වන අපරාධ මැඩලීමට ප්‍රමාණවත් නොවේ. මෙම පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති වෙත යොමු කර ඇත.

**03.** <u>නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත</u>

ව්‍යාජ ලෙස ලේඛන ලියා සහතික කිරීම, ව්‍යාජ ලේඛන මත ඉඩම් විකිණීම වැනි වංචා සහගත ඉඩම් ගනුදෙනු බහුල ලෙස පැවතීම හේතුවෙන් එවැනි වංචනික ක්‍රියා අවම කිරීම සඳහා සහ එකී වංචනිකයන් නීතිය හමුවට යුහුසුළුව රැගෙන යාම කඩිනම් කිරීම සඳහා නොතාරිස් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව වංචා වැළැක්වීම පිණිස සාධන පත්‍ර ලියා අත්සන් තබන අවස්ථාවේ දී ජීවමිතික අත්සන් උපයෝගී කර ගැනීම සඳහා ප්‍රතිපාදන අන්තර්ගත කරමින් සකස් කරන ලද පනත් කෙටුම්පත වැඩිදුර කටයුතු සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාව විසින් එකී කෙටුම්පත අනුමත කිරීමෙන් ඉක්බිතිව නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ඇතුළත් කරමින් කෙටුම්පතක් නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත ඉදිරිපත් කර ඇත. නීතිපතිවරයාගේ නිරීක්ෂණ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇති අතර, එය නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත ද යොමු කර ඇත. ඉන් අනතුරුව නීතිඥ සංගමයේ නිරීක්ෂණ ද ලබා ගන්නා ලද අතර, ඒ අනුව නැවත සකස් කරන ලද කෙටුම්පත සහ නීතිපතිවරයාගේ සහතිකය ලැබී ඇත. ඒ අනුව අවසානාත්මක කෙටුම්පත සහ කැබිනට් පත්‍රිකාව ස්වදේශ කටයුතු ඇමතිතුමාගේ අත්සනට යොමු කර ඇති බවට දැනුම් දී ඇත.

**04.** <u>මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත</u>

ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් පත්කරන ලද විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ සලීම් මාර්සූෆ් මහතාගේ සභාපතීත්වයෙන් යුක්ත කමිටුවක් මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සඳහා යෝජිත සංශෝධන සම්බන්ධයෙන් වූ අවසන් වාර්තාව ගරු අමාත්‍යතුමියට පිළිගන්වන ලදී. එකී වාර්තාවේ අන්තර්ගතයට අදාල කරුණු පිළිබඳව ඉස්ලාම් ආගමික නායකයින්, මන්ත්‍රීවරුන් සහ මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරන සංවිධාන සමඟ වැඩිදුරටත් සාකච්ඡා පැවැත්විණ. එකඟත්වයකට එළඹීමේ ප්‍රයත්නයක් වශයෙන් හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඒ.ඩබ්.ඒ.සලාම් මැතිතුමා අතර හමුවක් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

**05.** <u>ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත</u>

එම පනත් කෙටුම්පතට නීති කෙටුම්පත් සම්පාදක විසින් නීතිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කර ඇති අතර, එය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇත.මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිරීක්ෂණ ලැබී ඇති අතර, ඒ අනුව මෙම පනත් කෙටුම්පත සංශෝධනය කර ඇත. අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කොට ඇත. නීතිපතිගේ සහතිකය ද ලැබී ඇත. කැබිනට්ටුවට යොමු කිරීම පිණිස කැබිනට් පත්‍රිකාව ඇමතිතුමාගේ අත්සනට යොමු කර ඇති බව ඇනුම් දී ඇත.

**06.** <u>අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත (නීතිඥවරයෙකු වෙත ප්‍රවේශ වීම)</u>

අත්අඩංගුවට ගත් තැනැත්තෙකුට නීතිඥවරයකුගේ උපදෙස් ලබා ගැනීම පිණිස ඒ තැනැත්තාට තිබෙන අයිතිවාසිකම් හඳුන්වාදීම පිණිස අපරාධ නඩු විධාන සංග්‍රහයට කරන යෝජිත සංශෝධන සමාලෝචනය කිරීම පිණිස ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් නීතිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුව විසින් කෙටුම්පතක් සකස් කරන ලදී.

ඒ අනුව ප්‍රථම කොට වසර හතරක (04) ක කාල සීමාවක් සඳහා පමණක් බලාත්මකවන පරිදි පනත පැනවීමටත්, එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සිදු කරනු ලබන ඇගයීමක් මත පදනම්ව පනතේ කාලය තවදුරටත් දීර්ඝ කිරීමට විධිවිධාන ඇතුලත් කරන ලද පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගන්නා ලද සාමුහික තීරණයක් මත තවදුරටත් මෙම පනත සම්මත කිරීමට අවශ්‍ය නොවන බවට ගරු අමාත්‍යතුමිය විසින් තීරණය කරන ලදී.

## 07. <u>සිවිල් නඩුවිධාන සංග්‍රහයට කරනු ලබන සංශෝධනය (118, 119 වන වගන්ති) දිවුරුම්දුන් භාෂා පරිවර්තකවරුන් පත්කිරීම</u>

දැනට දිවුරුම්දුන් භාෂා පරිවර්තකවරුන් පත්කිරීම පිළිබඳ විධිමත් ක්‍රියාපටිපාටියක් හෝ ඔවුන්ගේ වෘත්තීය චර්යාව අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් නොමැත. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 119 වන වගන්තිය තුළ මේ සම්බන්ධයෙන් යම් විධිවිධාන අන්තර්ගත වුව ද, එකී විධිවිධාන තුළින් ප්‍රමාණවත් පරිදි ගැටළු සහගත තත්ත්වයන්ට පිළියම් නොලැබෙන බව නිරීක්ෂණය කර ඇත.

මේ පිළිබඳ සලකා බැලීමෙන් පසුව, සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරිපත් කර ඇත. මේ වන විට අධිකරණ අමාත්‍යාංශය විසින් පනත් කෙටුම්පත සමාලෝචනයෙන් පසුව අවසන් කෙටුම්පත සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් අනතුරුව මෙම කර්තව්‍ය පරිපාලනමය වශයෙන් විසඳීමට හැකියාව ඇති බව දන්වන ලද බැවින් මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරමින් පවතී.

## 08. <u>බෙදුම් නඩු නීතිය සම්බන්ධයෙන් යෝජිත සංශෝධන</u>

පරවේණි නිලකාරයාට බෙදුම් නඩුවක් හෝ පංගුවට අයත් ඉඩමක් සම්බන්ධයෙන් නඩුකරයක් ගෙන ඒමට හැකි වන පරිදි බෙදුම් පනත සංශෝධනය කිරීම මෙමඟින් අරමුණු කරයි. මෙය විභාග වෙමින් පවතින සියලු නඩු ආවරණය වන ලෙස අතීතයට බලපාන පරිදි සංශෝධනය කිරීමට නියමිතය. ඒ අනුව සකස් කරන ලද සංශෝධිත පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යොමු කර ඇති අතර, නීතිපතිවරයාගේ නිරීක්ෂණ පිළිබඳව වැඩිදුර සාකච්ඡා නීති කොමිෂන් සභාව සමඟ පැවැත්වීමට නියමිතය.

## 09. <u>1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත (45 වන වගන්තියට කරනු ලබන සංශෝධනය)</u>

දැනට සමාදාන විනිශ්චයකාරවරුන් පත් කිරීම සිදු කරනු ලබන්නේ අධිකරණ කලාපවලට වන අතර, ඒ පිළිබඳව ඇති වූ ගැටළු සලකා බලමින් එකී පත් කිරීම් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා සිදු කිරීම පිණිස මෙම සංශෝධනය ඉදිරිපත් කරන ලදී. අදාළ කෙටුම්පත ගැසට් පත්‍රයේ පල කිරීම සඳහාත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා කැබිනට් සංදේශයක් අමාත්‍යතතුමිය විසින් ඉදිරිපත් කර ඇත. එකී පනත් කෙටුම්පතට පහත සංශෝධන යෝජනා වී ඇත.

1) පත්වීම් අවසන් කිරීම, අවලංගු කිරීම සහ අත්හිටුවීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ නියෝග ;
2) දැනටමත් පත්කර ඇති සාමදාන විනිශ්චයකාරවරුන් අදාළ පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ඇතුළත් කිරීම ;

## 10. <u>ගර්භනී භාවය අවසන්කර ගැනීමේ අවසර ලත් ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම පිණිස දණ්ඩ නීති සංග්‍රහයට සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට සිදු කරන සංශෝධන</u>

හඳුනාගත් පහත සඳහන් නිශ්චිත අවස්ථාවල දී වින්දිත තැනැත්තියගේ හෝ වින්දිත තැනැත්තිය බාල වයස්කාරියක වන අවස්ථාවක දී භාරකරුගේ කැමැත්ත සහිතව ආරක්ෂිත සහ නෛතික ගබ්සා ක්‍රියා මාර්ගවලට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම මෙම සංශෝධනයේ අරමුණ වේ.

- ස්ත්‍රී දූෂණය සහ ව්‍යාභිචාරයෙන් ඇති වන ගර්භනීභාවය.
- වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයකු ගර්භනීභාවයට පත් වීම. (ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයේ වින්දිතයකු) සහ,
- බරපතල කළල දුබලතාවයන් ඇති අවස්ථාවක දී.

ඉහත සංශෝධනයන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියේ කොන්දේසි ප්‍රකාරව ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් ආගමික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරුන් ඇතුළුව සියලු ආගමික නායකයින් සමඟ සංවාදයක් පැවැත් වීමට කටයුතු කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර සලකා බැලීම සඳහා ජනාධිපතිතුමන් විසින් විශේෂිත සාකච්ඡාවක් 2018 සැප්තැම්බර් 06 වෙනි දින ජනාධිපති කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු කරන ලද අතර, ඉදිරියේදී ආගමික නායකයන් රැස්කොට වැඩිදුර සාකච්ඡාවක් පැවැත්වීමට එහිදී තීරණය කර ඇත.

## 11. <u>දණ්ඩ නීති සංග්‍රහයට සිදු කිරීමට නියමිත සංශෝධන (වෛවාහක ස්ත්‍රී දූෂණය, පුරුෂයන් අතර දැඩි අශෝභන ලිංගික ක්‍රියා (365අ)</u>

මේ සම්බන්ධයෙන් සලකා බලා නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ සභාපතීත්වයෙන් පත් කරන ලද කමිටුව විසින් දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය සඳහා සලකා බලමින් පවතී.

## 12. <u>1941 අංක 39 දරන ණය සහනදායක පනත් කෙටුම්පත</u>

උක්ත ආඥා පනත මඟින් ණය සහනදායක මණ්ඩලය පිහිටුවීම හා ඊට අදාළ වන ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇත. මහජනයාට පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා වර්තමානයේ කොළඹට පමණක් සීමා වී ඇති ණය සහනදායක මණ්ඩලය දිවයිනේ විවිධ පළාත්වල ශාඛා මණ්ඩල පිහිටුවීම මඟින් වඩාත් ප්‍රචලිත කිරීම සඳහා මෙම සංශෝධන පනත් මඟින් යෝජනා කර ඇත.

ඒ අනුව ශාඛා මණ්ඩල පිහිටුවීම සඳහා අවශ්‍ය වන පරිදි මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කිරීමටත්, සාමාජිකයන්ගේ පත් කිරීමේ සුදුසුකම් වෙනස් කිරීම සඳහා ආඥා පනත සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

## 13. <u>අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස ඉදිරිපත්කරන පනත් කෙටුම්පත (මහේස්ත්‍රාත්වරුන් විසින් පොලිස් ස්ථාන අධීක්ෂණය කිරීම සඳහා බලය පැවරීම)</u>

මහේස්ත්‍රාත්වරයෙකු පත් කරනු ලැබ ඇත්තේ යම් අධිකරණ කොට්ඨාසයක් වෙනුවෙන් ද ඒ අධිකරණ කොට්ඨාශය තුළ පිහිටි සෑම පොලිසියක්ම අවම ලෙස සෑම මසකදීම එක් වතාවක් හෝ පරීක්ෂා කිරීමට බලය පැවරීම මෙම සංශෝධනයෙන් අපේක්ෂා කෙරේ. මෙම පනත් කෙටුම්පත ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

## 14. <u>බන්ධනාගාර පනත් කෙටුම්පත</u>

රැඳවියන් බන්ධනාගාර භාරත්වයේ තබා ගැනීමට සහ රඳවා තබා ගැනීම සඳහා බන්ධනාගාර පිහිටුවීම, රැඳවියන්ට සැලකීම සහ පුනරුත්ථාපනය සැපයීම, ජාත්‍යන්තරව පිළිගත් ජාත්‍යන්තරව මූලධර්මවලට අනුව රැඳවියන්ට සත්කාර කිරීම සහ බන්ධනාගාර කළමනාකරණය කිරීම, බන්ධනාගාර අඥාපනතේ පරිච්ජේද 54 පරිච්ඡින්න කිරීම සඳහා හා ඊට අදාළ කරුණු සළකා බැලීම, මෙම සංශෝධනයෙන් අපේක්ෂා කෙරේ.

නීතිපතිගේ නිරීක්ෂණ ද සළකා බලා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කළ කෙටුම්පත තවදුරටත් අධ්‍යනය කරමින් පවතියි.

## 15. තැනැත්තෙකුගේ මරණය සඳහා අලාභ අය කර ගැනීම

තුන්වන පාර්ශවයක නොසැලකිල්ල හෝ අපරීක්ෂාකාරීත්වය හේතුවෙන් පුද්ගලයකු මිය යන අවස්ථාවක මානසික වේදනාව සහ පීඩාව වෙනුවෙන් යැපෙන්නන් වන්දියක් අයකර ගැනීම මෙම පනත් කෙටුම්පතින් අපේක්ෂා කෙරේ. මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## 16. අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සඳහා සංශෝධන - (දිනපතා නඩු විභාග කිරීම සහ පූර්ව නඩු විභාග කාර්යපටිපාටිය)

බරපතල අපරාධ සම්බන්ධයෙන් යුක්තිය පසඳලීමේ යාන්ත්‍රණයේ අධික ප්‍රමාදයට පිළියම් වශයෙන් පහත සංශෝධන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට ඇතුළත් කිරීම මෙම සංශෝධනය මඟින් බලාපොරොත්තු වේ.

I. හඳුනාගත් නිශ්චිත විශේෂිත වරදවල් සම්බන්ධයෙන් දෛනික පදනමින් මහාධිකරණවල නඩු විභාග කිරීම අනිවාර්යය කිරීම.

II. නීතිය මඟින් නිශ්චය කර ඇති මූලික/පූර්ව නඩු විභාග කාරණා විභාග කිරීම සඳහා විශේෂිත කාල පරිච්ඡේදයක් ඇතුළත නඩු විභාග කරන විනිශ්චයකාරවරයා හැර වෙනත් විනිශ්චයකාරවරයෙකු වෙත පැවරීම.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරිපත් කරන ලද අවසන් කෙටුම්පත නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

## 17. අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සඳහා සංශෝධන - (හඳුනාගත් නිශ්චිත අවස්ථාවන් යටතේ සැකකරුවෙකු /චූදිතයෙකු අධිකරණයට පැමිණීමේ අවශ්‍යතාව ඉවත් කිරීම)

ඇප ලබා දීම සඳහා මහේස්ත්‍රාත්වරයා වෙත බලය පවරා නොමැති අවස්ථාවලදී, රක්ෂිත බන්ධනාගාරගත කිරීම දීර්ඝ කිරීම සඳහා පමණක් අධිකරණ වෙත සිරකරුවන් රැගෙන යාමේදී සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් සළකා බැලීමෙන් අනතුරුව, සිරකරුවන්ගේ සුභසාධනය පිළිබඳ අධීක්ෂණය සඳහා වූ අවශ්‍යතාව තවදුරටත් පවත්වා ගනිමින් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අදාළ නියෝගය දීර්ඝ කිරීමේ පරමාර්ථය සඳහා සැකකරු හෝ චූදිත තැනැත්තා මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණ වීම අවශ්‍ය නොවන ක්‍රියාපටිපාටියක් යම් නිශ්චිත හඳුනාගත් අවස්ථාවන් යටතේ නියම කිරීම සඳහා නව විධිවිධානයන් හඳුන්වා දීම මෙම සංශෝධනයෙන් අපේක්ෂා කෙරේ.

මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරිපත් කරන ලද අවසන් කෙටුම්පත ව්‍යවස්ථානුකූල සහතිකය ලබා ගැනීම සඳහා නීතිපතිවරයා වෙත ඉදිරිපත්කර ඇත.

## 18. 1975 අංක 01 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියට කරන සංශෝධන.

වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ පවත්වන්නා වූ එකී පනතේ වගන්ති උල්ලංඝනය සඳහා නියමව ඇති දඩ මුදල් සහ දඬුවම් කාලානුරූපව සංශෝධනය කිරීමට අදාළව මෙම කැබිනට් පත්‍රිකාව යොමුකරන ලදී. අමාත්‍ය මණ්ඩල තීරණය මත ඉදිරිපත් කරන ලද නිර්දේශ අන්තර්ගත කරන ලද අවසන් කෙටුම්පත නීතිපතිවරයාගේ ව්‍යවස්ථානුකූල භාවය සනාථ කරනු ලබන සහතිකය ලබා ගැනීම සඳහා යොමු කොට ඇත. කෙසේ වෙතත් අල්ලස් දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව විසින් මෙකී පනත හා අනෙකුත් ඊට අනුශාංගිකවන පනත් සංශෝධනය සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා ඇති බැවින් මෙම සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරමින් පවතියි.

## 19. පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, තොග රැස් කිරීම, නිෂ්පාදනය කිරීම සහ හුවමාරු කිරීම සහ තහනම් කිරීම සහ ස්වභාවයෙන් ඇති වන විනාශය පිළිබඳව වන සම්මුතියට (ඔටාවා සම්මුතියට) අදාල නීති කෙටුම්පත

ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිවරයා සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන අමාත්‍යාංශයත්, විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ව ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය

මණ්ඩල සංදේශයට අදාළව ඉහත සම්මුතියට ශ්‍රී ලංකාව ඇතුළත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රදානය කරන ලදී.

ඉහත කී සම්මුතියට අදාළව විධිවිධාන බලාත්මක කිරීම සඳහා බලය පැවරෙන ව්‍යවස්ථාවක් සම්පාදනය උදෙසා ලද අනුමැතිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත සකස් කරන ලදී.

## 5.1 ශ්‍රී ලංකා නීති වාර්තා

ශ්‍රී ලංකා නීති වාර්තා මුද්‍රණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතියි. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ලබාදෙන ලද වැදගත් නඩු තීන්දු ඇතුළත් නීති වාර්තා වෙළුම් දෙකක් සෑම වර්ෂයකදීම මුද්‍රණය කරනු ලැබේ.

### 5.1.3 ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම

#### අ) බන්ධනාගාරවල පවතින තදබදය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණය සම්බන්ධ අධිකරණමය සහ නෛතික හේතු සොයා බැලීම පිළිබඳ කාර්යය සාධක බලකාය

බන්ධනාගාර තදබදයට බලපානු ලබන නීතිමය හා අධිකරණ කාරණා සොයා බැලීම සඳහා කාර්යය සාධන බලකාය ස්ථාපිත කළ අතර, ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ සභාපතීත්වයෙන් මෙහෙය වනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, විනිශ්චයකරුවන් පුහුණු කිරීමේ ආයතනය, නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ දෙපාර්තමේන්තුව නියෝජනය ද සමඟ මෙම බලකාය කටයුතු කරනු ලබයි.

ඒ අනුව බන්ධනාගාරවල පවතින තදබදය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණය සම්බන්ධ අධිකරණමය සහ නෛතික හේතු සොයා බැලීම පිළිබඳ කාර්යය සාධක බලකායේ පළමු වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව මඟින් පහත නිර්දේශයන් ද ඇතුළත් එකී පළමු වාර්තාවේ නිර්දේශ සලකා බලමින් පවතී.

- 1999 අංක 46 දරන ප්‍රජාපාදක විශෝධන පනත ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවෙහි සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන් පුහුණු කිරීමේ ආයතනයෙහි සහය ඇතිව ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව සහ මහේස්ත්‍රාත්වරුන් අතර සංවාදයකට අවතීර්ණ වීම.

- දඩ මුදල් ගෙවීමට නොහැකි තැනැත්තන් සම්බන්ධයෙන් විවිධ ප්‍රමාණවලින් දඩ ගෙවීමට ඉඩ සැලැස්වීම ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ද ඉහත ආයතන එක්ව සාකච්ඡා කිරීම.

- 1991 අංක 8 දරන රක්ෂිත බන්ධනාගාර ගත කළ සිරකරුවන් මුදා හැරීම පිළිබඳ පනතේ ප්‍රතිපාදන අනුව මාසකට වරක් බන්ධනාගාරය වෙත මහේස්ත්‍රාත්වරයාගේ පැමිණීම තහවුරු කිරීම හා අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් අධීක්ෂණය කිරීම.

- බන්ධනාගාරයට යොමු කරන සිරකරුවන් සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා පොලිස් ඇප ලබා දීම සම්බන්ධයෙන් ඇප පනතේ විධිවිධාන පිළිබඳ ශ්‍රී ලංකා පොලිසිය දැනුවත් කිරීම.

## ආ) <u>මරණ දඬුවම, ජීවිතාන්ත හා අවු. 20ට වැඩි දීර්ඝ කාලීන සිරකරුවන්ගේ දඬුවම් ලිහිල් කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමට ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කළ කමිටුව</u>

මරණ දඬුවම, ජීවිතාන්ත සිර දඬුවම් සහ දීර්ඝ කාලීන සිර දඬුවම් ලබන සිරකරුවන්ගේ දඬුවම් ලිහිල් කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමට හිටපු ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කළ කමිටුව විසින් මේ වන විට දීර්ඝ කාලීන සිරකරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරමින් පවතී. ඒ අනුව මෙම කමිටුව විසින් දීර්ඝ කාලීන සිරකරුවන් 245 සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ඇත.

මෙහි පළමු පියවර ලෙස සිරකරුවන් 28කුගේ වාර්තා සිරදඬුවම් කාලය අඩු කිරීම හෝ නිදහස් කිරීම සඳහා වූ ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගේ නිර්දේශ සහිත ව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත දන්වා ඇත.

## ඇ) <u>2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුති පනත</u>

<u>**ශ්‍රී ලංකාවේ සිට වෙනත් රටකට ගෙන යන ළමුන් පිළිබඳ ලැබුන ඉල්ලීම් පිළිබඳ ප්‍රගතිය**</u>

| ළමුන් ගෙන ගිය රට | ලැබුණ ඉල්ලීම් ප්‍රමාණය |
|---|---|
| ඕස්ට්‍රේලියාව | 02 |

<u>**පිටරට සිට ශ්‍රී ලංකාවට ගෙන එන ළමුන් පිළිබඳ ලැබුන ඉල්ලීම් පිළිබඳ ප්‍රගතිය**</u>

| ළමුන් ගෙන ආ රට | ලැබුණ ඉල්ලීම් ප්‍රමාණය |
|---|---|
| ඕස්ට්‍රේලියාව | 03 |
| ඉතාලිය | 02 |
| ජපානය | 01 |
| ප්‍රංශය | 01 |
| නවසීලන්තය | 01 |

## ඈ) <u>1995 අංක 05 දරන වරදකරුවන් හුවමාරු කිරීමේ පනත යටතේ ඉල්ලීම්</u>

1995 අංක 05 දරන වරදකරුවන් හුවමාරු කිරීමේ පනත මගින්, ශ්‍රී ලංකාව තුළ දී වරදක් කළ වෙනත් රටක පුරවැසියකු එම රටට භාරදීම සඳහා සහ වෙනත් රටක දී වරදක් සිදුකරන ලද ශ්‍රී ලාංකික පුරවැසියෙකු නැවත මේ රටට භාරදීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලබයි.

මෙම වසරේදී එක්සත් රාජධානියේ දී වරදකරුවන් වූ ශ්‍රී ලාංකිකයකු මෙම පනතේ විධිවිධාන යටතේ ඉතිරි දඬුවම් කාලය ගත කිරීමට ශ්‍රී ලංකාවට භාර දෙන ලදී.

එසේම ශ්‍රී ලංකා සහ තායිලන්ත රජයන් අතර සිරකරුවන් හුවමාරු කිරීමේ ගිවිසුමක් මෙම වසරේදී අත්සන් කරන ලදී.

## ඉ) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාවට අදාළ ගිවිසුම්

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව පිළිබඳ විධිවිධාන බලාත්මක කිරීමේ අරමුණින් චීනය, එක්සත් අරාබි රාජධානිය, ඉන්දියාව, තායිලන්තය, බෙලරුසියාව, පකිස්තානය යුක්රේනය සහ රුසියාව ඇතුළු රටවල් සමඟ ශ්‍රී ලංකාව ගිවිසුම් අපරානුමත කර අත්සන් කර ඇති අතර ශ්‍රී ලංකාව සහ ස්විස්ටර්ලන්තය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තබා ඇත.

මෙම ගිවිසුම් මඟින් සාපරාධී කාරණාවල දී සහයෝගය දැක්වීම පිළිබඳ ව රාජ්‍ය පාර්ශ්වයන් විසින් විමර්ශනය කිරීම, පැමිණිලි ගොනු කිරීම, නඩු විභාග කිරීම සහ නීති කෘත්‍යයන්ගේ ප්‍රථිඵල ක්‍රියාත්මක කිරීම යන කරුණු පිළිබඳ විෂයයන් දක්වා ඇත.

## ඊ) විදේශගත වී සිටින විත්තිකරුවන්ට/සාක්ෂිකරුවන්ට ශ්‍රී ලංකාවේ අධිකරණ වලින් නිකුත් කරනු ලැබූ සිතාසි සම්බන්ධ කාරණා

2000 අංක 39 දරන සිවිල් සහ වාණිජ කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනත අනුව, මෙම වසර තුළ ශ්‍රී ලංකාවේ අධිකරණවලින් නිකුත් කරන ලද සිතාසි 429ක් පහත සඳහන් පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සහ සෘජුවම විදේශ රටවලට යොමු කරන ලදී.

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| කැනඩාව | 22 | ස්කොට්ලන්තය | 02 |
| චීනය | 08 | මැලේසියාව | 02 |
| බහරේන් | 03 | රුසියාව | 08 |
| හයිටි | 01 | සිෂෙල්ස් | 01 |
| සයිප්‍රස් | 07 | සිංගප්පූරුව | 05 |
| ඩෙන්මාර්ක් | 04 | නෙදර්ලන්තය | 05 |
| පෝලන්තය | 04 | නවසීලන්තය | 08 |
| මෝල්ටා | 03 | පිලිපීනය | 02 |
| ඔස්ට්‍රියාව | 06 | මාලදිවයින | 02 |
| ප්‍රංශය | 13 | ස්විස්ටර්ලන්තය | 03 |
| ජර්මනිය | 08 | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 34 |
| දෝහා කටාර් | 15 | ඕමානය | 02 |
| ජෝර්දානය | 07 | පකිස්ථානය | 01 |
| ස්පාඤ්ඤ | 02 | ස්වීඩනය | 05 |
| ඉරානය | 03 | අයිස්ලන්තය | 01 |
| ඉන්දියාව | 19 | එක්සත් රාජධානිය | 62 |
| චෙකොස්ලොවැකියාව | 01 | ඇමරිකා එක්සත් ජනපදය | 29 |
| අයර්ලන්තය | 02 | කොරියාව | 05 |
| ඊශ්‍රාලය | 12 | සවුදි අරාබිය | 18 |
| ඉතාලිය | 51 | කුවේට්ය | 06 |
| ජපානය | 14 | ඊජිප්තුව | 01 |
| ඕස්ට්‍රේලියාව | 19 | ග්‍රීසිය | 01 |
| ඇෆ්ගනිස්ථානය | 01 | ලෙබනනය | 01 |
| **එකතුව** | | | **429** |

### ඌ) ශ්‍රී ලංකාවේ සිටින විත්තිකරුවන්ට / සාක්ෂිකරුවන්ට විදේශ අධිකරණ වලින් නිකුත් කරනු ලැබූ සිතාසි /ඉල්ලීම් සම්බන්ධ කාරණා

2000 අංක 39 දරන සිවිල් සහ වාණිජ කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය ලබාදීමේ පනත යටතේ මෙම වර්ෂය තුළ ලේඛන භාරදීම සඳහා පහත පරිදි විදේශ රටවලින් ඉල්ලීම් 85ක් ලැබී ඇත.

| රට | ලැබුණු ඉල්ලීම් | රට | ලැබුණු ඉල්ලීම් |
|---|---|---|---|
| බෙලරුසියාව | 01 | රුමේනියාව | 01 |
| කැනඩාව | 13 | නෙදර්ලන්තය | 01 |
| එක්සත් රාජධානිය | 01 | බල්ගේරියාව | 01 |
| ප්‍රංශය | 12 | පෝලන්තය | 01 |
| ජර්මනිය | 04 | ඊජිප්තුව | 01 |
| චෙක් ජනරජය | 01 | ස්විස්ටර්ලන්තය | 05 |
| ඉන්දියාව | 12 | පෘතුගාලය | 01 |
| ඉතාලිය | 08 | ඇමරිකා එක්සත් ජනපදය | 06 |
| ජපානය | 04 | සිංගප්පූරුව | 03 |
| කොරියාව | 04 | ඕස්ට්‍රේලියාව | 01 |
| ලැට්වියාව | 01 | ඩෙන්මාර්ක් | 01 |
| කටාර් | 01 | චීනය | 01 |
| **එකතුව** | | | **85** |

2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනතට අනුකූලව මෙම වසර තුළ විදේශ රටවලින් ඉල්ලීම් 05ක් ලැබී ඇති අතර, ශ්‍රී ලංකාවෙන් ඉල්ලීම් 25 ක් විදේශ රටවලට යොමු කර ඇත.

## 5.1.4 තැනැත්තන් වෙළඳාමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය (NAHTTF)

2010 වර්ෂයේ දී, අධිකරණ අමාත්‍යාංශය විසින් තැනැත්තන් වෙළඳාමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය පිහිටුවන ලද අතර, තැනැත්තන් වෙළඳාමට එරෙහිව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන කටයුතු සම්බන්ධීකරණය, රැස්වීම් කැඳවීම, සාකච්ඡා කිරීම පිණිස මෙම කාර්ය සාධක බලකාය ජාතික සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. නඩු පැවරීම වේගවත් කිරීම සහ වින්දිතයන්ගේ ආරක්ෂාව දැඩි කිරීමත් පිණිස රජයේ නියෝජිත ආයතන අතර සම්බන්ධීකරණය, සවිබල ගැන්වීම මෙම ජාතික කාර්ය සාධක බලකායේ තවත් අරමුණකි. රටතුළ සිදුවන තැනැත්තන් වෙළඳාමට විසඳුම් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වශයෙන් හඳුනාගන්නා ලද සියලුම රාජ්‍ය නියෝජිතයන්ගෙන් මෙම ජාතික කාර්ය සාධක බලකාය සමන්විත වේ.

තැනැත්තන් වෙළඳාමට ගොදුරු වූ වින්දිතයින් හඳුනා ගැනීම, උපදේශනය සඳහා යොමු කිරීම, ඔවුන්ගේ ආරක්ෂාව නංවාලීම සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි, කාර්ය සාධන බලකාය විසින් වැඩි දියුණු කරන ලදී. එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර 2015 මාර්තු මාසයේ දී ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා පොලීසිය සඳහා සහ වෙනත් රජයේ නිලධාරීන්ගේ ශක්‍යතා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි කාර්යය සාධක බලකායේ විශේෂ අවධානය යොමුකර ඇත.

තැනැත්තන් වෙළඳාම සම්බන්ධ සිදුවීම් ආශ්‍රිත විමර්ශන කඩිනම් කිරීමේ කාර්ය සඳහා, ඊට අදාළ කරුණු මෙහෙයවීම පිණිස විශේෂ පොලිස් ඒකකයක් ජාතික කාර්ය සාධක බලකාය විසින් සිදු කරන ලද ඉල්ලීම මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පිහිටුවනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ තැනැත්තන් වෙළඳාමට එරෙහිවීම සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍යය ගනු ලැබූ ප්‍රයත්නයන් පිළිගැනීම සහ හඳුනාගැනීමක් ලෙස, 2017 වර්ෂයේ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව අනුව ඇමරිකානු

රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව 2 වන පෙළ අධීක්ෂණ ලැයිස්තුවේ සිට 2 වන පෙළ දක්වා උසස් කර ඇති අතර මෙකී කාර්යසාධන බලකායේ ක්‍රියාකාරිත්වය මත 2018 වසරේදී ද, එකී මට්ටම රඳවා ගැනීමේ හැකියාව ලැබී ඇත.

අධිකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාවට අනුකූලව ඕස්ට්‍රේලියානු රජය විසින් අනුමත කිරීමෙන් අනතුරුව සංක්‍රමණිකයින් පිළිබඳව වන ජාත්‍යන්තර සංවිධානය අධිකරණ අමාත්‍යාංශය සමඟ සම්බන්ධව මිනිස් වෙළඳාම වැළැක්වීම උදෙසා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. එකී ව්‍යාපෘතිය 2017 මැයි මස ආරම්භ වූ අතර තෝරා ගත් දිස්ත්‍රික්ක 6ක රජයේ නිලධාරීන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් වශයෙන් ද (TOT), මිනිස් වෙළඳාම සහ ඉන් වැලකීම සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමේ වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීම ද ප්‍රධාන කොට ගෙන ක්‍රියාත්මක වේ. තවත් දිස්ත්‍රික්ක 03ක් සඳහා ව්‍යාප්ත කරන ලදී.

### 5.1.5 අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

**අ) <u>ආසියානු සංවර්ධන බැංකුව (ADB)</u>**

ශ්‍රී ලංකාව පිළිබඳ තාක්ෂණ සහායක ව්‍යාපෘතිය: ආයෝජන හා වාණිජ නීති අංශය ඉලක්ක කරමින් අධිකරණ ක්ෂේත්‍රය කාර්යක්ෂමව සවිබල ගැන්වීම.

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ ව දැනුම සහ සහායක තාක්ෂණය ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ආසියානු සංවර්ධන බැංකුවේ සභාපති (සමායතන කළමනාකරණ පරිපාලනය) විසින් සංකල්ප පත්‍රය අනුමත කරනු ලැබ ඇති අතර, යහපත් ජීවන ආයෝජනයක් සඳහා ගමනාන්තයක් විය යුතු රටක් නිර්මාණය කිරීමේ කාර්ය උදෙසා පහසුකම් සලසමින්, රටේ ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ ප්‍රතිසංධාන න්‍යාය පත්‍රය සමඟ මෙම ජාත්‍යන්තර එකඟතාවය පෙළ ගස්වා ඇත.

තාක්ෂණ සහායක ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඩොලර් 750,000 ක් වන අතර එය ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණ සහයක විශේෂ අරමුදල (TASF-iv) මගින් ප්‍රදාන පදනමින් සපයනු ලබන මුදලක් වේ. ප්‍රතිපූර්ණ කාර්ය මණ්ඩලය, දේශීය සන්නිවේදන, උපදේශකවරු සඳහා කාර්යාල ඉඩපහසුකම් සහ වෙනත් ප්‍රදානයන් ආකාරයෙන් ශ්‍රී ලංකා රජය විසින් සහාය ලබා දෙයි. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලය 2017 ජූලි මස ආරම්භ වී 2020 ජූලි දක්වා වන වසර 3ක කාලයකි.

ව්‍යාපෘතියේ පළමු අදියරේදී, අවශ්‍යතා ඇගයීමක් මගින් සම්පූර්ණ අධ්‍යයනයක් සිදුකරනු ලබන අතර, ශ්‍රී ලංකාවේ ආයෝජනය, වාණිජ සහ ව්‍යාපාර සඳහා මනා අදාළත්වයකින් යුත් සහ කාර්යක්ෂම අධිකරණ ක්ෂේත්‍රයක් සකස් කිරීම උදෙසා ක්ෂේත්‍රයේ නෛතික නියාමක රාමුව වැඩි දියුණු කිරීම සඳහා නියාමන මෙවලමක් ලෙස ක්‍රියා කිරීමට උපාය මාර්ගික ක්‍රියාකාරි සැලැස්ම වැඩි දියුණු කරනු ලැබේ.

II වන අදියරේ දී උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම යටතේ හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පදනම් වූ ප්‍රතිසංස්කරණ එකක් හෝ දෙකක් තාක්ෂණ සහාය මගින් සහාය වන අතර අවසානාත්මක වශයෙන් අවශ්‍යතා ඇගයීම් අධ්‍යයනය සහ ප්‍රකාශයට පත්කළ හැකි තත්ත්වයේ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම සහ මහජනයා වෙත ප්‍රචලිත කිරීම සිදු කෙරේ.

මෙම තාක්ෂණ සහාය මහා මණ්ඩලයේ ආසියානු සංවර්ධන බැංකුවේ කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, අධිකරණ අමාත්‍යාංශය අදාළ උනන්දුවක් දක්වන්නන් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ඒ අනුව ව්‍යාපෘතියට අදාළ උපදේශකයින් පත් කර ඇති අතර ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට අදාල උපක්‍රමික සැලැස්ම (Stratigic Plan) සඳහා අවශ්‍ය දත්ත රැස් කරමින් විධිමත් අවශ්‍යතා පිළිබඳ විමර්ශනය(Need Assessment ) සිදු කරමින් පවතී.

## 5.1.6 අනෙකුත් කටයුතු

**අ) <u>සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනයට අධිකරණ අමාත්‍යතුමන් විසින් පත්කරන ලද කමිටුව</u>**

සිවිල් නඩු විධාන සංග්‍රහය සලකා බලා කාලානුරූපීව අන්තර්ජාතික නීති ප්‍රමිතිවලට අනුකූල වන ලෙස එයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන ලෙස දන්වා හිටපු ගරු අගවිනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රියසාත් ඩෙප් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. මෙම කමිටුව සිවිල් ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ වෘත්තීය නීතිඥයන්ගෙන් සැදුම්ලත් කමිටුවකි.

**ආ) <u>අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සහ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන සඳහා අධිකරණ අමාත්‍යතුමන් විසින් පත් කරන ලද කමිටුව</u>**

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට හා දණ්ඩ නීති සංග්‍රහයට කාලානුරූපීව සහ අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුකූල වන ලෙස අවශ්‍ය සංශෝධන නිර්දේශ කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු බුවනෙක අළුවිහාරේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. එය අධිකරණ අමාත්‍යාංශ නිලධාරීන්, අපරාධ නීති ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සහ වෘත්තීය නීතිඥයන්ගෙන් සමන්විත වේ.
මෙම කමිටුව විසින් දැනට අතුරු වාර්තා 3 ක් ගරු අධිකරණ අමාත්‍යතුමිය වෙත ඉදිරිපත් කර ඇත.

**ඇ) <u>ශ්‍රී ලංකාවේ අණපනත් යටතේ පවතින දඩ මුදල් සංශෝධනය කිරීම සඳහා පත්කරන ලද කමිටුව</u>**

මෙම කමිටුව විසින් මේ වන විට රැස්වී ඇති අතර දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, අයාල ආඥාපනත, ඇප පනත සලකා බලා ඇති අතර ඒවායේ යෝජිත දඩ මුදල් පිළිබඳ නැවත සලකා බලමින් පවතියි.

## 5.2 ආයතන අංශය

අධිකරණ අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නවයෙහි සහ ආයතන දහයෙහි ආයතන කටයුතු ආයතන අංශය මගින් සිදු කරනු ලබයි. පුහුණු හා කාර්යක්ෂම මානව සම්පතක් ලබා දීම සහතික කිරීම, යුක්තිය පසිඳලීමේ කර්තව්‍යයෙහිදී අවශ්‍ය පහසුකම් සැපයීම හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශයෙන් සිදු කරයි. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, සුදුස්සන් තෝරා ගැනීම, බඳවා ගැනීම, පුහුණු කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම හා විනය පාලන කටයුතු, අතිකාල ගමන් වියදම්, ණය අත්තිකාරම් ලබා දීම හා අවශ්‍යය අවස්ථාවන්හි දී පරිපාලනයට අදාල අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

උක්ත කාර්යයන් අධිකරණ පරිපාලනය, දෙපාර්තමේන්තු පරිපාලනය හා අභ්‍යන්තර පරිපාලනය යන අනු අංශ හා ඒ යටතේ ඇති ඒකක මගින් ක්‍රියාවට නංවනු ලබයි.

### 5.2.1. <u>අධිකරණ පරිපාලනය</u>

දිවයින පුරා පිහිටි සියලු අධිකරණ වල සේවය කරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත නිලධාරීන් හැර සෙසු නිලධාරීන් 5,609ක ගේ සියලු ආයතන කටයුතු මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

**5.2.1.1. <u>තනතුරු අනුමත කරවා ගැනීම</u>**

පහත සඳහන් තනතුරු සංඛ්‍යාව වැඩි කිරීම සඳහා 2018.03.19, 2018.05.17, 2018.08.16 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | | | එකතුව |
|---|---|---|---|---|
| | හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය | කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය | නාරම්මල මහේස්ත්‍රාත් අධිකරණය | |
| සංවර්ධන නිලධාරි | 03 | 03 | 03 | 09 |
| සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා | 04 | 04 | 04 | 12 |
| කාර්යාල සේවක සේවය | 03 | 14 | 11 | 28 |
| අධිකරණ ආරක්ෂක | 02 | 02 | - | 04 |
| එකතුව | 12 | 23 | 18 | 53 |

පහත සඳහන් තනතුරු අනුමත කර ගැනීම සඳහා අයදුම්පත් 2018.04.11, 2018.04.10 හා 2018.05.10 යන දිනයන් හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | එකතුව |
|---|---|---|
| | මහනුවර අතිරේක මහාධිකරණය | |
| සංවර්ධන නිලධාරි | 03 | 03 |
| සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා | 03 | 03 |
| අධිකරණ සෝෂක හා ප්‍රවේශක | 01 | 01 |
| අධිකරණ ආරක්ෂක | 02 | 02 |
| පිස්කල් පියන් | 02 | 02 |
| කාර්යාල කාර්ය සහයක | 12 | 12 |
| පිස්කල් භාරකාර මාතා | 02 | 02 |
| **එකතුව** | **25** | **25** |

### 5.2.1.2. බඳවා ගැනීම

| තනතුර | විධායක | තෘතියික | ද්විතීය | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|
| කාර්යාල සේවක සේවය | - | - | - | 244 | 244 |
| සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා | - | - | - | 119 | 119 |
| අධිකරණ සෝෂක හා ප්‍රවේශක | - | - | - | 17 | 17 |
| අධිකරණ ආරක්ෂක | - | - | - | 156 | 156 |
| පිස්කල් භාරකාර මාතා | - | - | - | 17 | 17 |
| පිස්කල් පියන් | - | - | - | 16 | 16 |
| **එකතුව** | **-** | **-** | **-** | **569** | **569** |

### 5.2.1.3. අධිකරණ සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම

| සන්නිවේදන පහසුකම් | 2018.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2018.12.31 දිනට සපයා ඇති සංඛ්‍යාව | 2018.01.01 සිට 2018.12.31 දක්වා නව සැපයුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| දුරකථන සම්බන්ධතා | 533 | 543 | 10 |
| අභ්‍යන්තර දුරකථන පද්ධති | 28 | 34 | 06 |
| අන්තර්ජාල සම්බන්ධතා | 142 | 155 | 13 |
| **එකතුව** | **703** | **732** | **29** |

## 5.2.2. දෙපාර්තමේන්තු පරිපාලනය

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නවයෙහි සහ ආයතන දහයෙහි පරිපාලන කටයුතු මෙහෙයවීම මේ යටතේ සිදු කරනු ලබයි.

### 5.2.2.1. නව තනතුරු ඇති කිරීම

| තනතුරු නාමය | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | | | | |
|---|---|---|---|---|---|
| | විධායක | තෘතියික | ද්විතීය | ප්‍රාථමික | එකතුව |
| ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක | 02 | - | - | - | 39 |
| සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක | 02 | - | - | - | |
| සැක කටයුතු ලේඛන පිළිබඳ සහකාර රස පරීක්ෂක | 04 | - | - | - | |
| ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක | 16 | - | - | - | |
| ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක | 01 | - | - | - | |
| යතුරු ලේඛක | - | - | 10 | - | |
| රියදුරු | - | - | - | 04 | |
| | මහා භාරකාර දෙපාර්තමේන්තුව | | | | |
| නීති නිලධාරි | 01 | - | - | - | 01 |
| එකතුව | 26 | - | 10 | 04 | 40 |

### 5.2.2.2. බඳවා ගැනීම

| ආයතනය | තනතුර | සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| නීතිපති දෙපාර්තමේන්තුව | රජයේ අධිනීතිඥ | 50 | 206 |
| | සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) | 30 | |
| | කාර්යාල කාර්ය සහයක | 114 | |
| | රියදුරු | 12 | |
| මහාභාරකාර දෙපාර්තමේන්තුව | රියදුරු | 01 | 01 |
| ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | රියදුරු | 02 | 02 |
| අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | සහකාර අධ්‍යක්ෂක (පාලන) | 01 | 04 |
| | රියදුරු | 03 | |
| ශ්‍රේෂ්ඨාධිකරණය | නීති පරීක්ෂක නිලධාරි | 11 | 12 |
| | ප්‍රධාන ආරච්චි | 01 | |
| ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 04 |
| | රියදුරු | 01 | |
| අභියාචනාධිකරණය | නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | 02 | 04 |
| | පොත් බැඳුම්කරු | 02 | |
| නීති ආධාර කොමිෂන් සභාව | කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | 02 | 02 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | සහකාර බන්ධනාගාර අධිකාරී | 09 | 09 |

කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ ලඝු ලේඛක තනතුරෙහි පුරප්පාඩු 35ක් සඳහා බඳවා ගැනීමට 2018.11.15 දිනට අයදුම්පත් කැඳවා ඇත.

## 5.2.3. අභ්‍යන්තර පරිපාලනය

අභ්‍යන්තර පරිපාලනය යටතේ පරිපාලන, සාම විනිසුරු, හදිසි මරණ පරීක්ෂක හා අධිකරණ වෛද්‍ය නිලධාරී, සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් හා දිවුරුම් කොමසාරිස්, දිවුරුම් දුන් භාෂා පරිවර්තක සහ ප්‍රවාහන යන ඒකක ක්‍රියාත්මක වේ.

### 5.2.3.1. පරිපාලන ඒකකය

#### 5.2.3.1.1. තනතුරු අනුමත කරවා ගැනීම

| තනතුර | විධායක | තෘතීයික | ද්විතියික | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|
| අතිරේක ලේකම් (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ) | 01 | - | - | - | 01 |
| අධ්‍යක්ෂ (විමර්ශන) | 01 | - | - | - | 01 |
| සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | - | - | - | 01 |
| එකතුව | 03 | - | - | - | 03 |

#### 5.2.3.1.2. බඳවා ගැනීම

තාක්ෂණ නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගෙන ඇත.

### 5.2.3.1.3. පුහුණුවීම් හා ධාරිතා සංවර්ධනය

විනිසුරුවරුන් හා අධිකරණ අමාත්‍යාංශයේ සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ සිට සුළු සේවකයින් දක්වා සියලුම සේවක ශ්‍රේණි ආවරණය වන පරිදි පහත දැක්වෙන අයුරින් පුහුණුවීම් ලබා දෙන ලදි.

(අ) **දේශීය පුහුණුවීම**

| නිලධාරී කාණ්ඩය | නිලධාරීන් සංඛ්‍යාව | මුළු වියදම (රු.) |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 73 | 1,832,676.00 |
| මාණ්ඩලික නොවන ශ්‍රේණි | 146 | 888,700.00 |
| එකතුව | 219 | 2,721,376.00 |

තවද, රජයට අනුබද්ධිත වෘත්තීය පුහුණු ආයතන මඟින් හා රාජ්‍ය විශ්ව විද්‍යාල මඟින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පුහුණු ලාභීන් 42 ක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දී ඇත.

(ආ) **විදේශීය පුහුණුව**

| නිලධාරීන් සහ පුහුණුවේ ස්වභාවය | නිලධාරීන් සංඛ්‍යාව | මුළු වියදම (රු) |
|---|---|---|
| අමාත්‍යාංශ නිලධාරීන් - සම්මන්ත්‍රණ | 07 | 5,100,343.38 |
| අමාත්‍යාංශ නිලධාරීන් පුහුණු | 19 | 4,938,407.21 |
| මහාධිකරණ ගණකාධිකාරීවරුන් - පුහුණු | 01 | 559,492.00 |
| එකතුව | **27** | **10,598,242.59** |

### 5.2.3.1.4. විනය කළමනාකරණය

**අ. මූලික විමර්ශන**

2018 වර්ෂය තුළ මූලික විමර්ශන 26 ක් ආරම්භ කර ඇති අතර මෙම කාලය තුල පෙර වර්ෂ වල අවසන් නොවී පැවති මූලික විමර්ශන 05ක් අවසන් කර ඇත.

**ආ. විධිමත් විනය පරීක්ෂණ**

2018 වර්ෂය තුළ නව විධිමත් විනය පරීක්ෂණ 02ක් ආරම්භ කර ඇති අතර, පෙර වර්ෂවල අවසන් නොවී පැවති විධිමත් විනය පරීක්ෂණ 09ක් සඳහා විනය නියෝග ලබා දී අවසන් කර ඇත.

### 5.2.3.1.5. ණය අනුමත කිරීම

| ණය වර්ගය | නිලධාරීන් සංඛ්‍යාව | මුදල (රු) |
|---|---|---|
| දේපළ / නිවාස | 04 | 8,628,640.00 |
| ආපදා | 194 | 21,028,376.00 |
| උත්සව | 182 | 1,820,000.00 |
| විශේෂ | 74 | 296,000.00 |
| පාපැදි | - | - |
| එකතුව | **454** | **31,773,016.00** |

### 5.2.3.2. සාම විනිසුරු ඒකකය

| සාම විනිසුරු පත්වීමේ ඒකකය | සංඛ්‍යාව |
|---|---|
| මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි | 5,088 |
| අධිකරණ කලාපයට බල පැවැත්වෙන පරිදි | 2,332 |
| එකතුව | 7,420 |

### 5.2.3.3 හදිසි මරණ පරීක්ෂක හා අධිකරණ වෛද්‍ය නිලධාරී ඒකකය

**(අ) හදිසි මරණ පරීක්ෂක**

දිවයින පුරා හදිසි මරණ පරීක්ෂකවරුන් 460 ක් සේවයේ නිරත වන අතර යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ ඉතා වැදගත් මූලික කාර්යභාරයක් ඔවුන් විසින් ඉටු කෙරේ. ඒ අනුව, මහජනතාවට උපරිම පහසුවක් සැලසෙන අයුරින් හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම හා හදිසි මරණ පරීක්ෂක කොට්ඨාස යාවත්කාලීන කිරීම මෙම ඒකකය මඟින් සිදු කෙරේ.

පහත සඳහන් පරිදි හදිසි මරණ පරීක්ෂකවරු පත් කර ඇත.

| දිස්ත්‍රික්කය | හදිසි මරණ පරීක්ෂකවරුන් සංඛ්‍යාව |
|---|---|
| යාපනය | 03 |
| වව්නියාව | 01 |
| කිලිනොච්චිය | 01 |
| මන්නාරම | 01 |
| මාතර | 13 |
| කොළඹ | 01 |
| කෑගල්ල | 01 |
| ගාල්ල | 01 |
| කුරුණෑගල | 01 |
| එකතුව | 23 |

**(ආ) අධිකරණ වෛද්‍ය නිලධාරී**

අධිකරණ වෛද්‍ය කටයුතු වල නිරත විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන්, විශ්ව විද්‍යාල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ මහාචාර්යවරුන්, සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරීන් හා වෛද්‍ය නිලධාරීන් සඳහා පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම හා අධිකරණ වෛද්‍ය වාර්තා සැකසීම වෙනුවෙන් දීමනා ලබා දීම හා සම්බන්ධ කටයුතු මෙම ඒකකය මඟින් සිදු කෙරේ.

### 5.2.3.4. සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් හා දිවුරුම් කොමසාරිස් ඒකකය

**අ)** වෘත්තියේ වසර 15 ක සේවා කාලයක් සපුරා ඇති නීතිඥවරු 19 ක් සාම විනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත්වරු ලෙස 2018 වර්ෂය තුළ පත් කර ඇත.

**ආ)** නීතිඥවරුන් 700ක් දිවුරුම් කොමසාරිස්වරුන් ලෙස 2018 වර්ෂය තුළ පත් කර ඇත.

### 5.2.3.5. දිවුරුම් දුන් භාෂා පරිවර්තක ඒකකය

සිවිල් නඩු විධාන සංග්‍රහ පනත අනුව දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් පත් කිරීම ගරු දිසා විනිසුරුවරුන් සිදු කරන අතර, එම පත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම අධිකරණ අමාත්‍යාංශය මගින් සිදු කෙරේ.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා අනෙකුත් විදේශ භාෂාවන් සඳහා දිවුරුම් දුන් භාෂා පරිවර්තකවරු 2,101 ක් මේ වන විට දිවයින පුරා පත් කරනු ලැබ සිටිති. දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් පත් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය 2018.06.30 දින පවත්වා දිවුරුම් දුන් භාෂා පරිවර්තකවරුන් ලෙස එම සංඛ්‍යාව පත් කිරීමට සුදුසු බවට දිසා විනිසුරුවන් වෙත නිර්දේශ කර ඇත.

| පරිවර්තනය කරනු ලබන භාෂාව | දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් සංඛ්‍යාව |
|---|---|
| සිංහල - දෙමළ | 16 |
| සිංහල - ඉංග්‍රීසි | 100 |
| දෙමළ - ඉංග්‍රීසි | 20 |
| ජපන් - ඉංග්‍රීසි | 13 |
| ජපන් - සිංහල | 05 |
| ප්‍රංශ - ඉංග්‍රීසි | 01 |
| ප්‍රංශ - සිංහල | 01 |
| රුසියන් - ඉංග්‍රීසි | 01 |
| රුසියන් - සිංහල | 01 |
| එකතුව | 158 |

### 5.2.3.6. ප්‍රවාහන ඒකකය

සියලුම මහාධිකරණ විනිසුරුවන්, අධිකරණ නිලධාරීන් සහ අමාත්‍යාංශය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන රක්ෂණය කිරීම හා වාහන නඩත්තු කටයුතු මෙම ඒකකය මගින් සිදු කෙරේ.

සියලුම මහාධිකරණ විනිසුරුවන් හා අනෙකුත් අධිකරණ නිලධාරීන් සඳහා 228 වැය ශීර්ෂය යටතේ වාහන 78 ක් වෙන්කර ඇත.

**අමාත්‍යාංශ වැය ශීර්ෂය 110 යටතේ නඩත්තු වන වාහන සංඛ්‍යාව**

| අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ වාහන වෙන් කිරීම | වාහන සංඛ්‍යාව |
|---|---|
| ගරු අමාත්‍යතුමිය හා කාර්ය මණ්ඩලය | 08 |
| අමාත්‍යාංශ නිලධාරීන් | 13 |
| සංචිත | 39 |
| එකතුව | 60 |

**2018 වර්ෂය තුළ වාහන නඩත්තු කිරීම**

| වාහන විෂය | වියදම (රු.) |
|---|---|
| 110-1-1-1301 | 8,888,649.92 |
| 110-01-1-2003 | 3,170,775.70 |
| 110-1-2-1301 | 8,051,208.07 |
| 110-1-2-2003 | 2,242,031.05 |
| එකතුව | 22,352,664.74 |

### 5.2.3.7. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | |
| ලේකම් | 1 | 1 | - |
| අතිරේක ලේකම් (පාලන) | 1 | 1 | - |
| අතිරේක ලේකම් (සංවර්ධන) | 1 | 1 | - |
| අතිරේක ලේකම් (බන්ධනාගාර) | 1 | - | 1 |
| අතිරේක ලේකම් (නීති) | 2 | 1 | 1 |
| අතිරේක ලේකම් (විනිසුරු) | 1 | 1 | - |
| ප්‍රධාන මූල්‍ය නිලධාරි | 1 | 1 | - |
| ජ්‍යෙ.ස.ලේ.(පාලන) | 2 | 1 | 1 |
| ජ්‍යෙ.ස.ලේ.(නී.ති) | 1 | 1 | - |
| ජ්‍යෙ.ස.ලේ. | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | - | 1 |
| අධ්‍යක්ෂ (විමර්ෂණ) | 1 | - | 1 |
| අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 1 | 1 | - |
| සහකාර ලේකම් (පාලන) | 5 | 5 | - |
| සහකාර ලේකම් (බන්ධනාගාර) | 1 | 1 | - |
| සහකාර ලේකම් (නීති) | 4 | 4 | - |
| ගණකාධිකාරි | 4 | 3 | 1 |
| සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 2 | 2 | - |
| ඉංජිනේරු **(කොන්ත්‍රාත් 1 )** | 3 | 3 | - |
| ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ අනුකාරක සභාවේ නීති උපදේශක **(කොන්ත්‍රාත්)** | 1 | 1 | - |
| නීති උපදේශක **(කොන්ත්‍රාත්)** | - | 1 | - |
| අතිරේක සංස්කාරක (කොන්ත්‍රාත්) | - | 1 | - |
| **තෘතියික මට්ටම** | | | |
| භාෂා පරිවර්තක අධිකාරි | 1 | 1 | - |
| පරිපාලන නිලධාරි | 1 | - | 1 |
| භාෂා පරිවර්තක | 7 | 7 | - |
| තොරතුරු තාක්ෂණ නිලධාරි | 1 | - | 1 |
| භාෂා පරිවර්තක (කොන්ත්‍රාත්) | - | 1 | - |
| පුස්ථකාලයාධිපති (කොන්ත්‍රාත්) | - | 1 | - |

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **ද්විතීය මට්ටම** | | | |
| සංවර්ධන නිලධාරී | 63 | 46 | 17 |
| උපාධිධාරී අභ්‍යාසලාභී | - | 10 | - |
| ගිණුම් සහකාර | 1 | - | 1 |
| වැඩසටහන් සහකාර | - | 1 | - |
| සංවර්ධන සහකාර | 1 | 2 | - |
| මූල්‍ය සහකාර | 1 | 5 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 66 | 64 | 2 |
| නිශ්චල ඡායාරූප ශිල්පී | 1 | 02 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2 | 02 | - |
| යතුරු ලේඛක | 10 | 4 | 6 |
| පිළිගැනීමේ නිලධාරි | 2 | 2 | 0 |
| **ප්‍රාථමික මට්ටම** | | | |
| තාක්ෂණ නිලධාරි | 24 | 19 | 5 |
| රියදුරු | 30 | 25 | 5 |
| කාර්යාල සේවක සේවය | 50 | 49 | 1 |
| විදුලි කාර්මික | 06 | 5 | 1 |
| ජලනල කාර්මික | 06 | 5 | 1 |
| පෙදරේරු | 05 | 3 | 2 |
| වඩු කාර්මික | 05 | 5 | - |
| කම්කරු | 10 | 8 | 2 |
| සංචාරක බංගලා භාරකරු | 02 | 2 | - |
| සහය කැමරාකරු | 01 | 1 | - |

## 5.3 සංවර්ධන අංශය

මෙම අංශය යටතේ සැලසුම්, සංවර්ධන, ඉංජිනේරු යන ඒකක ක්‍රියාත්මක වේ.

### 5.3.1 සැලසුම් ඒකකය

#### 5.3.1.1 හැඳින්වීම

සැලසුම් අංශය මගින් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එයට අයත් ආයතනවලට අදාළව ව්‍යාපෘති හඳුනා ගැනීම ප්‍රගති සමාලෝචනය හා අධීක්ෂණය කරනු ලබයි. ඒ යටතේ පහත කාර්යයන් සැලසුම් අංශය විසින් ඉටු කරනු ලබයි.

- අධිකරණ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීම.
- ව්‍යාපෘති ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමත කර ගැනීම.
- විදේශ ආධාර අපේක්ෂිත ව්‍යාපෘති යෝජනා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- නව ව්‍යාපෘති වල මූලික අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන සැලැස්මට ඇතුළත් කිරීම
- අමාත්‍යාංශ හා අධිකරණ පරිපාලන වැය ශීර්ෂවලට අදාළ මූල ධන අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.
- අයවැය කථාව සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරීම.
- ප්‍රගති සමාලෝචනය සහ අදාළ ආයතන වෙත ප්‍රගතිය වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර අයවැය විවාදය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික වාර්තා සඳහා අවශ්‍ය විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය සඳහා සංයුක්ත, උපක්‍රමික හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන ව්‍යාපෘති පසු විපරම් කිරීම.
- අධිකරණවල නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛණ රැස්කර වාර්ෂික සංඛ්‍යා ලේඛණ වාර්තාව සකස් කිරීම.

#### 5.3.1.2 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය

අ. **<u>ව්‍යාපෘති හඳුනා ගැනීම</u>**

i. රාජ්‍ය ආයෝජන සැලැස්ම සඳහා 2018-2021 දක්වා සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම

| ආයතනය | සංවර්ධන ව්‍යාපෘති | | | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 |
| අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | රත්නපුර, වැලිමඩ, කිළිනොච්චිය, තෙල්දෙණිය, පූගොඩ, කන්තලේ, අධිකරණ සංකීර්ණ ඉදි කිරීම.<br>රඹඩගල්ල සහ හැටන් අධිකරණවල කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම. | මාවනැල්ල, වලපනේ, වාකරේ, හෙල්බොඩ, නාරම්මල අධිකරණ ඉදි කිරීම.<br>අක්කරේපත්තුව, මහව, කුළියාපිටිය, ඇඹිලිපිටිය, නාවලපිටිය සහ හලාවත විනිසුරු නිල නිවාස ඉදි කිරීම.<br>ගල්කිස්ස අධිකරණ සංකීර්ණය පූර්ණ ප්‍රතිසංස්කරණය<br>නඩු ගොනු ඩිජිටල්කරණය | පුත්තලම, මොරටුව, පොතුවිල් සහ බද්දේගම අධිකරණ සංකීර්ණ ඉදි කිරීම.<br>කුච්චවේලි සංචාරක නිකේතනයක් ඉදි කිරීම | ගම්පහ සහ උඩුගම අධිකරණ සංකීර්ණ ඉදි කිරීම. |

| ආයතනය | සංවර්ධන ව්‍යාපෘති | | | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 |
| ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | | ස්වයංක්‍රීය ගිනි අවි විශ්ලේෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | | |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | මන්නාරම සිර මැදිරිය ඉදි කිරීම | වාරියපොල බන්ධනාගාරය සංවර්ධනය, මාතර බන්ධනාගාරය විතැන් කිරීම.<br>වැලිකඩ, අනුරාධපුර, කළුතර සහ මහර හට නිවාස ඉදි කිරීම.<br>බන්ධනාගාර තුළ ආරක්ෂිත කැමරා සවි කිරීම. | ගාල්ල බන්ධනාගාරය විතැන් කිරීම | - |
| අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | - | ප්‍රධාන කාර්යාල සංකීර්ණය ඉදි කිරීම. | - | - |
| නීති ආධාර කොමිෂන් සභාව | - | දඹුල්ල, කඩුවෙල නීති ආධාර මධ්‍යස්ථාන ඉදි කිරීම<br>පොළොන්නරුව ගම්පහ, බණ්ඩාරවෙල නීති ආධාර මධ්‍යස්ථාන සංවර්ධනය | වාලච්චේන, සියඹලාණ්ඩුව සහ පූගොඩ නීති ආධාර මධ්‍යස්ථාන ඉදි කිරීම.<br>කුළියාපිටිය, අනුරාධපුර, බලංගොඩ, මාවනැල්ල නීති අධාර මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම. | උඩුගම හා දෙයියන්ද්‍ර නීති ආධාර මධ්‍යස්ථාන ඉදි කිරීම. |

ii. 2019 සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 564ක් අධිකරණ 164ක සංඛ්‍යාවකට අදාළව හඳුනා ගැනීම

ආ. <u>ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම</u>

| ආයතනය | යෝජනාව |
|---|---|
| අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මාවනැල්ල, වලපනේ, නාරම්මල, වාකරේ හා හෙල්බොඩ අධිකරණ සංකීර්ණ ඉදි කිරීම, හලාවත අධිකරණ ගොඩනැගිල්ල සහ ගල්කිස්ස අධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය. |
| | අක්කරෙයිපත්තු, මහව, පොතුවිල් හා කුළියාපිටිය නඩු භාණ්ඩ කාමර ඉදි කිරීම |
| | හලාවත, ඇඹිලිපිටිය, නාවලපිටිය හා දෙයියන්දර විනිසුරු නිල නිවාස ඉදි කිරීම. |
| | නඩු ගොනු ඩිජිටල්කරණය |
| | බීමත්කම පරීක්ෂා කිරීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ව්‍යාධික අධිකරණ වෛද්‍ය විද්‍යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම. |

| ආයතනය | යෝජනාව |
|---|---|
| ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව | ප්‍රජා විශෝධන නියෝග යටතේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් නිවැරදි කිරීම. |
| | ප්‍රජා විශෝධනය යටතේ බස්නාහිර පළාතේ හෙරොයින් සඳහා ඇබ්බැහි වූ වරදකරුවන් සඳහා ප්‍රතිකාර වැඩසටහන් හඳුන්වා දීම. |
| අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | විනිසුරුවරුන්, නීතිඥවරුන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| | අපරාදයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් සඳහා පහසුකම් සැලසීම සහ 2015 අංක 04 දරණ පනතේ 13 වන වගන්තිය යටතේ විමර්ශන මෙහෙයවීම. |
| නීති ආධාර කොමිෂන් සභාව | නීති ආධාර කොමිෂන් සභාවේ නීති අංශය හා ව්‍යාපෘති අංශය කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. |
| | අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්, සරණාගතයින්, ගෘහමූලික කාන්තාවන්, අතුරුදන් වූ තැනැත්තන්ගේ පවුල් සහ සංක්‍රමික සේවකයන් සඳහා නීති ආධාර සහයයන් පුළුල් කිරීම සඳහා වැඩ සටහන් ආධාරක අංශය විධිමත් කිරීම. |
| | දඹුල්ල සහ කඩුවෙල නීති ආධාර මධ්‍යස්ථාන ඉදි කිරීම. |
| | නීති ආධාර සහායයන් පුළුල් කිරීම සඳහා වැඩසටහන් ආධාරක අංශය විධිමත් කිරීම |
| උපරිමාධිකරණ සංකීර්ණ කලමනාකරණ මණ්ඩලය | මධ්‍යම වායුසමන චිලර් යන්ත්‍රයක් මිලදී ගැනීම |

**ඇ.** **<u>විදේශ ආධාර අපේක්ෂාවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත පහත යෝජනා ඉදිරිපත් කර ඇත.</u>**

- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ස්වයංක්‍රීය ගිනි අවි විශ්ලේෂණ උපකරණයක් ලබා දීම සඳහා විදේශ ආධාර දෙන්නෙකු සොයා ගැනීම.
- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක නිලධාරීන් සඳහා KOICA ආයතනය මගින් පුහුණුවීම් ලබා ගැනීම.
- ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවට දත්ත විශ්ලේෂණ පද්ධතියක් ලබා දීම හා විද්‍යාත්මක නිලධාරීන් පුහුණු කිරීම සඳහා UNIDO ආයතනය මගින් පුහුණුවීම් ලබා දීම.

**ඈ.** **<u>ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇත.</u>**

1. හංගේරියානු ණය ආධාර යටතේ අධිකරණ ස්වයංක්‍රීයකරණ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
2. මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් අරමුදල් ලබා ගැනීම.
3. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ස්වයංක්‍රීය ත්‍රිමාණ ප්‍රතිබිම්බ අන්වීක්ෂීය සැසඳුම් විශ්ලේෂණ යන්ත්‍රයක් මිලදී ගැනීම
4. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයට චිලර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු මගින් අරමුදල් ලබා ගැනීම

## ඉ. අය වැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

2019 වර්ෂය සඳහා අමාත්‍යාංශ හා අධිකරණ පරිපාලන වැය ශීර්ෂවලට අදාළ මූලධන අයවැය ඇස්තමේන්තු 2018.08.07 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ගිණුම් අංශයට ලබා දෙන ලදී.

## ඊ. අයවැය යෝජනා ඉදිරිපත් කිරීම

2019 අයවැය කථාව වෙනුවෙන් පහත යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. අධිකරණගොඩනැගිලි අළුත්වැඩියාව හා නවීකරණයකිරීම
2. අධිකරණවල නඩු ගොනු ඩිජිටල්කරණය කිරීම.
3. බන්ධනාගාරවල ආරක්ෂාව සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
4. නීතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
5. අධිකරණ සඳහා යටිතල පහසුකම් සැපයීම
6. දුෂ්කර පළාත් සඳහා විනිසුරු නිල නිවාස ඉදිකිරීම
7. අපනයනය මූලික කරගත් නිශ්පාදන ගම්මානයක් ඇති කිරීම.

## උ. ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මුලධන වියදම් සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට 2018.02.15 දින ඉදිරිපත් කරන ලදී.

## ඌ. ප්‍රගති සමාලෝචනය

i. ප්‍රගති වාර්තා සකස් කිරීම

| වාර්තාව | සංඛ්‍යාව |
|---|---|
| මූලධන වියදම් සඳහා කාර්තුමය වශයෙන් සකස් කල ප්‍රගති වාර්තා | 04 |
| සංවර්ධන ව්‍යාපෘති සඳහා මාසිකව සකස් කල ප්‍රගති වාර්තා | 12 |
| අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවල මාසික වාර්තා | 12 |

ii. ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම

| රැස්වීම | සංඛ්‍යාව |
|---|---|
| අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් ආයතනවල ප්‍රගතිය සම්බන්ධයෙන් පැවැත්වූ රැස්වීම් | 04 |
| අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් පැවැත්වූ රැස්වීම් | 02 |
| ලේකම්තුමිගේ ප්‍රධානත්වයෙන් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් පැවැත්වූ රැස්වීම් | 07 |
| අතිරේක ලේකම් (සංවර්ධන) ගේ ප්‍රධානත්වයෙන් ප්‍රගතිය සම්බන්ධයෙන් පැවැත්වූ රැස්වීම් | 10 |
| එකතුව | 23 |

iii. ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

| ආයතනය | ප්‍රගතිය |
|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය | - අමාත්‍යාංශය සහ ඊට අයත් ආයතන මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය කාර්තුමය වශයෙන් ඉදිරිපත් කර ඇත.<br>- 2015 ජනවාරි මස සිට 2018 ජූනි 30 දක්වා අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අමාත්‍යාංශයට අදාළව අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය ඇතුළත් වාර්තාව 2018.08.09 වන දින ඉදිරිපත් කොට ඇත. |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | 2015 - 2018 දක්වා ක්‍රියාත්මක කරන ලද අවසන්වූ සහ අවිච්ඡින්න ව්‍යාපෘතිවල ප්‍රගතිය 2018.08.02 වන දින යොමු කරන ලදී. |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - ජාතික අයවැය චක්‍රලේඛ අනුව සංවර්ධන ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය මසකට වරක් සහ භෞතික ප්‍රගතිය කාර්තුමය වශයෙන් වාර්තා කර ඇත<br>- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මාසිකව ඉදිරිපත් කර ඇත |
| ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | - පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 500ට වැඩි සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය මාසිකව ඉදිරිපත් කර ඇත.<br>- සියළුම සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අදාළ ආකෘතියට අනුව කාර්තුමය වශයෙන් ඉදිරිපත් කර ඇත. |
| දේශීය හා විදේශීය සංවර්ධන ව්‍යාපෘති සහ අයවැය යෝජනා වල ප්‍රගතිය | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට, ජනාධිපති ලේකම් කාර්යාලයට හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට කාර්තුමය වශයෙන් වාර්තා කර ඇත |
| ගම්පහ, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා එම ප්‍රදේශවල ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදි. |
| ශ්‍රී ලංකා මහ බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්ෂික වාර්තාව සඳහා තොරතුරු 2018.02.15 වන දින ඉදිරිපත් කර ඇත |

ඒ. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 402හි හා මහාභාණ්ඩාගාර චක්‍රලේඛ 1/2004 හි උපදෙස් අනුව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එයට අයත් ආයතනවල වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය

| ආයතනය | වාර්තාව | ප්‍රගතිය |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | 2017 කාර්යසාධන වාර්තාව | 2018.05.30 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.06.07 වන දින සභාගත කරන ලදී. |
| මහා භාරකාර දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.06.11 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.06.22 වන දින සභාගත කරන ලදි |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.05.28 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.06.07වන දින සභාගත කරන ලදි |
| නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.09.28 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018 10.12 දින සභාගත කරන ලදී. |

| ආයතනය | වාර්තාව | ප්‍රගතිය |
|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.05.23 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.06.07වන දින සභාගත කරන ලදී. |
| ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.06.26 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.07.04 වන දින සභාගත කරන ලදී. |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 2017 කාර්යසාධන වාර්තාව | 2018.06.28 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.07.17 වන දින සභාගත කරන ලදී. |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 2016 හා 2017 කාර්යසාධන වාර්තා | 2018.09.30 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2018.10.11 දින සභාගත කරන ලදී. |
| ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය | 2015 වාර්ෂික වාර්තාව | 2018.02.19 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර 2018.04.05 වන දින සභාගත කරන ලදී. |
| උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | 2015 වාර්ෂික වාර්තාව | 2018.02.28 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර 2018.04.05 වන දින සභාගත කරන ලදී. |

ඒ) මෙම අංශයට අනුයුක්ත සංඛ්‍යා ලේඛණ නිලධාරී විසින් අධිකරණ වෙතින් තොරතුරු රැස්කර අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව වාර්තා සකස් කරන අතර 2018.01.01 සිට 2018.09.30 දක්වා එහි සාරාංශය පහත පරිදි වේ.

| අධිකරණ | 2017 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව | 2018.01.01 සිට 2018.09.30 දක්වා ගොනු කළ නඩු සංඛ්‍යාව | 2018.01.01 - 2018.09.30 දක්වා අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2018.09.30 දිනට විභාගවීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---:|---:|---:|---:|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 4,033 | 1,376 | 1,243 | 4,166 |
| අභියාචනාධිකරණය | 4,923 | 1,126 | 1,678 | 4,371 |
| වාණිජ මහාධිකරණය | 6,093 | 1,214 | 1,151 | 6,156 |
| පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ | 5,914 | 2,307 | 2,114 | 6,107 |
| මහාධිකරණ (අපරාධ) | 17,395 | 8,786 | 8,927 | 17,254 |
| දිසා අධිකරණ | 196,745 | 57,991 | 43,515 | 211,221 |
| මහේස්ත්‍රාත් අධිකරණ | 460,933 | 655,297 | 616,200 | 500,030 |
| ළමා මහේස්ත්‍රාත් අධිකරණ | 1,280 | 183 | 224 | 1,239 |
| **එකතුව** | **697,316** | **728,280** | **675,052** | **750,544** |

ඔ) **විශේෂ කටයුතු**

නීති ක්ෂේත්‍රයේ ශක්තිමත් කළ යුතු අංශ සම්බන්ධයෙන් විදේශ ආධාර ලබා දෙන ආයතන වෙත හඳුන්වා දිම පිළිබඳ සමුළුවක් ගරු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් තනාපතිවරුන්ගේ හා විදේශ ආධාර ලබාදෙන ආයතන සහ රජයේ අදාළ ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2018.08.31වන දින යුනිසෙෆ් ආයතනයේ සහයෝගීතාවයෙන් කොළඹ ගලදාරි හෝටලයේදි පවත්වන ලදී.

## 5.3.2 සංවර්ධන ඒකකය

සංවර්ධන අංශය මඟින් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඇති අධිකරණ දෙපාර්තමේන්තු හා ආයතන වලට අදාළව ඉඩම් හඳුනා ගැනීම නිරවුල් කිරීම, පවරා ගැනීම හා අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරනු ලැබේ. එමෙන්ම මෙතෙක් ගොඩනැගිලි ඉදිකර නොමැති අධිකරණ, ආයතන හා නිල නිවාස පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමද සිදු කරනු ලැබේ. තවද අධිකරණ සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් ගිණුම් ගත කිරීම සඳහා තක්සේරු වාර්තා කැඳවීම සිදු කරනු ලැබේ.

### 5.3.2.1. <u>අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉඩම් පවරා ගැනීම හා අධිකරණ සතු ඉඩම් නිරවුල් කිරීම.</u>

අධිකරණ පද්ධතිය තුළ පිහිටි අධිකරණ හා නිල නිවාස වල ඉඩම් නිරවුල් කිරීමට අදාළව සංවර්ධන අංශය මඟින් 2018.01.01 සිට 2018.12.31 දින දක්වා සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

**I** <u>**අධිකරණ,නිල නිවාස හා වෙනත් ඉදිකිරීම් සඳහා ඉඩම් හඳුනා ගැනීම හා පවරා ගැනීම හා නව අධිකරණ පිහිටුවීම**</u>

a. 2018 වර්ෂයේ අධිකරණ හා නිල නිවාස පිහිටි ඉඩම් 07 ක් සඳහා පැවරුම් සහතික ලැබී ඇත. අධිකරණ 22 ක ඉඩම් නිරවුල් කර ගැනීමට අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත යොමු කර ඇත.

b. ඉඩම් මැන මායිම් නිරූපනය කර දෙන ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ඉඩම් 07 ක තොරතුරු යවා ඇත.

c. ගරු අග්‍රවිනිශ්වයකාරතුමාගේ හා නෛතික කටයුතු (දූෂණ විරෝධි) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශ මත අතිරේක මහාධිකරණ 03 ක් හා විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයක් පහත සඳහන් දිනයන් හිදී පිහිටුවා ඇත.

- ගම්පහ අතිරේක මහාධිකරණය 2018.05.14 දින.
- රත්නපුර අතිරේක මහාධිකරණය 2018.05.22 දින.
- මහනුවර අතිරේක මහාධිකරණය 2018.09.10 දින.
- කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය 2018.08.21 දින.

**II** <u>**අමාත්‍යාංශය සතු ඉඩම් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම**</u>

a. ඉඩම් නිරවුල් කිරීම සඳහා සියළුම මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත සහ කලාපභාර තාක්ෂණ නිලධාරින් වෙත ප්‍රශ්නාවලියක් යොමු කර තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු අනුව කලාප වලට අයත් සියළු අධිකරණ හා නිල නිවාස පිහිටි ඉඩම් වල තොරතුරු සාරාංශ ගත කරමින් පවතී.

b. අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇති ඉඩම් සහ එම ඉඩම් වල පිහිටි ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට අධිකරණ 53 ක තොරතුරු යොමු කර ඇත. අධිකරණ හා නිල නිවාස 7ක තක්සේරු වාර්තා ලැබී ඇත.

**III** <u>**අධිකරණ ඉදිකිරීම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම්**</u>

- කොළඹ නව අධිකරණ පියස ඉදිකිරීම සඳහා බී.සී.සී. ලංකා ලිමිටඩ් ආයතනය සතු ඉඩම අත්පත් කර ගැනීම් කටයුතු සිදු කරමින් පවතී.
- ගම්පොළ අධිකරණ සංකිර්ණයේ ඉදිරිපස කොටස සහ පිවිසුම් මාර්ගය සකස් කිරීමට ගම්පොළ නගර සභාව සතු ඉඩම් කොටසක් අත්පත් කර ගැනීම් කටයුතු සිදු කරමින් පවතී.
- වැලිමඩ අධිකරණ සංකිර්ණය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටසක් අත්පත් කර ගැනීම් කටයුතු සිදු කරමින් පවතී.

### 5.3.2.2. 2018 වර්ෂයේ අධිකරණ ගොඩනැගිලි විවෘත කිරීම් හා මුල්ගල් තැබීම

a. වත්තල අධිකරණ සංකීර්ණය 2018.05.31 දින අතිගරු ජනාධිපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.




b. රත්නපුර නව අධිකරණ සංකීර්ණයට මුල්ගල් තැබීම. 2018.09.10. දින  - ගරු අග විනිසුරු තුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.




c. කිලිනොච්චි අධිකරණ සංකීර්ණය මුල්ගල් තැබීම. 2018.09.03 දින ගරු අගවිනිසුරුතුමන් ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.




**5.3.2.3.අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ විනිසුරුවරුන් සඳහා නිල නිවාස සඳහා ගොඩනැගිලි බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම**

a. වත්තල, මාතර, ගාල්ල, රත්මලාන, බොරැල්ල, කුරුණෑගල කම්කරු විනිශ්චය සභා පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබා ගත් ගොඩනැගිලි වෙනුවෙන් බදු ගිවිසුම් සකස් කර ඇත.

b. කුරුණෑගල පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණය, ලග්ගල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබා ගත් ගොඩනැගිලි වෙනුවෙන් බදු ගිවිසුම් සකස් කර ඇත.

c. 2018.01.01 සිට 2018.12.31දක්වා කාල සීමාව තුළ නිල නිවාස 55 ක් වෙනුවෙන් පහත පරිදි බදු ගිවිසුම් සකස් කර ඇත.

| දිස්ත්‍රික්කය | සකස් කර ඇති බදු ගිවිසුම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | මහාධිකරණ / සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරු නිල නිවස | දිසා විනිසුරු/ අතිරේක දිසා විනිසුරු නිල නිවස | මහේස්ත්‍රාත්/ අතිරේක මහේස්ත්‍රාත් නිල නිවස | එකතුව |
| කොළඹ | 1 | 4 | 5 | 10 |
| රත්නපුර | 1 | 1 | 3 | 5 |
| කුරුණෑගල | 1 | - | 2 | 3 |
| නුවර | - | 2 | 2 | 4 |
| නුවරඑළිය | 1 | 1 | 1 | 3 |
| මාතර | 2 | - | 2 | 4 |
| ගාල්ල | 2 | 1 | - | 3 |
| කළුතර | - | 3 | 3 | 6 |
| අනුරාධපුර | 1 | - | - | 1 |
| පුත්තලම | - | - | 1 | 1 |
| අම්පාර | 1 | - | 2 | 3 |
| ත්‍රිකුණාමලය | - | - | 2 | 2 |
| කෑගල්ල | - | 3 | - | 3 |
| ගම්පහ | - | - | 3 | 3 |
| අවිස්සාවේල්ල | - | - | 1 | 1 |
| හලාවත | - | 1 | 2 | 3 |
| එකතුව | **10** | **16** | **29** | **55** |

## 5.3.3 ඉංජිනේරු ඒකකය

### 5.3.3.1 හැඳින්වීම

කාර්යක්ෂමව හා ඵලදායීව යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීමකි. ඒ සඳහා නව යටිතල පහසුකම් සැපයීමත් පවතින පහසුකම් වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාමත් ඉංජිනේරු අංශයේ මූලික කාර්යභාරය වේ.

ඒ යටතේ නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හා නඩත්තු කටයුතු ආදී වැදගත් කාර්යභාරයන් රාශියක් මෙම අංශයේ සම්බන්ධීකරණය, අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබයි.

අ) අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ආකාර කීපයකින් ක්‍රියාත්මක වේ. එනම්,

- අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ සිදු කරන මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති.
- අයවැය ඇස්තමේන්තු මගින් සුළු පරිමාණ ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රතිපාදන යටතේ සිදු කරන ඉදිකිරීම් ව්‍යාපෘති.
- අයවැය යෝජනා යටතේ ලබා දෙන ප්‍රතිපාදන යටතේ සිදු කරන ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති.
- අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිසංස්කරණ වැය විෂය යටතේ ලබා දෙන ප්‍රතිපාදන මගින් සිදු කරන අළුත්වැඩියා ව්‍යාපෘති.

ආ) මෙම වසරේ ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

| | ව්‍යාපෘති සංඛ්‍යාව | **2018** වසර සඳහා ප්‍රතිපාදන (රු.මි) | **2018.12.31** දක්වා වියදම (රු.මි) | අතැති බිල්පත් (රු.මි) | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| මහා පරිමාණ ව්‍යාපෘති | | | | | |
| අයවැය ඇස්තමේන්තු යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති | 14 | 1,386.84 | 1,000.84 | 87.01 | 78% |
| අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 06 | 920.26 | 240.65 | 352.77 | 64% |
| **උප එකතුව** | 20 | 2,307.10 | 1241.49 | 439.78 | 73% |
| සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති | 17 | 310.00 | 194.29 | 3.01 | 64% |
| ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති | 532 | 230.00 | 221.80 | - | 96% |
| එකතුව | **569** | **2,847.10** | **1657.58** | **442.79** | **73%** |

## 5.3.3.2. 2018 වසරේ අවසන් කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2018 වසරේ වියදම (රු.මි.) | සටහන |
|---|---|---|---|
| වත්තල අධිකරණ සංකීර්ණය | 345.46 | 41.64 | අවසන් බිල්පත පියවීමට ඇත. |
| පොළොන්නරුව විනිසුරු නිල නිවාසය<br>බිබිල විනිසුරු නිල නිවාසය | 32.98 | 1.01 | වැය වූ මුළු මුදල රු.මි 25.99 කි. අවසන් බිල්පත පියවීමට ඇත |
| සියඹලාණ්ඩුව විනිසුරු නිල නිවාසය | 16.21 | 12.48 | වැය වූ මුළු මුදල රු.මි 15.95 කි. |
| අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ ළමා හිතකාමී ගොඩනැගිල්ල | 6.4 | 1.34 | වැය වූ මුළු මුදල රු.මි 3.14 කි. |
| මහනුවර ලේඛණාගාරයේ රාක්ක සවිකිරීම | 6.1 | 4.71 | වැය වූ මුළු මුදල රු.මි 4.71 කි. අවසන් බිල්පත පියවීමට ඇත |
| මහව මහේස්ත්‍රාත් නිල නිවස | 16.57 | 13.28 | අතිරේක වැඩ සමග වැයවූ මුළු මුදල රු.මි 17.92 කි. |

වත්තල අධිකරණ සංකීර්ණය




බිබිල විනිසුරු නිල නිවාසය



සියඹලාණ්ඩුව විනිසුරු නිල නිවාසය



**පොලොන්නරුව විනිසුරු නිල නිවාසය**




**5.3.3.3. <u>2018 වසරට පෙර ආරම්භ කර මේ වන විටද සිදු කරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති</u>**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාලය | කොන්ත්‍රාත් මුදල (රු.මි.) | 2017.12.31දක්වා සමුච්චිත වියදම (රු.මි.) | 2018 වසර සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2018 .12.31 දක්වා වියදම (රු.මි) | අතැති බිල්පත් (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|---|
| මාතර අධිකරණ සංකීර්ණය | 2016-2019 | 1,101.64 | 543.29 | 300 | 293.4 | - | 98% | 83% |
| ගාල්ල අධිකරණ සංකීර්ණය | 2013-2017 | 823.15 | 378.31 | 162.74 | - | - | - | 47% |
| ගම්පොල අධිකරණ සංකීර්ණය | 2017-2020 | 422.95 | 107.9 | 89.86 | 46.03 | 31.24 | 51% | 37% |
| මුලතිව් අධිකරණ සංකීර්ණය | 2017-2020 | 408.97 | 93.78 | 117 | 116.46 | - | 99.8 % | 42% |
| මාන්කුලම් අධිකරණ සංකීර්ණය | 2017-2020 | 396.75 | 110.62 | 160 | 96.00 | 55.76 | 65% | 54% |
| පොලොන්නරුව අධිකරණ සංකීර්ණය | 2017-2019 | 327.75 | 96.68 | 85.28 | 77.34 | - | 91% | 39% |
| අනුරාධපුර අධිකරණ සංකීර්ණය | 2017-2019 | 317.4 | 67.36 | 85.28 | 63.92 | - | 68% | 45% |
| රුවන්වැල්ල අධිකරණ සංකීර්ණය | 2017-2019 | 235.86 | 71.03 | 62.10 | 58.85 | - | 95 % | 53% |
| යාපනය අධිකරණ ගොඩනැගිල්ල | 2017-2019 | 207.46 | 49.5 | 110 | 103.15 | - | 94% | 61% |
| මැදවච්චිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය | 2017-2019 | 130.92 | 1.47 | 36 | 34.64 | - | 96% | 15% |
| කහටගස්දිගිලිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ | 2017-2019 | 97.06 | 1.09 | 29 | 28.05 | - | 97% | 17% |
| ලග්ගල අධිකරණ ගොඩනැගිල්ල | 2017-2019 | 70.95 | 1.11 | 35 | 28.05 | - | 80% | 33% |
| මාතලේ මහාධිකරණය | 2017-2019 | 37.26 | 7.91 | 25.36 | 9.98 | - | 42% | 70% |
| කල්මුණේ සිවිල් අභියාචනාධිකරණය | 2017-2019 | 82.45 | 0.84 | 57 | 56.81 | - | 99.7 % | 67% |
| වලස්මුල්ල නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2018-2019 | 68.9 | 14.62 | 14.5 | 14.37 | - | 99% | 31% |
| විදුලි සෝපාන සවි කිරීම | 2017-2018 | 32.57 | 7.4 | 14 | 13.59 | - | 97% | - |
| හැටන් මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය, නඩු භාණ්ඩ කාමරය හා කාර්යාලය ඉදිකිරීම | 2017-2018 | 28.03 | 7.9 | 20.13 | 17.58 | - | 87% | 95% |
| පුත්තලම මහාධිකරණ විනිසුරු නිල නිවාසය | 2017-2018 | 18.35 | 5.5 | - | 10.75 | - | - | 95% |

ගාල්ල අධිකරණ සංකීර්ණය



මාතර අධිකරණ සංකීර්ණය



ගම්පොල අධිකරණ සංකීර්ණය



රුවන්වැල්ල අධිකරණ සංකීර්ණය



යාපනය අධිකරණ ගොඩනැගිල්ල



මුලතිව් අධිකරණ සංකීර්ණය



මාන්කුලම් අධිකරණ සංකීර්ණය



පොලොන්නරුව අධිකරණ සංකීර්ණය



අනුරාධපුර අධිකරණ සංකීර්ණය



මාතලේ මහාධිකරණය



කල්මුණේ සිවිල් අභියාචනාධිකරණය



වලස්මුල්ල නව අධිකරණ ගොඩනැගිල්ල



මාවනැල්ල අධිකරණයේ ලේඛණාගාරය ඉදිකිරීම



හැටන් මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය, නඩු භාණ්ඩ කාමරය හා කාර්යාලය ඉදි කිරීම





**5.3.3.4 <u>2018 වසරේ ආරම්භ කරන ලද ව්‍යාපෘති</u>**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාලය | කොන්ත්‍රාත් මුදල (රු.මි.) | 2018 වසර සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2018 .12.31 දිනට වියදම (රු.මි) | අකැති බිල්පත් (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| රත්නපුර අධිකරණ සංකීර්ණය | 2018-2021 | 2,380.50 | 435.00 | 150.00 | 284.51 | 99.9% | 5% |
| කිලිනොච්චිය අධිකරණ සංකීර්ණය | 2018-2020 | 379.50 | 110.00 | 40.00 | 68.25 | 98% | 13% |
| රම්බඩගල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 2018-2019 | 13.91 | 1 | - | - | - | - |
| නොච්චියාගම අධිකරණ ගොඩනැගිල්ල | 2018-2019 | 25.92 | 3.50 | 3.30 | - | 94% | 20% |
| මාවනැල්ල අධිකරණයේ ලේඛණාගාරය ඉදි කිරීම | 2018-2019 | 10.00 | 10.00 | 4.98 | - | 50% | 68% |
| රම්බඩගල්ල මහේස්ත්‍රාත් නිල නිවස ඉදි කිරීම | 2018 | 14.94 | | 3.72 | - | | 35% |
| ආණමඩුව මහේස්ත්‍රාත් නිල නිවාසය | 2018-2019 | 15.12 | | 4.54 | - | | 15% |
| කුළියාපිටිය මහාධිකරන විනිසුරු නිල නිවාසය | 2018-2019 | 20.25 | 87.33 | 4.41 | - | | 60% |
| මොණරාගල මහාධිකරණ විනිසුරු නිල නිවාසය | 2018 | 16.92 | | 8.66 | - | | 68% |
| කුලියාපිටිය දිසා විනිසුරු නිල නිවාසය | 2018-2019 | 17.02 | | - | - | | 15% |

**5.3.3.5 <u>ප්‍රදානය කරන ලද ව්‍යාපෘති</u>**

- පූගොඩ අධිකරණ සංකීර්ණය
- තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය
- වැලිමඩ අධිකරණ සංකීර්ණය
- නාවුල මහේස්ත්‍රාත් නිල නිවස
- වත්තල අධිකරණ සංකීර්ණය III අදියර
- හලාවත / දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ අළුත්වැඩියාව
- කොළඹ වාණිජ මහාධිකරනයේ නවීකරණ කටයුතු

**5.3.3.6. <u>ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින ව්‍යාපෘති</u>**

- අධිකරණ නිවහන ව්‍යාපෘතිය
- කන්තලේ අධිකරණ සංකීර්ණය

**5.3.3.6 <u>ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති</u>**

**<u>2018.01.01 සිට 2018.12.31 දක්වා කාලය තුළ සිදු කර ඇති ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති</u>**

| අංකය | ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතනය | 2018 සඳහා ප්‍රතිපාදන (රු.මි.) | ව්‍යාපෘති සංඛ්‍යාව | 2018.12.31 දිනට වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | කොළඹ මහාධිකරණය | 51.71 | 97 | 51.71 |
| 02 | කළුතර මහාධිකරණය | 9.33 | 22 | 9.33 |
| 03 | ගාල්ල මහාධිකරණය | 15.07 | 56 | 15.07 |
| 04 | මාතර මහාධිකරණය | 3.37 | 14 | 3.37 |
| 05 | මඩකලපුව මහාධිකරණය | 2.6 | 09 | 2.60 |
| 06 | යාපනය මහාධිකරණය | 5.35 | 28 | 5.35 |
| 07 | මීගමුව මහාධිකරණය | 2.69 | 14 | 2.69 |
| 08 | ගම්පහ මහාධිකරණය | 3.55 | 27 | 3.55 |
| 09 | කුරුණෑගල මහාධිකරණය | 11.62 | 42 | 11.62 |
| 10 | මහනුවර මහාධිකරණය | 8.98 | 24 | 8.98 |
| 11 | අවිස්සාවේල්ල මහාධිකරණය | 13.42 | 25 | 13.42 |
| 12 | රත්නපුර මහාධිකරණය | 14.57 | 35 | 14.57 |
| 13 | බදුල්ල මහාධිකරණය | 7.13 | 12 | 7.13 |
| 14 | අනුරාධපුර මහාධිකරණය | 8.74 | 14 | 8.74 |
| 15 | කෑගල්ල මහාධිකරණය | 4.01 | 15 | 4.01 |
| 16 | හලාවත මහාධිකරණය | 4.42 | 13 | 2.87 |
| 17 | වවුනියාව මහාධිකරණය | 2.88 | 17 | 2.88 |
| 18 | අම්පාර මහාධිකරණය | 6.75 | 05 | 6.57 |
| 19 | ත්‍රිකුණාමලය මහාධිකරණය | 5.48 | 13 | 5.48 |
| 20 | නුවරඑළිය මහාධිකරණය | 6.56 | 06 | 6.56 |
| 21 | මොණරාගල මහාධිකරණය | 4.65 | 12 | 4.65 |
| 22 | පොළොන්නරුව මහාධිකරණය | 4.44 | 20 | 4.44 |
| 23 | කල්මුණේ මහාධිකරණය | 4.88 | 17 | 4.39 |
| 24 | තංගල්ල මහාධිකරණය | 7.4 | 10 | 7.4 |
| 25 | පුත්තලම මහාධිකරණය | 2.24 | 15 | 2.24 |
| 26 | අමාත්‍යාංශය | 11.43 | 07 | 11.43 |
| | **එකතුව** | **223** | **569** | **221** |

## 5.4 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය

### 5.4.1 හැඳින්වීම

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අංශය මඟින් බන්ධනාගාර පරිපාලනය පුළුල් ප්‍රතිසංස්කරණයකට ලක්කොට බන්ධනාගාර නිලධාරීන්ගේ වෘත්තීය ගැටළු විසඳමින් සිරගත වූ අය නිදහස් වන විට යහපත් පුරවැසියන් ලෙස සමාජයට අනුගත කිරීමේ අරමුණින් පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් විධිමත් ආකාරයට සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සිදුකරයි. මේ යටතේ පහත සඳහන් කාර්යයන් මෙම අංශයෙන් ක්‍රියාත්මත කරනු ලබයි.

1. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු
2. බලපත්‍ර මත සිරකරුවන් නිදහස් කිරීමේ කටයුතු හා බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කළ සිරකරුවන් පිළිබඳ කටයුතු
3. සිරකරුවන් නිවාස නිවාඩු යැවීමට අදාල කටයුතු
4. යහපත් හැසිරීම මත සිරකරුවන්ගේ දඬුවම් ලිහිල් කිරීමේ කටයුතු
5. නිදහස් වීමට නියමිත තරුණ වරදකරුවන්ගේ ගොනු
6. සමා අනුමැතියට ඉදිරිපත් කිරීම හා කොන්දේසි උල්ලංඝණය කළ තරුණ වරදකරුවන් සම්බන්ධ කටයුතු
7. බන්ධනාගාර ඉදිකිරීම්වලට අදාලව ඉඩම් අත්පත් කර ගැනීම, පවරා ගැනීම, සන්තකය ආපසු ගැනීමේ හා නිදහස් කිරීමේ කටයුතු
8. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම්වලට අදාල කටයුතු
9. බන්ධනාගාර නිලධාරීන්ගේ ඇප තීරණය කිරීම සම්බන්ධ කටයුතු
10. සිරකරු ඉල්ලීම් පිළිබඳ කටයුතු
11. බන්ධනාගාර ආයතනවල වීක්ෂණ කමිටු පිළිබඳ කටයුතු
12. සිරකරුවන්ගේ සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරීම
13. සිරකරුවන් මාරු කිරීම් සම්බන්ධ කටයුතු

### 5.4.2 <u>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම</u>

#### 5.4.2.1 <u>නගර මධ්‍යයේ පිහිටුවා ඇති බන්ධනාගාර නගරයෙන් බැහැර ස්ථානවලට ගෙනයාම</u>

නගර මධ්‍යයේ පවත්නා ඉතා ඉහළ ආර්ථික වටිනාකමක් ඇති භූමිභාගයන්හි ස්ථාපිත බන්ධනාගාර නගරයෙන් බැහැර ප්‍රදේශවලට විතැන් කිරීම රජයේ ප්‍රතිපත්තියකි. මෙය බන්ධනාගාරවල පවතින අධික තදබදයට ද පිළියමක් වේ.

ඒ අනුව බෝගම්බර බන්ධනාගාරය පල්ලේකැලේට විතැන් කිරීම මේ වනවිටත් සිදුකර තිබේ.
මීට අමතරව තංගල්ල බන්ධනාගාරය ඉතා නවීන අංගෝපාංගයන්ගෙන් හා වැඩි පහසුකම්වලින් යුක්තව ඉදිකළ අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය වෙත විතැන් කිරීම 2017.10.16 දින සිදු කරන ලදී.

මීට අමතරව කළුතර, ගාල්ල, ත්‍රිකුණාමලය, මඩකළපුව, වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය, මීගමුව හා කෑගල්ල යන බන්ධනාගාර ද වඩා ඉඩ පහසුකම් ඇති ස්ථානවලට විතැන් කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව මාතර බන්ධනාගාරයේ ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂයේ දී ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තවද වාරියපොල බන්ධනාගාරය ඉඩ පහසුකම් වැඩිකර තවදුරටත් පුළුල් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. එම ඉදිකිරීම 2020 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

මීට අමතරව ත්‍රිකුණාමලය හා මඩකළපුව නව බන්ධනාගාර ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කරගැනීම් මේ වනවිට සිදුකර අවසන් වී ඇත. මීගමුව හා කෑගල්ල බන්ධනාගාර විතැන් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී.

තවද බෝගම්බර (දුම්බර) බන්ධනාගාරයේ දෙවන අදියරේ ඉදිකිරීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. මෙම ඉදිකිරීම් 2019 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිත වේ.

### 5.4.2.2 බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය

බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය මේ වන විට වැලිකඩ බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක වේ. 2018 වසර අවසන් වන විට බන්ධනාගාර ආයතන 12 ක් රුපියල් මිලියන 35ක් වැයකර ජාලගත කිරීමට සැලසුම් කර තිබූ අතර 2018.12.31 දින වනවිට ආයතන 12න් ආයතන 11ක ජාලගත කිරීම් සම්පූර්ණයෙන්ම නිමකර ඇත. එම ආයතන ලෙස කොළඹ රිමාන්ඩ්, නව මැගසින්, මහර, පල්ලෙකැලේ, කුරුවිට, වීරවිල, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, මීගමුව හා වටරැක යන බන්ධනාගාර හැඳින්විය හැක. ඒ අනුව ජාලගත කිරීම් සඳහා රු. මිලියන 35 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 31.127 ක එනම් 88.9% ක මූල්‍ය ප්‍රගතියක් හා 91.6% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

### 5.4.2.3 බන්ධනාගාර පොලිස් බුද්ධි ඒකකය ප්‍රතිව්‍යූහගත කිරීම

දිගින් දිගටම බන්ධනාගාර තුළ සිදුවූ විවිධ අක්‍රමිකතා හා දූෂණ ක්‍රියාවන් අවම කිරීම සඳහා බන්ධනාගාර පොලිස් ඒකකයේ කටයුතු ප්‍රතිව්‍යූහගත කිරීම මෙම අමාත්‍යාංශය විසින් සිදුකරන ලදී. ඒ අනුව නවක නිලධාරීන්ගෙන් සමන්විත බන්ධනාගාර පොලිස් බුද්ධි ඒකකයක් පිහිටුවා එම නිලධාරීන්ට පොලිස් විශේෂ කාර්ය බලකාය යටතේ විශේෂ පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලදී.

### 5.4.2.4 යහපත් හැසිරීම මත සිරකරුවන් නිදහස් කිරීම

බන්ධනාගාර තුළ යහපත් හැසිරීමක් සහිතව තම පුනරුත්ථාපන කටයුතු ඉතා හොඳින් සිදුකළ සිරකරුවන් විශාල ප්‍රමාණයකට නිදහස ලබාදීම 2018 වර්ෂයේදී සිදුවිය. මේ අනුව සිරකරුවන් බලපත්‍ර මත නිදහස් කිරීම, යහපත් හැසිරීම මත සිරකරුවන්ගේ දඬුවම් කාලය ලිහිල් කිරීම මෙන්ම සිරකරුවන් නිවාස නිවාඩු යැවීම ද සිදුවිය.

| අනු අංකය | දඬුවම් ලිහිල් කළ ආකාරය | නිදහස් වූ සංඛ්‍යාව (2018.01.01 සිට 2018.12.31 දක්වා) |
|---|---|---|
| 1. | බලපත්‍ර මත නිදහස් කිරීම | 177 |
| 2. | නිවාස නිවාඩු යැවීම | 378 |
| 3. | ජනාධිපති සමාව - ජාතික නිදහස් දිනය | 495 |
| 4. | ජනාධිපති සමාව - වෙසක් පොහොය | 423 |

## 5.5 මූල්‍ය අංශය

### 5.5.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ මුඛ්‍ය පරමාර්ථය යුක්තිය පසිඳලීම සඳහා ස්ථාපිත අධිකරණ පද්ධතියේ කටයුතු බාධාවකින් තොරව කර ගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස් කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබා දීමද මූල්‍ය අංශය මගින් සිදු කරයි.

එම කටයුතු කරගෙන යාමේදී,

i. කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
ii. මූල්‍ය උපදෙස් හා මඟ පෙන්වීම.
iii. ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
iv. රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධි විධාන වලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම.
v. ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකරණ පරිපාලන, ප්‍රසම්පාදන, ගිණුම් හා ගෙවීම් වශයෙන් මූල්‍ය අංශය තුළ ගණකාධිකාරිවරුන් යටතේ උප අංශ 04 ක් ක්‍රියාත්මක වේ.

### 5.5.2 <u>2018.12.31 දිනට කාර්යසාධනය</u>

2018 වර්ෂයේදී අමාත්‍යාංශ පරිපාලන හා අධිකරණ පරිපාලන වැය ශීර්ෂයන් යටතේ පිළිවෙලින් රුපියල් මිලියන 1,066.8ක් හා රුපියල් මිලියන 9,725.03ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් වෙන් කර දී ඇත. එම ප්‍රතිපාදන උපයෝගි කරගෙන අත් කරගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

අ) <u>වැය ශීර්ෂ 110 - අධිකරණ අමාත්‍යාංශය</u>

| විස්තරය | ප්‍රතිපාදන (රු. මිලියන) | වියදම (2018.12.31) (රු. මිලියන) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| <u>පුනරාවර්තන වියදම්</u> | | | |
| • පුද්ගල පඩිනඩි | 237.6 | 222.2 | |
| • ගමන් වියදම් | 24.0 | 22.3 | |
| • සැපයුම් සේවා හා වෙනත් | 660.9 | 589.9 | |
| එකතුව | 922.5 | 834.4 | 90% |
| <u>මූලධන වියදම්</u> | | | |
| • වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 23.3 | 8.9 | |
| • වත්කම් අත්පත් කර ගැනීම | 23.2 | 3.4 | |
| • පුහුණු හා හැකියා වර්ධනය | 14.5 | 8.7 | |
| • වෙනත් | 83.3 | 40.3 | |
| එකතුව | 144.3 | 61.3 | 42% |
| **මුළු එකතුව** | **1,066.8** | **895.7** | **84%** |

ආ) <u>වැය ශීර්ෂ 228 - අධිකරණ පරිපාලන</u>

| විස්තරය | ප්‍රතිපාදන (රු. මිලියන) | වියදම (2018.12.31) (රු. මිලියන) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| <u>පුනරාවර්තන වියදම්</u> | | | |
| • පුද්ගල පඩිනඩි | 5,180.31 | 5,179.54 | |
| • ගමන් වියදම් | 58.34 | 56.66 | |
| • සැපයුම් සේවා හා වෙනත් | 1,275.74 | 1,249.56 | |
| එකතුව | 6514.39 | 6,485.76 | 99% |
| <u>මූලධන වියදම්</u> | | | |
| • වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 256.55 | 240.37 | |
| • වත්කම් අත්පත් කර ගැනීම | 124.00 | 109.63 | |
| • ගොඩනැගිලි ඉදි කිරීම | 2,692.10 | 1,458.95 | |
| • පුහුණු හා හැකියා වර්ධනය | 118.00 | 100.16 | |
| • වෙනත් | 20.00 | 15.97 | |
| එකතුව | 3210.65 | 1,925.08 | 59% |
| මුළු එකතුව | **9,725.04** | **8,410.84** | **86%** |

**<u>2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට මූල්‍ය අංශයේ උප අංශයන්ගේ කාර්යසාධනය වෙන් වෙන් වශයෙන් පහතින් සඳහන් වේ.</u>**

## 5.5.2.1 <u>අධිකරණ පරිපාලන අංශය</u>

දිවයින පුරා පිහිටි මහාධිකරණ, දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ හා කම්කරු විනිශ්වය සභාවන්හි ගිණුම් කටයුතු කලාප මහාධිකරණ ගිණුම් කාර්යාල 25 ක් මගින් මූල්‍ය කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම සිදු කරයි. අධිකරණ මගින් රැස් කරනු ලබන දඩ මුදල්, ඇප මුදල් හා විවිධ ගාස්තු වශයෙන් එකතු කරනු ලබන මුදල් මධ්‍යම රජයේ හා පළාත් සභා වෙත ලබා දීම ප්‍රධාන කාර්යයන් වන අතර 2018 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වූ ආදායම්, තැන්පතු ලැබීම් හා ගෙවීම් පහත පරිදි වේ.

**(අ) ආදායම් : -**

| විස්තරය | 2018 ඇස්තමේන්තුව (රු.මිලියන) | 2018.12.31 දිනට ආදායම් රැස් කිරීම් (රු.මිලියන) | 2017 වර්ෂයේ ආදායම් රැස් කිරීම් (රු.මිලියන) |
|---|---|---|---|
| දඩ මුදල් හා රාජසන්තක කිරීම් වලට අදාළ ආදායම රැස් කිරීම | 725.0 | 1,034.51 | 746.00 |
| අනෙකුත් ආදායම් රැස් කිරීම් | 238.63 | 265.59 | 389.00 |
| මුළු එකතුව | **963.63** | **1,300.1** | **1,135.00** |

(ආ) තැන්පතු : -

| විස්තරය | තැන්පත් ලැබීම් (රු.මිලියන) | තැන්පත් ගෙවීම් (රු.මිලියන) |
|---|---|---|
| ඇප තැන්පතු | 418 | 689 |
| තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු | 7,690 | 7,747 |
| පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණය කිරීම | 3,069 | 3,372 |
| කොන්ත්‍රාත් තැන්පතු | 25 | 103 |
| ටෙන්ඩර් තැන්පතු | 10 | 11 |
| **මුළු එකතුව** | **11,212** | **11,922** |

## 5.5.2.2 ප්‍රසම්පාදන අංශය

මෙම අංශය මගින් අධිකරණයන්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට සහ පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා අවශ්‍ය වන කාර්යාල උපකරණ අවශ්‍යතා ලබා දීමට පහත පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | වටිනාකම (රු.මි.) |
|---|---|---|---|
| 01 | වානේ අල්මාරි | 110 | 10.1 |
| 02 | පරිගණක මේස | 250 | |
| 03 | පරිගණක පුටු | 500 | |
| 04 | ලිපිකරු පුටු | 250 | |
| 05 | මුද්‍රණ යන්ත්‍ර | 160 | 2.73 |
| 06 | වෙනත් සැපයීම් | | 3.01 |
| 07 | කොළඹ ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණ සඳහා උපකරණ සැපයීම | | 7.3 |
| 08 | පරිගණක | 29 | 3.6 |
| 09 | අධිකරණ කළාප 25 සඳහා කාර්යාල උපකරණ සහ විනිසුරු නිල නිවාස සඳහා ගෘහ උපකරණ මිල දී ගැනීම | | 73.8 |
| 10 | හඬ පටිගත කිරීමේ යන්ත්‍ර | 205 | 5.2 |

### 5.5.2.3 ගිණුම් අංශය

ගිණුම් අංශය මගින් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකර ඇත.

i. වැය ශීර්ෂ 110 හා 228 හි වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර 2018.07.31 වන දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

ii. වැය ශීර්ෂ 110 හා 228 හි 2017 වාර්ෂික විසර්ජන ගිණුම හා අනෙකුත් ගිණුම් සකස් කර 2018.03.31 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

iii. වැය ශීර්ෂ 110 හා 228 හි රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදු කර වාර්ෂික ගිණුම 2018.04.30 වන දිනට පෙර ඉදිරිපත් කර ඇත.

iv. 2017 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ හා අධිකරණයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරිම හා වෙන්දේසි කටයුතු සිදු කිරීමට අනුමැතීන් ලබා දිම

v. වෙනත් දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වල මූල්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

vi. අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 07/2018 අනුව අධිකරණ විසින් රාජසන්තක කරන ලද වැලි හා දැව ආගමික සිද්ධස්ථාන වෙත ලබා දීමට කටයුතු කර ඇත.

vii. අධිකරණ මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම මගින් 2018.12.31 දින වන විට රු.මිලියන 116.5 ක ආදායමක් රැස් කර ඇත.

### 5.5.2.4 ගෙවීම් අංශය

මූල්‍ය අංශයෙහි ගෙවීම් ශාඛාව මඟින්, අමාත්‍යාංශ පරිපාලන වැය ශීර්ෂය (110 වැය ශීර්ෂය) යටතේ වන පහත ව්‍යාපෘති සඳහා අදාළ වන සියලුම පුනරාවර්තන හා මූලධන ගෙවීම් කටයුතු මූලිකව සිදු කෙරේ.

110-1 අමාත්‍ය කාර්යාලය

110-2 අමාත්‍යාංශ පරිපාලන කටයුතු

110-3 සමථ මණ්ඩල කොමිෂන් සභාව

ඊට අමතරව අමාත්‍යාංශ පරිපාලන වැය ශීර්ෂයට අයත් සියළුම නිලධාරීන්ට වැටුප් ගෙවීම, ආදායම් ආපසු ගෙවීම් හා අයකර ගැනීම්, තැන්පත් ලැබීම් / ගෙවීම්, අග්‍රිම පාලනය යන කටයුතු සිදු කරගෙන යනු ලබන අතර 2018 දෙසැම්බර් 31 වන දින වන විට පුනරාවර්තන වියදම රුපියල් මිලියන 834.4ක් හා මූලධන වියදම රුපියල් මිලියන 61.3ක් වශයෙන් රුපියල් මිලියන 895.7ක වියදම් සිදුකර ඇත.

## 5.6 අභ්‍යන්තර විගණන අංශය

### 5.6.1 හැඳින්වීම

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතන තුනත්, අමාත්‍යංශ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත්, අධිකරණ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයත් අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල ගිණුම් විගණනය කිරීම අභ්‍යන්තර විගණන අංශය විසින් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය,

- ප්‍රධාන අභ්‍යන්තර විගණක (පුරප්පාඩු)
- ප්‍රධාන කළමනාකරණ සහකාර
- මූල්‍ය සහකාර නිලධාරින් 05 ක්
- සංවර්ධන නිලධාරීන් 04 ක්
- කළමනාකරණ සහකාර නිලධාරීන් 02 ක්
- කාර්යාල කාර්ය සහයක 2 දෙනෙකුගෙන්
  සමන්විත වේ.

මෙම නිලධාරීන් පද්ධති විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබන අතර 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා

- මහාධිකරණ 17ක්,
- දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 11ක්,
- දිසා අධිකරණ 07ක්,
- මහේස්ත්‍රාත් අධිකරණ 11ක්,
- දෙපාර්තුමේන්තු 02ක්,
- අධිකරණ අමාත්‍යාංශයේ 04ක්,
- ආයතන 02ක්,
- විශේෂ 03ක්,

ආදී වශයෙන් සම්පූර්ණ විගණන පරීක්ෂණ 57ක් සිදු කර ඇත.

# 06. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

## 6.1 නීතිපති දෙපාර්තමේන්තුව

**දැක්ම**

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරිම සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්විමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරිම.

**මෙහෙවර**

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරිම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරිම.
- සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්විමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතීන් ක්‍රියාත්මක කිරිමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දැරීම.

**අරමුණ**

ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලු නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂි මෙහෙවරක් ඉටු කිරිම.

### 6.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් නීතිපතිතුමා කටයුතු කරයි. "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයට, පළාත් සභාවලට රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනෙකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනෙකුත් අධිකරණ වල හා කම්කරු විනිශ්වය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩු වලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශ වලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන ඊ්ආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මකව පවතී.

## 6.1.2 නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතනවලට උපදෙස් දීම.
- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩුවලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.
- නව නීති සම්මත කිරීමේදි හා පවතින නීති සංශෝධනය කිරීමේදි අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මකවේ.

එම ඒකක වන්නේ;

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියාකිරීම පිණිස පිහිටුවා ඇත)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

## 6.1.3 <u>එක් එක් අංශයන්හි 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය</u>

| ශාඛාව | නඩු වර්ගය | 2017 වර්ෂයෙන් ගෙනා නඩු ගොනු සංඛ්‍යාව | 2018.01.01-2018.12.31 දක්වා පවරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2018.01.01 - 2018.12.31 අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 2018.12.31 දිනට ඉතිරි නඩු ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සිවිල් අංශය | උපදෙස් ගොනු | - | 970 | 587 | 383 |
| | පෙනී සිටීම් | - | 1,920 | 25 | 69 |
| *රාජ්‍ය නීතිඥ අංශය | සිවිල් අංශයෙන් ලද ගොනු +L | 8,173 | 2,404 | 3,840 | 6,737 |
| | SB | 348 | 115 | 294 | 169 |
| | LA | 13 | 04 | 03 | 14 |
| | එකතුව | 8,534 | 2,523 | 4,137 | 6,920 |
| අපරාධ නඩු අංශය | 1. මිනීමැරීමට තැත් කිරීම හා මිනී මැරීම | | 812 | 935 | |
| | 2. අන්තරාදායක ඖෂධ පනත (හෙරොයින්) | | 828 | 1,064 | |
| | 3. ළමා අපයෝජන (දැ.නි.ස 364) | | - | - | |
| | 4. ස්ත්‍රී දූෂණ (දැ.නි.ස 365) | | 288 | 343 | 13,581 (ගොනු 207 ක් ආපසු යවා ඇත) |
| | 5. ගණිකා වෘත්තීය (දැ.නි.ස 360) | 14,080 | 18 | 31 | |
| | 6. පීඩාකාරී ආයුධ පනත | | 70 | 164 | |
| | 7. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත | | 24 | 06 | |
| | 8. රථ වාහන අනතුරු (දැ.නි.ස 298 | | 32 | 26 | |
| | 9. පොදු දේපළ පනත | | 16 | 17 | |
| | 10. මුදල් වංචා (දැ.නි.ස383) | | 334 | 231 | |
| | 11. වෙනත් අපරාධ | | 1003 | 900 | |
| | එකතුව | 14,080 | 3,425 | 3,717 | 13,581 |
| ශ්‍රේෂ්ඨාධිකරණ අංශය | | 847 | 496 | 498 | 845 |
| සංස්ථා අංශය | | 6,122 | 2,088 | 2,365 | 5,845 |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | | 17,582 | 2,057 | 2,717 | 16,084 Philot Project ගොනු 838ක් ඉවත් කර ඇත. |
| මහජන පෙත්සම් අංශය | | 619 | 672 | 823 | 468 |
| **එකතුව** | | **47,784** | **14,151** | **14,869** | **44,195** |

*** සිවිල් අංශය මගින් විවෘත කරනු ලබන ගොනුවලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න.**

## 6.1.4 නීතිපති දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යසාධනය

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2017.12.31 දක්වා සමුච්චිත වියදම (රු.මි.) | 2018 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි.) | 2018.12.31 ට මූල්‍ය ප්‍රගතිය | | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | | අගය (රු.මි.) | % | |
| නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 1,182.00 | 402.75 | 373.00 | 295.05 | 79% | 59% |
| මන්නාරම නිල නිවාසය ඉදිකිරීම | 53.00 | 36.49 | 26.00 | 21.74 | 84% | 95% |
| වවුනියාව නිල නිවාසය ඉදිකිරීම | | | | | | |
| **එකතුව** | 1,235.00 | 439.24 | 399.00 | 316.79 | | |

### 6.1.5 <u>2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය</u>

| **විස්තරය** | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 1,139.30 | 872.40 | 77% |
| ප්‍රාග්ධන වියදම | 484.50 | 402.23 | 83% |
| එකතුව | 1,623.80 | 1,274.63 | **78%** |

## 6.2 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**දැක්ම**

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීතිය බවට පරිවර්තනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

### 6.2.1 හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අනු නීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගී වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරී කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනු නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තු වලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන තවත් රාජකාරියකි.

### 6.2.2 පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය

(1) නව නීති පැනවීම සඳහාද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනු නීති කෙටුම්පත් කිරීම.

(3) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි කටයුතු ඉටු කිරීම.

(4) අවශ්‍ය අවස්ථා වල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, පළාත් සභා ප්‍රඥප්ති සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීමයි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

## 6.2.3 2018.01.01 සිට 2018.12.31දක්වා කාර්යසාධනය

### 6.2.3.1 වැඩ නිම කර ඇති ගොනුවල විස්තර

| 01 | 02 | 03 | 04 | 05 | 06 |
|---|---|---|---|---|---|
| රාජකාරියේ ස්වභාවය | 2018.01.01දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නිතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරික්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | 2018.01.01 දිනට කෙටුම්පත් කිරිම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | මෙම වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව | පසුගිය වර්ෂවල හා මෙම වර්ෂයේදී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදු කිරිම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව | එකතුව |
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 156 | 10 | 70 | 12 | 248 |
| පෞද්ගලික මන්ත්‍රී (සංස්ථා ගත කිරීමේ) පනත් කෙටුම්පත | 130 | | 7 | | 137 |
| උපකාරක නීති ප්‍රතිශෝධනය | 126 | 31 | 185 | 19 | 361 |
| පළාත් සභා ප්‍රඥප්ති | 8 | 1 | - | - | 9 |

| | 07 | 08 | 09 | 10 |
|---|---|---|---|---|
| රාජකාරියේ ස්වභාවය | 2018.12.31 දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිප වරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශවයන් වෙත භාර දුන් අවසන් කෙටුම්පත් වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුලත් වේ) | දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු | 2018.12.31 කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දි නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව | 2018.12.31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
| පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 60 | 10 | 167 | 11 |
| පෞද්ගලික මන්ත්‍රී (සංස්ථා ගත කිරීමේ) පනත් කෙටුම්පත් | 1 | - | 136 | |
| උපකාරක නීති ප්‍රතිශෝධනය | 167 | - | 163 | 31 |
| පළාත් සභා ප්‍රඥප්ති | 1 | - | 7 | 1 |

### 6.2.3.2 වැඩ නිම කර ඇති ගොනුවල විස්තර සාරාංශය - (2018.01.01- 2018.12.31)

| ගොනුව | 2018-01-01 දින සිට 2018.12.31 දක්වා ලද ඉල්ලීම් | භාෂාත්‍රයෙන් යවා ඇති පනත් |
|---|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරීම | 70 | 60 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 7 | 1 |
| උපකාරක නීති (නියෝග, නීති, නියමයන්) | 185 | 167 |
| පළාත් සභා ප්‍රඥප්ති | - | 1 (කලින් ලද ප්‍රඥප්තියකි) |
| එකතුව | 262 | 229 |

### 6.2.3.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 122.49 | 114.54 | 94% |
| ප්‍රාග්ධන වියදම | 38.20 | 31.27 | 82% |
| එකතුව | 160.69 | 145.82 | 91% |

## 6.3 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

<u>දැක්ම</u>

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

<u>මෙහෙවර</u>

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

### 6.3.1 <u>අරමුණු සහ කාර්යයන්</u>

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

1. නීතිය සංග්‍රහ ගත කිරීම.
2. නීතියේ විෂමතා නැති කිරීම.
3. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.
4. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.
5. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.
6. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.
7. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.
8. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.
9. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
10. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.
11. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

### 6.3.2 2018.01.01 සිට 2018.12.31 දක්වා නීති නිර්දේශිතයන්ගේ කාර්යසාධනය

| | |
|---|---|
| **1. අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය** | |
| **පසුබිම** | අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය සංග්‍රහ ගත කිරීම සහ එහි විෂය පථය පැහැදිළි කිරීම |
| **වත්මන් තත්ත්වය** | ආචාර්ය ජේ.එම්.ස්වාමිනාදන් මහතා විසින් සකස් කරන ලද අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ කෙටුම්පත සභාගත කර සාකච්ඡා කරන ලදී. |
| **2. නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය** | |
| **පසුබිම** | අධිකරණයේ නඩු විභාගය සඳහා මූලික සාක්ෂි වශයෙන් නඩු භාණ්ඩ ඉදිරිපත් කළ යුතු බැවින් නඩු භාණ්ඩයන් අධිකරණ භාණ්ඩ භාරකරුගේ භාරයේ තබනු ලබයි. නඩු විභාගය අවසානයේදී නිකුත් කරනු ලබන උසාවි නියෝගයක් මත පමණක් ඒවා බැහැර කළ හැකි වේ. |
| **වත්මන් තත්ත්වය** | ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද නඩු භාණ්ඩ බැහැර කිරීම - වර්ග කිරීම සම්බන්ධයෙන් වූ සංශෝධිත කෙටුම්පත සභාගත කර සාකච්ඡා අවසාන කරන ලදී. |
| **3. දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා සම්බන්ධයෙන් දැනට පවතින නීතිය සඳහා සංශෝධනය.** | |
| **පසුබිම** | නිවැරදි කර ගත නොහැකි විවාහ බිඳවැටීම් සම්බන්ධයෙන් වන විට, දික්කසාදය, දික්කසාද දීමනා සහ රැකවරණය පිළිබඳව දැනට පවතින නීති ආඥා පනත්, එම කරුණු පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස ක්‍රමානුකූලව සකසා එකී නීති ආඥා පනත් සියල්ලම එකට එකතු කර එක් ආඥා පනතක් ලෙස සංග්‍රහගත කිරීම.<br>• පොදු එකඟතාවක් ඇති අවස්ථාවක්.<br>• එක් පාර්ශවයකට දික්කසාදය අවශ්‍ය නොවන, සුහද කැමැත්තක් නොමැති අවස්ථාවක්.<br>රැකවරණය, දරුවාගේ උපරිම යහපතට,<br>දික්කසාද දීමනා,සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය,<br>නඩත්තු, අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට නොව දිස්ත්‍රික් අධිකරණයකට පැවරිය යුතු අතර ඊට ඌණ පූරකව එකතු කළ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කිරීම සහ දඬුවම් පිණිස වන බලය දිස්ත්‍රික් අධිකරණය වෙත පැවරිය යුතුය. |
| **වත්මන් තත්ත්වය** | කොමිෂන් සභාව විසින් දික්කසාදය සඳහා වන හේතු සම්බන්ධයෙන් සංශෝධන කීපයක් යෝජනා කරන ලදී. අවසාන කරන ලද කෙටුම්පත, සභාපතිගේ උපදෙස් මත අධිකරණ අමාත්‍යාංශය වෙත 2018.09.13 දින යොමු කර ඇත. |
| **4. බාල වයස්කරුවන් මිය යාම මත අලාභහානි අයකර ගැනීම** | |
| **පසුබිම** | නොසැලකිල්ල හෝ හදිසි අනතුරක් හේතුවෙන් බාලවයස්කාර දරුවෙකුගේ මරණය සිදු වූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් එකී දරුවාගේ මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා නඩුකරයක් පැවරීමෙන් අලාභ හානි අයකර ගැනීමට නොහැකි වීම රෝම ලන්දේසි නීතියේ ස්ථාවරය බවට පත්වී ඇත.<br>යථෝක්ත ස්ථාවරය වර්තමානයේ දී යුක්තියේ මූලධර්මයන්ට ප්‍රත්‍යක්ෂවම අනුකූල නොවේ. යම් තෙවන පාර්ශ්වයක නොසැලකිල්ල හෝ අපරික්ෂාකාරීත්වය නිසා බාලවයස්කාර දරුවකුගේ මරණය සිදුවූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකියාවක් තිබිය යුතුය. යම් තෙවන පාර්ශවයක නොසැලකිල්ල හෝ අපරික්ෂාකාරිත්වය බාල වයස්කාර දරුවෙකුගේ මරණයට හේතුවන විටක එකී දරුවාගේ අනාගත ඉපයුම් අහිමි වීම වෙනුවෙන් ද අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකි විය යුතු බව සහතික කිරීම පිණිස පනතක් හඳුන්වා දීම සඳහා වන්නා වූ සංශෝධනය. |
| **වත්මන් තත්ත්වය** | 2018.06.29 වන දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් යැපෙන්නෙකු මිය යාම මත අලාභ-හානි අයකර ගැනීම පිළිබඳ වන අවසාන කරන ලද පනත් කෙටුම්පත ත්‍රෛ භාෂා මාධ්‍යයන්ගෙන් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

| 5. කේවියට් | |
|---|---|
| පසුබිම | • කේවියටය ගොනු කළ යුත්තේ නීතිඥවරයකුගේ සහතිකයක් සමග වන අතර එම නීතිඥවරයා විසින් එය නිර්ව්‍යාජ බවට සෑහීමකට පත් විය යුතුය.<br>• නීතිඥවරයා විසින් නොසැලකිලිමත් බවින් එවැනි සහතිකයක් ඉදිරිපත් කරන ලද්දේ නම්, ඔහු විසින් පෞද්ගලිකව ඊට අලාභ-හානි ගෙවිය යුතු වන්නේය.<br>• රාජකාරියේ නොසැලකිලිමත් බව පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කළ හැකිය. |
| වත්මන් තත්ත්වය | 1923 අංක 23 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ කේවියට් සම්බන්ධයෙන් වන 32 වගන්තිය යටතේ ජී.ජී. අරුල්ප්‍රගාසම් මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාවේ කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. |
| **6 අල්ලස් පනතට, ලිංගික අල්ලස් දීමේ / ගැනීමේ වැරදි ඇතුළත් කිරීම** | |
| පසුබිම | බලතල සහිත හෝ අධිකාරී තත්ත්වයේ සිටින ඕනෑම තැනැත්තකු විසින් මෙම අධිකාරීත්වය ක්‍රියාවට නැංවීමේදී: රැකියාවක් ලබාදීමට, උසස්වීමක් ලබාදීමට, හිමිකමක් ලබාදීමට, වරප්‍රසාදයක් ලබාදීමට හෝ වෙනත් යම් සේවාවක් ලබාදීමට කවරාකාරයක හෝ කැමැත්තක් හෝ වෙනත් යම් ඕනෑම ආකාරයක වාසියක් ලබාදීම සඳහා කොන්දේසියක් වශයෙන් ලිංගික කැමැත්ත ඉල්ලීම හෝ භාරගැනීම කරනු ලබයි නම්; මෙම පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතරම රු. (මුදල ඇතුළත් කරන්න.) ට නොවැඩි දඩයකට හෝ අවුරුදු 3 කට නොවැඩි කාලයක් දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටමටම යටත් විය යුතුය.<br>...... යන අංක දරන ඉහත වගන්තියේ කාර්යය සඳහා "ලිංගික කැමැත්ත" යන්නෙන් -<br>(අ.) ලිංගික සංවාස, හෝ<br>(ආ.) ලිංගික සංවාසයක් ලෙස සලකනු නොලබන, නමුත් ලිංගික ස්වභාවයේ කායික, වාචික හෝ වාචික නොවන්නාවූ හෝ සංස්ථාපනය කරනු ලබන්නාවූ වෙනත් ඕනෑම ක්‍රියාවක්, අදහස් වන්නේය. |
| වත්මන් තත්ත්වය | ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාව සභාගත කර සාකච්ඡා කරන ලදී. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය විසින් යෝජිත සංශෝධනය, ලිංගික හිරිහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය සමග අතිච්ඡාදනය වන්නේද යන්න පිළිබඳ අදහස් දක්වන ලදී. ඉහත මාතෘකාව අධ්‍යනය කිරීම සඳහා අනුකමිටුවක් පත් කරන ලදී. |
| **7. සමථ මණ්ඩල පනත සඳහා සංශෝධනය** | |
| පසුබිම | මෙම වර්ගීකරණයන් නිශ්චිතව දැක්වීමේදී එම නඩුකර සමථ කිරීම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රිකාවේ පළකොට නියෝග කරනු ලබනු ඇත. |
| වත්මන් තත්ත්වය | කොමිෂන් සභාව විසින් එම කරුණ සම්බන්ධයෙන් අධ්‍යනය කර අදහස් දැක්වීම සඳහා තිසත් විජේගුණවර්ධන මහතා, සභාපති සහ නවින් මාරපන මහතා යන අයගෙන් සැදුම්ලත් අනුකමිටුවක් පත්කර ගන්නා ලදී. |
| **8. මහා භාරකාර ආඥාපනත සඳහා වන සංශෝධන** | |
| පසුබිම | කිසිඳු අයුරකින්වත් සීමා නොකළ මහා භාරකාරත්වයේ බලතල වලට නියම කළ පිරික්සීම් වලට හා තුලනය කිරීමට එම නීති වැදගත් ලෙස සලකන බැවින්, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුකූල කරගත හැකි හා අන්තර්ගත කළ හැකි ව්‍යවස්ථාපිත විධිවිධාන යෝජනා කිරීම සඳහාය. |
| වත්මන් තත්ත්වය | ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාව සභාගත කර සාකච්ඡා කරන ලදී.<br>සිංගප්පූරු දේශීය නීතිය සැසඳීමෙන්, ඔහු විසින් එහි ධනාත්මක ලක්ෂණ විග්‍රහ කරන ලදී.<br>ශ්‍රී ලංකාවේ මහා භාරකාරත්වයේ යුතුකම් හා අරමුණු පිළිබඳව වැඩිදුර අධ්‍යනය කිරීමට කොමිෂන් සභාව එකඟ වූ අතර දේශීය නීතියට ඉහත දැක්වූ ලක්ෂණ අන්තර්ගත කිරීමටත් යෝජනා කරන ලදී. |

| **09.** වාණිජ මහාධිකරණයේ අධිකරණ බලය | |
|---|---|
| **පසුබිම** | වාණිජ නඩුකර සඳහා දැනට පවතින රුපියල් මිලියන 5ක මූල්‍යමය අගය රුපියල් මිලියන 25ක් දක්වා සංශෝධනය කර ගැනීමට යෝජනා කරන ලදී. |
| **වත්මන් තත්ත්වය** | 2018.09.27 දින නීති කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඉහත යෝජනාව පිළිබඳ නිල මට්ටමින් අධිකරණ අමාත්‍යාංශය දැනුවත් කරන ලදී. |
| **10.** අත්අඩංගුවට ගැනීමේ සහ රිමාන්ඩ් කිරීමේ නීතිය සඳහා සංශෝධනය | |
| **පසුබිම** | පොලිස් නිලධාරීන් සතු අත්අඩංගුවට ගැනීමේ ව්‍යවස්ථාපිත බලය සම්බන්ධයෙන් වන චර්යාවන් සංග්‍රහය ප්‍රතිශෝධනය කිරීම. |
| **වත්මන් තත්ත්වය** | සාකච්ඡා වෙමින් පවතියි. |

### 6.3.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 19.34 | 13.17 | 68% |
| ප්‍රාග්ධන වියදම | 2.12 | 1.79 | 84% |
| **එකතුව** | **21.47** | **14.96** | **70%** |

## 6.4 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**දැක්ම**

සාධාරණ සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම.

**මෙහෙවර**

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා කෂේත්‍රයන් සම්බන්ධ විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.

### 6.4.1 කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය වේ. එම අධිකරණ විද්‍යා අංශය, ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය සහ ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය අංශය, මස්තු විද්‍යා හා DNA, අධිකරණ ධූලක විද්‍යා සහ සැක කටයුතු ලේඛන හා ඩිජිටල් අපරාධ විමර්ෂණ අංශය, විවිධ නඩු අංශය, යනුවෙන් ප්‍රධාන අංශ හතකින්ද සමන් විත වේ. ආහාර විද්‍යා අංශය, ආහාර හා මධ්‍යසාර, කිරි සහ ජලය යනුවෙන් වූ විද්‍යාගාර හතරකින් සමන් විත වේ.

මෙය සේවාවන් සඳහා වෙන්වූ දෙපාර්තමේන්තුවක් වන අතර අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව,පළාත් පාලන ආයතන,සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය හා වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමුකරනු ලබන නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කිරීම සහ ඒවා පිළිබඳ වාර්තා නිකුත් කිරීම කරනු ලැබේ. මීට අමතරව විවිධ රාජ්‍ය, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්ත්වය පරීක්ෂා කරනු ලබන අතර ශ්‍රී ලංකා රේගුව මගින් යොමු කරන ආදර්ශ තත්ත්වය උදෙසා පරීක්ෂා කරනු ලබයි. තවද අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර හා වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මගින් කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, මෝටර් වාහන පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

තවද දිවයිනේ සිදුවන වෙඩි තැබීම්, පිපිරීම්, ගිණි ගැනීම්, මාරක රිය අනතුරු ආදී දරුණු ගණයේ සිදුවීම් සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිළධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු කරයි.අධිකරණයේ විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස රසපරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් රස පරීක්ෂක නිලධාරීන් අධිකරණ වල වාචික සාක්ෂි ලබා දීමද සිදු කරනු ලබයි.

තවද මෙවැනි සේවා සැපයීමට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ සිටින විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විද්‍යාඥයින් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීම ද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතිඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් සඳහා අදාළ ක්ෂේත්‍රයන් හා සම්බන්ධ දේශන පැවැත්වීමත් සිදු කරයි.

### 6.4.2 2018.01.01 සිට 2018.12.31 දක්වා විශ්ලේෂණ වාර්තාවල කාර්යසාධනය

| අංශය | 2018.01.01 ඉතිරි නඩු සංඛ්‍යාව | 2018.01.01 2018.12.31 දක්වා ලැබී ඇති නඩු සංඛ්‍යාව | 2018.01.01 - 2018.12.31 දක්වා වාර්තා කල නඩු සංඛ්‍යාව | 2018.12.31 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශය | 1,484 | 14,643 | 11,242 | 4,885 |
| ගිණි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය | 280 | 412 | 434 | 258 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම් | 153 | 464 | 497 | 120 |
| අධිකරණ ධූලක විද්‍යා අංශය (විෂ වර්ග) | 1,306 | 2,714 | 2,371 | 1,649 |
| අධිකරණ මස්තු විද්‍යා අංශය (ලේ සහ වෙනත් ශාරීරික ද්‍රව්‍ය) | 1,999 | 1,751 | 1,052 | 2,698 |
| සැක කටයුතු ලේඛණ අංශය H | 467 | 880 | 853 | 494 |
| ඩිජිටල් අපරාධ | 211 | 708 | 327 | 592 |
| විවිධ අධිකරණ ද්‍රව්‍ය | 204 | 462 | 362 | 304 |
| මත්පැන් | 20 | 5,483 | 5,417 | 86 |
| මධ්‍යසාර හා දුම්කොළ | 29 | 3,118 | 3,047 | 100 |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 13 | 9,016 | 8,759 | 270 |
| විවිධ ආහාර වර්ග | 02 | 2,515 | 2,286 | 231 |
| එකතුව | 6,168 | 42,166 | 36,647 | 11,687 |

### 6.4.3 වෙනත් කටයුතු

| කාර්යය | සංඛ්‍යාව |
|---|---|
| අධිකරණ වලදී සාක්ෂි සැපයූ අවස්ථා | 416 |
| අපරාධ ස්ථාන වලට සහභාගී වූ අවස්ථා | 194 |
| ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ විශේෂ VIP ආහාර පරීක්ෂණ | 33 (නිලධාරී දින) |
| දේශන පැවැත්වීම | 47 දින |
| තාක්ෂණික ඇගයීම් කමිටු සහභාගීත්වය | 6 දින |
| විදේශීය පුහුණු | 108 (නිලධාරී දින) |
| දේශීය පුහුණු | 211 (නිලධාරී දින) |
| පශ්චාත් උපාධිය සඳහා විදේශ ගත නිලධාරීන් ගණන | 04 |
| ආචාර්ය උපාධිය සඳහා විදේශ ගත නිලධාරීන් ගණන | 01 |

### 6.4.4 2018.01.01 සිට 2018.12.31දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මි) | 2018.12.31 දිනට වියදම (රු. මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 336.96 | 319.67 | 94% |
| ප්‍රාග්ධන වියදම් | 98.74 | 49.40 | 50% |
| **එකතුව** | **435.70** | **369.07** | 85% |

## 6.5 මහා භාරකාර දෙපාර්තමේන්තුව

**දැක්ම**

පරිත්‍යාගශීලි ස්ථාපකවරුන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය තහවුරු කිරීම හා අර්ථලාභීන්ගේ අරමුණු ඉටු කිරීම.

**මෙහෙවර**

දෙපාර්තමේන්තුව සතු සම්පත් හා හැකියාවන් අනුව ඉහළම සේවයක් සැලසෙන අයුරින් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද හා යොමු කෙරෙන භාර මියගිය පුද්ගලයින්ගේ මුදල් අර්ථ ලාභීන් ඇතුළුව අදාළ සියලුම පාර්ශවන්ට තෘප්තිමත්භාවය සැලසෙන අයුරින් පරිපාලනය කිරීම

### 6.5.1 හැඳින්වීම

#### 6.5.1.1 නෛතික පසුබිම

1931 අංක 11 සහ1938 අංක 59 දරණ ආඥා පනත මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාර ධූරය ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාළ ආඥා පනත අනුව ආයතනය හා ඒ අනුශාංගික කරුණු පාලනය වේ.

භාර සම්බන්ධයෙන් මහාභාරකාර ආඥා පනතට අමතරව 1918 අංක 4, 1934 අංක 1 දරණ ආඥා පනත් මගින්ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මගින්ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බල පැවැත්වෙන අතර, එකී පනත නිහඬ වන්නා වූ යම් අවස්ථාවක දී ඉංග්‍රීසි නීතියේ ඇති සාධාරණත්ව මූලධර්මය (Law of Equity) අදාළ වේ.

### 6.5.1.2 <u>මහා භාරකාරතැනගේ බලතල හා කාර්යභාරය</u>

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
3. දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස් කරන්නෙකු ලෙස කටයුතුකිරීම.
4. බාලවයස්කරුවෙකුගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
5. සිහිවිකල් පුද්ගලයකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මඟින් පවරන ලද අවස්ථාවක).
6. නිශ්චල දේපළ ගිවිසුම් ගත කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).
7. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
8. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
9. ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසි කරුවෙකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගත වූවකුගේ දේපළ කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකුගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නෙකු ලෙස කටයුතු කිරීම.
12. විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

### 6.5.1.3 <u>වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැනගේ මැදිහත්වීම</u>

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව මහා භාරකාර තැන වෙත පහත කාර්යයන් ද පැවරී ඇත.

- 1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම සහ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන ශ්‍රී ලාංකික පුරවැසියන් සේවා නියුක්තියෙහි යෙදී සිටියදී මරණයට පත් වූ අවස්ථාවක යම් වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාර වරයා වෙත ලියාපදිංචි කරවා ගැනීම
- 1944 අංක 28 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
- 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.
- 1973 අංක 28 දරණ විශේෂ විධිවිධාන පනත යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

### 6.5.1.4 <u>මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවන්</u>

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව/අන්තිම කැමති පත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය සපයනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතූන් නිසා ජීවත් වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරා ගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ මත බෙදාහැරීම.
- සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙය වීම හා අධීක්ෂණය.
- විදේශ වන්දි ලෙස ලැබෙන මුදල් යැපෙන්නන් හෝ නීත්‍යානුකූල උරුම කරුවන් අතර බෙදා දීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදීම.

### 6.5.2 මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වන භාර සහ බූදල් සංඛ්‍යාව

| වර්ෂය | භාර සංඛ්‍යාව | බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| 2015 | 1,044 | 137 |
| 2016 | 1,067 | 140 |
| 2017 | 1,081 | 141 |
| 2018 | 1,097 | 143 |

### 6.5.3 මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති මුදල් ප්‍රමාණය

මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බූදල්වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2015 | 10,188,334.08 |
| 2016 | 14,986,797.37 |
| 2017 | 11,209,507.45 |
| 2018 | 16,609,742.32 |

### 6.5.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික හා මූල්‍ය කාර්යසාධනය

| ක්‍රියාකාරකම | ඇස්තමේන්තු අගය (2018) | | සත්‍ය අගය (2018.12.31) | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් ගණන | වටිනාකම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන | වටිනාකම (රු.) |
| 1. ශිෂ්‍යාධාර ගෙවීම | 687 | 6.20 | 479 | 4.95 |
| 2. වෛද්‍යාධාර ගෙවීම | 238 | 9.09 | 160 | 5.67 |
| 3. ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ගෙවීම | 493 | 26.32 | 279 | 31.00 |

| | | | | |
|---|---|---|---|---|
| 4. පුණ්‍යාධාර ගෙවීම | 267 | 8.50 | 55 | 2.78 |
| 5. අසරණාධාර ගෙවීම | 211 | 4.02 | 155 | 2.46 |
| 6. භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් | 137 | 15.67 | 131 | 16.63 |
| 7. විභාර වන්දි නිදහස් කිරීම | - | 0.00 | 49 | 132.79 |
| 8. විදේශ වන්දි නිදහස් කිරීම | - | 0.00 | 165 | 322.45 |
| 9. භාර/මුදල් දේපල කළමණාකරනය (වතු අංශය/ශුද්ධ ලාභය) | 12 | 14.28 | 11 | 2.61 |
| එකතුව | 2,045 | 84.08 | 1,484 | 521.34 |

### 6.5.5 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 56.98 | 55.31 | 97% |
| ප්‍රාග්ධන වියදම | 11.05 | 10.98 | 99% |
| **එකතුව** | **67.03** | **66.29** | **98%** |

## 6.6 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**දැක්ම**

නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ ණය ගනුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙළක් සලසා දීම.

**මෙහෙවර**

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් ණය මුදලක් සඳහා ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේ දොර ඉඩකඩම් ආදි වූ නිශ්චල දේපල ණය සහනදායි අන්දමට වාරික මඟින් හා අඩු පොලී අනුපාතයට ගෙවා නිදහස් කර ගැනීමට ණය කරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම.

**අරමුණ**

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුති වලට පාර්ශවයන් පැමිණ වීම.

### 6.6.1 හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස වැනි නිශ්චල දේපළ පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබා ගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එම ණයගැති භාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941අංක 39 දරණ ණය සහනදායක අඥා පනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

මීට අමතරව 1999 දී පනතට කරන ලද අංක 29 දරණ සංශෝධන අනුව හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස් වීමට හැකි වීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මගින්

මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණයගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද, එමගින් ණය හිමියන්ට ද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපළ පිළිබඳ ණයකරුට පහසු වන්නා වූත් ණයහිමි පිළිගනු ලබන්නා වූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතිසි ගාස්තු වශයෙන් අය කරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමගින් ලැබී ඇති සේවය අතිවිශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්යය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය. ණය සහනදායක මණ්ඩලය, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් අයෙක් මණ්ඩලයේ සභාපති ලෙස පත් කෙරේ.

මෙම මණ්ඩලයේ සභාපති සහ අනෙකුත් සෑම සාමාජිකයෙකුම තම පත්වීමේ දින සිට තුන් අවුරුදු කාල සීමාවකට නිලය දැරිය යුතුය. මෙහි රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේ දී එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එලඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමට ද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණය කරුවන්ට සහතිකයක් නිකුත් කිරීමට ද මණ්ඩලයට බලතල ඇත. එසේම ණය හිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොතිසිය පරිදි විභාගයට නොපැමිණිහොත් ඒකපාර්ශවිකව නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපැලෙන් හා ග්‍රාම නිලධාරී තැන මගින් අවස්ථානෝචිත පරිදි ණය හිමි වෙත දැනුම් දී ණය හිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදී එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතුවේ. වෙනත් අධිකරණයක මේ පිළිබඳ විභාගයක් පැවැත්වෙන අවස්ථාවකදී මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10ක උපරිමයකට යටත්ව කාලසීමාවක් ලබා දීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩු කිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥා පනත යටතේ අධිකරණයට බලතල ලබා දී ඇත.

### 6.6.2 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව ( 2018.01.01) | 829 |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 381 |
| සමාලෝචනය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 42 |
| **මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව** | **1,252** |
| සමථයට පත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 175 |
| නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 193 |
| සමාලෝචනය කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 45 |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 09 |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | 45 |
| **එකතුව** | **467** |
| 2018.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව | **785** |

### 6.6.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 27.72 | 14.25 | 51% |
| ප්‍රාග්ධන වියදම් | 0.85 | 0.61 | 72% |
| එකතුව | 28.57 | 14.86 | 52% |

## 6.7 බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 6.7.1 හැඳින්වීම

1832 වසරේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ ලංකාව පාලනය කළ කැමරන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බන්ධනාගාරය බිහි විය. ඒ අනුව 1844 අංක 18 දරණ නීතිය හා අධිකරණ ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය බොස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩනැගුනි. අනතුරුව 1877 අංක 16 දරණ බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දිනසිට බන්ධනාගාර කොමසාරිස්වරයෙකු යටතේ පාලනය වන වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රමවත් හා විධිමත් විය. සමාජ විකාශනයත් සමඟ මෙම සේවාවේ අවශ්‍යතාව තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1875 දී එංගලන්ත බීන් පිල්ඩ් බන්ධනාගාර ආකෘතියට අනුව බෝගම්බර බන්ධනාගාරය ඉදි විය. මෙලෙස විකාශිත බන්ධනාගාර පද්ධතිය වර්තමාන සමාජ සංකීර්ණත්වය හමුවේ සුවිශේෂීවූත් අත්‍යවශ්‍යවූත් ආයතනයක් බවට පත්ව තිබේ.

ඒ අනුව ආරම්භක යුගයේදී සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දුන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමානයේ ඉන් ඔබ්බට යමින් සිරකරුවන් මනා පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමුකරවන සමාජ ශෝධනාගාරයක් බවට පත්ව ඇත. එම කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම පිණිස දිවයින පුරා විසිරී ආරක්ෂිත බන්ධනාගාර 03ක්, රිමාණ්ඩ් බන්ධනාගාර 19ක් , තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, විවෘත වැඩ කඳවුරු 02ක්, වැඩ කඳවුරු 09ක්, සිර මැදිරි 20ක් සහ බන්ධනාගාර පාසලක් බන්ධනාගාර අධිකාරීවරුන් යටතේ ක්‍රියාත්මක මට්ටමේ පවතී. ඒවායින් රැකවරණය හා පුනරුත්ථාපනය වන සිරකරුවන් සහ සැකකරුවන් සංඛ්‍යාව 23,684ක් පමණ වේ.

**ආදර්ශ පාඨය**

ආරක්ෂාව, රැකවරණය, හා පුනරුත්ථාපනය

**දැක්ම**

නේවාසිකයින් පුනරුත්ථාපනය තුළින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම

**මෙහෙවර**

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා නේවාසිකයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් නිර්මාණය කරමින් ධනාත්මක චින්තනයක් ගොඩනගා නිලධාරීන්ගේ රැකියා කෘත්තීය වැඩිකිරීම තුළින් සහ සිරකරුවන්ගේ සුභසාධක කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාවය රටට වැඩදායි ලෙස යොදා ගැනීම.

**අරමුණු**

i. බන්ධනාගාර නේවාසිකයින් විධිමත්ව පුනරුත්ථාපනය මඟින් නීතිගරුක මානව හිතවාදී පුද්ගලයින් බවට පත්කර ශිෂ්ඨ සම්පන්න සමජයක් බිහිකිරීමට දායක වීම.
ii. බන්ධනාගාර නිළධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම.

**කාර්යයන්**

i. රටතුල කවර හෝ අධිකරණයක අධිකාරි බලය යටතේ බන්ධනාගාරගත කරන ලද හෝ රිමාන්ඩ් භාරයට පත්කරන ලද සෑම තරාතිරමකම සිරකරුවන් පිළිගැනීම සහ බන්ධනාගර රීතිවලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව , රැකවරණය හා නඩත්තුව සැලසීම සහ අධිකරණවලට රිමාණ්ඩ් සිරකරුවන් ඉදිරිපත් කිරීම.

ii. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සම්බන්ධ පොදු විධානය හා මනා පරිපාලනය සැලැස්වීම.

iii. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාරවල රැඳවියන් සඳහා කාර්මික, කෘෂිකාර්මික සත්ව පාලනය හා වෘත්තීය පුහුණුව ලබා දීම.

iv. බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සඳහා සුභසාධක සේවා සැලැස්වීම

v. විශෝධන ක්ෂේත්‍රය සවිමත් කිරීමට අවශ්‍ය පුහුණු කිරීම් සඳහා විධිවිධාන සැලසීම.

**ප්‍රමුඛතා**

බන්ධනාගාර ගතවන්නන්ට ආරක්ෂාව සැපයීම, රැකවරණය ලබා දීම හා පුනරුත්ථාපනය කිරීම

### 6.7.2 ආයතනික සංයුතිය

| | |
|---|---|
| 01. බන්ධනාගාර මූලස්ථානය | |
| 02. පර්යේෂණ විශෝධන පුහුණු මධ්‍යස්ථානය | |
| 03. ආරක්ෂිත බන්ධනාගාර - 03 | වැලිකඩ, නව දුම්බර, මහර |
| 04. රිමාන්ඩ් බන්ධනාගාර - 19 | අනුරාධපුරය, කොළඹ, කළුතර, මීගමුව, ගාල්ල, නව මැගසින්, අඟුනකොළපැලැස්ස, බදුල්ල, මාතර, මඩකලපුව, කෑගල්ල, ත්‍රිකුණාමලය, යාපනය, කුරුවිට, බූස්ස, මොණරාගල, පොළොන්නරුව, වාරියපොල, වව්නියාව |
| 05. වැඩ කඳවුරු 09 | හෝමාගම, මීතිරිගල, වීරවිල, අනුරාධපුරය, කුරුවිට, හංගිලිපොල, කන්දෙවත්ත, තුංකම, අඹේපුස්ස |
| 06. විවෘත වැඩ කඳවුරු - 02 | පල්ලේකැලේ, අනුරාධපුරය |
| 07. තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන - 02 | පල්ලන්සේන, තල්දෙන |
| 08. බන්ධනාගාර පාසල | වටරැක |
| 09. සිර මැදිරි - 20 | අම්පාර, අවිස්සාවේල්ල, බලංගොඩ, බලපිටිය, හලාවත, ඇල්පිටිය, ඇඹිලිපිටිය, ගම්පහ, ගම්පොල, හම්බන්තොට, කුලියාපිටිය, කුරුණෑගල, මහව, මන්නාරම, මාතලේ, නුවරඑළිය, කල්මුනේ, පානදුර, හැටන්, පුත්තලම |

### 6.7.3. රැඳවි පරිපාලන තොරතුරු 2018 .01.01. - 2018.12.31

| නේවාසිකයින් | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| උසාවි මගින් බන්ධනාගාර ගත කරන ලද සිර සංඛ්‍යාව | 24,117 | 517 | 24,634 |
| උසාවි මගින් බන්ධනාගාර ගත කරන ලද සැක සංඛ්‍යාව | 99,139 | 5,180 | 104,319 |

| විස්තරය | පිරිමි | කාන්තා | එකතුව |
|---|---|---|---|
| ජීවිතාන්ත සිරකරුවන් | 504 | 30 | 534 |
| ජීවිතාන්ත සිරකරුවන්( අභියාචන) | 107 | 17 | 124 |
| මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන් | 433 | 05 | 438 |
| මරණීය දණ්ඩනය නියමවූ (අභියාචන ) | 788 | 36 | 824 |
| විදේශීය සිරකරුවන් සංඛ්‍යාව | 85 | **15** | **100** |
| විදේශීය සැකකරුවන් සංඛ්‍යාව | 186 | **18** | 204 |
| ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සිරකරුවන් සංඛ්‍යාව | 32 | 01 | 33 |
| ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සැකකරුවන් සංඛ්‍යාව | 59 | 01 | 60 |
| ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ (අභියාචන ) | 06 | 01 | 07 |
| රැඳවුම් භාරයේ සිටියදී මිය ගිය සිර සංඛ්‍යාව | 28 | - | 28 |
| රැඳවුම් භාරයේ සිටියදී මිය ගිය ම.ද.නි. සිර සංඛ්‍යාව | 03 | **-** | **03** |
| රැඳවුම් භාරයේ සිටියදී මිය ගිය ජීවිතාන්ත සිර සංඛ්‍යාව | **05** | **03** | **08** |
| රැඳවුම් භාරයේ සිටියදී මිය ගිය සැක සංඛ්‍යාව | **55** | **04** | **59** |

- අත්අඩංගුවෙන් පැනගිය සිරකරුවන් සංඛ්‍යාව - **107**
- අත්අඩංගුවෙන් පැනගිය සැකකරුවන් සංඛ්‍යාව - **46**
- නැවත අත්අඩංගුවට පත් සංඛ්‍යාව - **81**

| නිදහස් කිරීම් | එකතුව |
|---|---|
| බන්ධනාගාර සාමාන්‍ය සමාව වෙනුවෙන් | **6,005** |

### 6.7.4. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2018.01.01 – 2018.12.31

| ව්‍යාපෘතිය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2017.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි.) | 2018 ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| පල්ලේකැලේ බන්ධනාගාරය | 4,363 | 1,537 | 273 | 100 | 99% |
| යාපනය බන්ධනාගාර සංකීර්ණය (II අදියර) | 1,137 | 786 | 288 | 144 | 82% |
| තංගල්ල අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය | 4,996 | 4,566 | 110 | 30 | 98% |
| මන්නාරම බන්ධනාගාර සිර මැදිරිය ඉදිකිරීම | 43 | 0.00 | 26 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතිකළ විරෝධතාවය හේතුවෙන් වැඩ ආරම්භ කිරීමට නොහැකිවිය | |

**6.7.5.** මානව සම්පත් ධාරිතා වර්ධනය (වැය විෂය අංක - 2401)

| ව්‍යාපෘතිය | 2018 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | වියදම ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|
| දේශීය පුහුණු | 4.00 | 3.00 | 1,042 | 76% |
| විදේශීය පුහුණු | 2.00 | 1.99 | 19 | 99% |
| එකතුව | **6.00** | **4.99** | 1,061 | **83%** |

**6.7.6.** රැඳවි වෘත්තීය පුහුණු වැඩසටහන් (වැය විෂය අංක - 2509)

| 2018 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | නිමාකළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | වියදම ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|
| 3.50 | 3.44 | 385 | 98% |

**6.7.7.** බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය (වැය විෂය අංක - 2016)

| 2018 වර්ෂයට ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | වියදම ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|
| 35.50 | 31.36 | 88% |

- බන්ධනාගාර ආයතන 11ක් ජාලගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- ලංකා රාජ්‍ය ජාල (LGN) සම්බන්ධතාවය මගින් බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියෙහි සිර ලියාපදිංචි කිරීමේ කටයුතු අනෙකුත් බන්ධනාගාර ආයතනයන්හි ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

**6.7.8.** කර්මාන්ත හා කෘෂිකර්මාන්ත කටයුතු

| 2018 වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට ආදායම (රු.මි) |
|---|---|---|
| 100.00 | 86 | 155.7 |

**6.7.9.** අභ්‍යන්තර විගණන කටයුතු

මුදල් රෙගුලාසි වලට අනුකූලව, නිරවුල් හා නිවැරදි මූල්‍ය පරිහරනය පිළිබඳ නිරීක්ෂණ සිදු කිරීම හා විමර්ශණ කටයුතු සිදු කිරීමට අදාලව බන්ධනාගාර අභ්‍යන්තර විගණන අංශය 2018 අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018.12.31 දිනට ගාල්ල, මීගමුව, වීරවිල, යාපනය, කළුතර, කුරුවිට, ත්‍රිකුණාමළය හා දුම්බර, පල්ලේකැලේ දළුපොත, වැලිකඩ, බදුල්ල, කෑගල්ල යන බන්ධනාගාර ආයතන පරික්ෂාකර නියමිත කාලය තුළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් පවත්වන ලදී.

**6.10 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 5,297.07 | 5,168.48 | 98% |
| ප්‍රාග්ධන වියදම් | 896.10 | 422.93 | 47% |
| එකතුව | 6,193.17 | 5,591.41 | 90% |

## 6.8 ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

### 6.8.1 හැඳින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියාමන ව්‍යාපාතියක් ලෙස ශ්‍රී ලංකාව තුල ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරණ ප්‍රජා විශෝධන ආඥා පනත යටතේ අධිකරණ 3කින් ආරම්භ වූ නියාමන ව්‍යාපෘතිය 2008 වසරේදී දෙපාර්තමේන්තුවක් බවට පත් වූ අතර 2018 මැයි මාසයේ සිට නැවතත් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මේ වන විට දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණ හා සංචාරක අධිකරණ ද ඇතුළුව මහේස්ත්‍රාත් අධිකරණ 125ක ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරීම, සිරකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුළු වරදකරුවන් බන්ධනාගාර ගතවීම තුළින් සංවිධානාත්මක අපරාධ කරුවන් බවට පත්වීමේ ඉඩකඩ වැලැක්වීම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ.

අධිකරණයේ සුළු වරදකරුවකු වූ පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබා දීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළ සිටියදීම ඔහු වරදකාරි චර්යා රටාවෙන් මුදවා යහපත් පුරවැසියකු බවට පත් කිරිමට අවශ්‍ය කටයුතු කිරිමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණ වලට අනුබද්ධිතව පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල වලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරින් විසින් විවිධ වූ විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරින්ගේ අධික්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමුකිරිම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

වරදකරුවන් පමණක් නොව වරදට යොමුවිය හැකි පුද්ගලයන්ද යහමඟට ගැනිම කාලීන අවශ්‍යතාවක් වි ඇති බැවින් ඒ පිලිබඳව ද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයේදිට වඩා තම කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යයන් සිදුකිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

### 6.8.2 සේවාවන්

1. 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මගින් සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ විශෝධනය කිරීම.
2. සුළු වරදකරුවන් බන්ධනාගාර ගත වීම අඩු කර බන්ධනාගාර තදබදය හා ඒ සඳහා වැයවෙන රජයේ වියදම් අඩුකරීම.
3. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොමුකර ගැනීම.
4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් මානසික, අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම.
5. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ හා අවදානම් සහිත පුද්ගලයන්ගේ පවුල් සංවර්ධනය කිරීම.

### 6.8.3 ප්‍රගතියට අදාල තොරතුරු

**අ) ලබා ගත් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2018.01.01 – 2018.12.31)**

| පළාත | නියෝග ලැබූ ආඥාලිභීන් සංඛ්‍යාව |
|---|---:|
| බස්නාහිර | 5,382 |
| මධ්‍යම | 825 |
| ඌව | 495 |
| දකුණ | 1,972 |
| සබරගමුව | 1,191 |
| නැගෙනහිර | 496 |
| වයඹ | 890 |
| උතුරු මැද | 214 |
| උතුර | 1,318 |
| එකතුව | **12,783** |

**ආ) ලබාගත් විශෝධන ආඥා - වරද අනුව** - (2018.01.01 – 2018.12.31)

| වරදේ ස්වභාවය | නියෝග ලැබූ සංඛ්‍යාව |
|---|---:|
| හෙරොයින් | 3,131 |
| ගංජා | 1,418 |
| නීති විරෝධී මත්පැන් | 3,788 |
| මහජන පීඩා | 907 |
| සොරකම් | 42 |
| වංචාව | 2 |
| අනවසර ආයුධ | 18 |
| සොර බඩු ලඟ තබා ගැනීම | 4 |
| සූදුව | 956 |
| කෝලාහළ | 5 |
| වෙනත් | 2,512 |
| එකතුව | 12,783 |

**ඇ) විශෝධන ආඥා පිලිබඳ තොරතුරු** - (2018.01.01 – 2018.12.31දක්වා**)**

| ලබා ගත් ආඥා සංඛ්‍යාව | අවසන් කරන ලද ආඥා සංඛ්‍යාව | කඩ කිරීම් සංඛ්‍යාව |
|---|---|---|
| 12,783 | 7,086 | 2,207 |

**ඇ) පවත්වන ලද විශෝධන වැඩසටහන් -** (2018.01.01 – 2018.12.31දක්වා)

| වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|
| උපදේශන | 3,227 |
| අධ්‍යාත්මික සංවර්ධන | 278 |
| ශ්‍රමදාන | 792 |
| වෘත්තීය පුහුණු | 293 |
| වෛද්‍ය උපදේශන | 151 |
| එකතුව | 4,741 |

## 6.8.4 ව්‍යාපෘතිවල කාර්යසාධනය 2018.01.01 දින සිට 2018.12.31 දක්වා

මෙම ව්‍යාපෘතිය යටතේ වයඹ, සබරගමුව හා දකුණු පළාත්වල මහේස්ත්‍රාත් අධිකරණ මඟින් පුද්ගලයින් 4,053ක් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදී ඇත. මෙම පුද්ගලයින් අතරින් මත්ද්‍රව්‍ය සමබන්ධව වැරැදි සඳහා පුද්ගලයින් 3,140ක් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබාදී ඇති අතර සෘජුවම මත් ද්‍රව්‍ය (ගංජා, හෙරෝයින් හා නීතී විරෝධි මත් පැන්) සම්බන්ධ වැරැදිකරුවන් සංඛ්‍යාව 2,386 කි.

මෙම ව්‍යාපෘතිය යටතේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිකරුවන්, විශේෂ මත් නිවාරණ උපදේශන ක්‍රියාවලියෙන් පසුව මත් ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන අතර එහිදී වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි නේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. ප්‍රතිකාර ලබාදෙන අතරතුර, ප්‍රතිකාර මඟින් මතින් මිදි නිවෙසට පැමිණෙන පුද්ගලයින් පවුල තුළ පිළිගැනීම හා පවුල් සංවර්ධනය සඳහා පවුලේ සෙසු සාමාජිකයින්ගේ සහයෝගය ලබාගත යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම හා සූදානම් කිරීම සිදු කරනු ලබයි. මත් ප්‍රතිකාරවලින් පසුව ස්ථිර ආදායමක් ලබා ගත හැකි රැකියාවකට යොමු කිරීම හෝ රැකියාවක් කිරීමට අවශ්‍ය නිපුණතාවය ලබා ගැනීම සඳහා මෙම පුද්ගලයින් යොමු කරනු ලබයි. එමෙන්ම ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා හැකියාව හා කැමැත්ත තිබෙන පුද්ගලයින් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යොමු කරනු ලබයි. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ආරම්භක ප්‍රාග්ධනය සලසාගත නොහැකි ආඥාලාභීන් සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ රු.50,000 උපරිමයකට යටත්ව මුල්‍ය ආධාරයක්ද ලබාදීමට කටයුතු කර ඇත. ඒ අනුව වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 8.81 කි.

**පළාත් වශයෙන් මෙම ව්‍යාපෘතියට අදාළ ප්‍රගතිය.**

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | වැය වූ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය(%) |
|---|---|---|---|---|
| මත් ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය (වයඹ පළාත, සබරගමුව පළාත හා දකුණු පළාත්වල) | 8.82 | 8.81 | 99% | **වයඹ පළාත**<br>ආඥාලාභීන් මතින් මුදවා ගැනීමේ ප්‍රගතිය 68.13% .<br>(මත් ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද සංඛ්‍යාවෙන් මතින් මිදුණු සංඛ්‍යාව)<br>ලබාගත් ආඥාලාභීන්සංඛ්‍යාව - 877<br>ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව - 475 කි. මතින් මුදවා ගන්නා ලද සංඛ්‍යාව - 325කි. රැකියා / ස්වයං රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව -156කි ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති මුදල රු. 2,054,060කි. |
| | | | | **සබරගමුව පළාත**<br>ආඥාලාභීන් මතින් මුදවා ගැනීමේ ප්‍රගතිය 88.53%<br>ලබා ගත් ආඥාලාභීන් සංඛ්‍යාව - 1089කි.<br>ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව - 349කි<br>මතින් මුදවා ගන්නා ලද සංඛ්‍යාව - 309කි. රැකියා / ස්වයං රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව - 33කි. ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති මුදල රු. 476,000 කි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දකුණු පළාත<br>ආඥාලාභීන් මතින් මුදවා ගැනීමේ ප්‍රගතිය 94.90%<br>ලබා ගත් ආඥාලාභීන් සංඛ්‍යාව - 1,174කි.<br>ප්‍රතිකාර සම්පූර්ණ කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව - 255 කි.<br>මතින් මුදවා ගන්නා ලද සංඛ්‍යාව - 249කි.<br>රැකියා / ස්වයං රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව - 80කි. ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති මුදල රු. 1,475250 කි |

### 6.8.5 නිලධාරින් වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩ සටහන් (2018.01.01-2018.12.31 දක්වා)

| නිලධාරින් | වැඩ සටහන් සංඛ්‍යාව | වියදම් වූ මුදල රු.මි. |
|---|---|---|
| සහකාර කොමසාරිස්, ගණකාධිකාරි, ජො.ප්‍ර.වි.නි (පළාත්), ප්‍ර.වි.නි, සංවර්ධන නිලධාරි, තොරතුරු තාක්ෂණ සහකාර, රා.ක.ස, ලිපිකරු | 23 | 1.71 |

මීට අමතරව ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා විශෝධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද පුනරුත්ථාපන සංවර්ධන නිලධාරීන් සඳහා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ද ලබා දීම සඳහා කටයුතු සිදු කෙරේ.

### 6.8.6 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 276.96 | 264.49 | 95% |
| ප්‍රාග්ධන වියදම් | 13.5 | 13.27 | 98% |
| එකතුව | 290.46 | 277.76 | 96% |

## 6.9 සමථ මණ්ඩල කොමිෂන් සභාව

**දැක්ම**

සමථකරණය තුළින් සංහිඳියාව සහ සමාජ සහජීවනය

**මෙහෙවර**

ශ්‍රී ලාංකික ප්‍රජාව හා සබැඳි කාර්යක්ෂම ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් දිවයින පුරා ප්‍රචලිත කිරීම

### 6.9.1 සමථ මණ්ඩල කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීම

- ❖ 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.
- ❖ අධිකරණ ක්‍රියාවලිය පහසු කිරීමේ අරමුණින් අධිකරණ වෙත ඉදිරිපත් වන සුළු ආරවුල් නිරවුල් කිරීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස සමථකරණ ක්‍රියාවලිය බලගැන්වීම සමථ මණ්ඩල ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වේ.
- ❖ සමථ මණ්ඩල පනතෙහි විධිවිධාන ප්‍රකාරව සමථකරණ ක්‍රියාවලිය මගින් පාර්ශවයන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරු කටයුතු කරනු ලබයි.
- ❖ ස්වකීය ආරවුල් විසඳීමේ පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස සමථ මණ්ඩල ක්‍රමවේදය කෙරෙහි ප්‍රජාව නැඹුරු වීමත් සමඟ සෑම වසරකදීම ලක්ෂ 3කට ආසන්න ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙත යොමු වේ.
- ❖ සමථ මණ්ඩල වලට යොමුවන ආරවුල් ප්‍රමාණය හා ආරවුල් නිරවුල් කිරීමේ ප්‍රතිශත මත සමථ මණ්ඩල වල ප්‍රගතිය මනිනු ලැබේ.

### 6.9.2 සමථ මණ්ඩලකොමිෂන් සභාවේ සංයුතිය බලතල හා කාර්යභාරය

❖ සංයුතිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තුමන් විසින් වසර තුනක (03) ධූර කාලයක් සඳහා සාමාජිකයින් පස්දෙනෙකුගෙන් සමන්විත සමථ මණ්ඩල කොමිෂන් සභාවක් පත් කරනු ලබයි.

❖ බලතල හා කාර්යභාරය

සමථ මණ්ඩල පනතෙහි සඳහන් කාර්යය සඳහා සමථකාරවරු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමද, සමථකරුවන් විසින් මේ පනත යටතේ තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම අධීක්ෂණය හා පාලනය කිරීමද ඒ සමථකරුවන් වෙත අවශ්‍ය විය හැකි විධාන නිකුත් කිරීමද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ කාර්යභාරය වේ.

### 6.9.3 සමථ මණ්ඩල කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කාර්යයන්

1. සමථ මණ්ඩල පනත අනුව ශ්‍රී ලංකාව පුරා සමථ මණ්ඩල පිහිටුවීම හා අවශ්‍ය පහසුකම් සලසා දීම.
   - ❖ සමථකරුවන් බඳවා ගැනීම සඳහා නාම යෝජනා කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පස්දින පුහුණු වැඩමුළු පවත්වා සමථකරු පුහුණු කර බඳවා ගැනීම.
   - ❖ සමථ මූල මණ්ඩල හරහා දීප ව්‍යාප්තව ආරවුල් නිරාකරණය සඳහා මැදිහත් වීම
2. 2003 අංක 21 දරණ සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ඉඩම් ආරවුල් පිළිබඳ සමථ මණ්ඩල 05 ක් පහත සඳහන් දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් පිහිටුවීම.
   - ❖ යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මඩකළපුව, කිළිනොච්චිය
3. පාසල් සමථ ඒකක පිහිටු වීම හා පාසල් සමථකරණ වැඩමුළු පැවැත් වීම.
4. සමථකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

### 6.9.4 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාර්යසාධනය

| විස්තරය | ආරවුල් සංඛ්‍යාව |
|---|---|
| 2018 වර්ෂය ආරම්භයේ විසඳීමට ඉතිරි වූ ආරවුල් සංඛ්‍යාව | 62,512 |
| 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ලද ආරවුල් සංඛ්‍යාව | 248,805 |
| මුළු එකතුව | 311,317 |
| සාකච්ඡා කළ ආරවුල් සංඛ්‍යාව | 124,668 |
| 2018.01.01 දින සිට 2018.12.31 දිනට සාකච්ඡා කර නිරවුල් කළ ආරවුල් සංඛ්‍යාව | 83,867 |
| ආරවුල් නිරවුල් කිරීමේ ප්‍රතිශතය | 67% |

### 6.9.5 2018.01.01 දින සිට 2018.12.31 දක්වා සාකච්ඡා කළ ආරවුල් ස්වභාවය අනුව

| ආරවුල්වල ස්වභාවය | වාර්තා වූ සංඛ්‍යාව | සමථ කළ ආරවුල් සංඛ්‍යාව | මුළු ආරවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| අධිකරණයෙන් | 14,833 | 7,937 | 6.0% |
| පොලිසියෙන් | 47,855 | 23,283 | 49% |
| බැංකු / මූල්‍ය ආයතනවලින් | 165,930 | 44,847 | 27% |
| ආරවුල්කරුවන්ගෙන් | 17,335 | 6,765 | 39% |
| වෙනත් | 2,852 | 1,035 | 36% |
| එකතුව | 248,805 | 83,867 | |

### 6.9.6 2018.01.01 දින සිට 2018.12.31 දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩලවල ආරවුල් නිරවුල් කිරීම

| පළාත | සාකච්ඡා කළ ආරවුල් සංඛ්‍යාව | නිරවුල් කළ ආරවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය% |
|---|---|---|---|
| බස්නාහිර | 26,206 | 16,449 | 63% |
| මධ්‍යම | 17,089 | 12,068 | 71% |
| දකුණ | 16,812 | 10,241 | 61% |
| වයඹ | 21,900 | 17,165 | 78% |
| උතුරු මැද | 8,147 | 4,960 | 61% |
| ඌව | 8,181 | 5,654 | 69% |
| සබරගමුව | 11,607 | 6,927 | 60% |
| නැගෙනහිර | 10,280 | 7,283 | 71% |
| උතුර | 4,446 | 3,120 | 70% |
| එකතුව | 124,668 | 83,867 | 67% |

### 6.9.7 2018 වර්ෂය තුළ සමථ මණ්ඩල පුහුණු වැඩමුළු පැවැත්වීමේ කාර්යසාධනය

පවත්වා ඇති මුළු පස්දින වැඩමුළු සංඛ්‍යාව - 68

පවත්වා ඇති මුළු එක්දින වැඩමුළු සංඛ්‍යාව - 46

පවත්වා ඇති විශේෂ වැඩමුළු සංඛ්‍යාව - 26

සහභාගි වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 4,982

වියදම - රු. 5,593,200

පවත්වා ඇති පාසල් හා ප්‍රජා සමථකරණ වැඩමුළු සංඛ්‍යාව - 232

වියදම - රු.4,932,250

සහභාගි වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 10,440

ජනාධිපති කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන දරුවන් සුරකිමු ජාතික වැඩසටහන යටතේ පවත්වා ඇති පාසල් සමථකරණ ඒකක පිහිටුවීමේ වැඩමුළු සංඛ්‍යාව - 85
සහභාගි වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 3,400
වියදම - රු.6,502,500

**6.9.8** 2018.01.01 දින සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 282.70 | 261.17 | 92% |
| ප්‍රග්ධන වියදම් | 1.35 | 0.41 | 31% |
| එකතුව | 284.05 | 261.58 | 92% |

## 6.10 කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය

**දැක්ම**

රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය වඩා තහවුරු කිරිම

**මෙහෙවර**

ශක්තිමත් හා පුහුණු කාර්යය මණ්ඩලයක් හරහා කඩිනම් වූත්, සාධාරණ වූත් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රියාවලියක් තුලින් රාජ්‍ය නොවන සේවකයින්ගේ රැකියා සුරක්ෂිත භාවය වඩා තහවුරු කිරිම

### 6.10.1 හැඳින්වීම

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 31 (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්වය සභා වෙත පැවරී ඇති මූලික වගකීම වේ. රාජ්‍ය නොවන ආයතන වල සේවක පක්ෂය රැකියා වලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්වය සභාව දැක්විය හැක. කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්වය සභා 39 ක් ක්‍රියාත්මක වේ.

කම්කරු විනිශ්වය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

**පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්වය සභා ස්ථාපිතව ඇත.**

| | කම්කරු විනිශ්වය සභාව | | කම්කරු විනිශ්වය සභාව | | කම්කරු විනිශ්වය සභාව |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ අංක 01 | 14 | අවිස්සාවේල්ල | 27 | හලාවත |
| 02 | කොළඹ අංක 02 | 15 | මහනුවර | 28 | මඩකලපුව |
| 03 | කොළඹ අංක 08 | 16 | ගාල්ල | 29 | කඩුවෙල |
| 04 | කොළඹ අංක 13 | 17 | බදුල්ල | 30 | වත්තල |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | බත්තරමුල්ල 01/ අතිරේක | 18 | මීගමුව අංක 21 | 31 | රත්මලාන |
| 06 | බත්තරමුල්ල 02/අතිරේක | 19 | මීගමුව අංක 21/අතිරේක | 32 | හෝමාගම |
| 07 | රත්නපුර | 20 | කුරුණෑගල | 33 | කොටපොල |
| 08 | නුවරඑළිය | 21 | ගම්පහ | 34 | බණ්ඩාරවෙල |
| 09 | හැටන් | 22 | පානදුර | 35 | තලවකැලේ |
| 10 | කළුතර | 23 | මාතර | 36 | පලාපත්වල |
| 11 | ඇඹිලිපිටිය (සංචාරක) | 24 | අනුරාධපුරය | 37 | අම්පාර |
| 12 | බලංගොඩ | 25 | නාවලපිටිය | 38 | යාපනය |
| 13 | ත්‍රිකුණාමලය | 26 | කෑගල්ල | 39 | කුලියාපිටිය |

### 6.10.2 2018.01.01 දින සිට 2018.12.31දින දක්වා කාර්යසාධනය

| 2018.01.01 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | 2018.01.01 සිට 2018.12.31 දක්වා | | 2018.12.31දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරූ නඩු ගණන | විසඳූ නඩු ගණන | |
| 4,689 | 2,434 | 2,289 | 4,834 |

### 6.10.3 2018.01.01 දින සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 351.69 | 345.97 | 98% |
| ප්‍රාග්ධන වියදම | 11.55 | 7.45 | 64% |
| එකතුව | 363.24 | 353.42 | 97% |

## 6.11 අධිකරණ නොවන නිලධාරීන්ගේ පුහුණු ආයතනය

**මෙහෙවර**

අධිකරණවල සේවයේ නියුතු විනිසුරුවරුන් හැර අනෙකුත් උපලේඛනගත හා උපලේඛනගත නොවන නිලධාරීන් පුහුණු කිරීම තුළින් අධිකරණ සේවයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නංවා නඩු විසඳීමේ යාන්ත්‍රණයේ ඇති ප්‍රමාදයන් අවම කර ජනතාවට වඩා යහපත් සේවයක් ලබා දීම.

### 6.11.1 හැඳින්වීම

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණු කර ගනිමින් 2010 වර්ෂයේ බත්තරමුල්ල - පැලවත්තේ පිහිටි අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි මෙම ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරීන් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

01. ආකල්ප හා විනය සංවර්ධනය
02. රාජකාරිය පිළිබඳ අවබෝධය
03. නව්‍යකරණය හා නිර්මාණකරණය
04. අල්ලස හා දූෂණය මැඩලීම

### 6.11.2 පුහුණු වැඩසටහන් පැවැත්වීම

2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

අ) බත්තරමුල්ල අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය තුල පවත්වන ලද පුහුණු වැඩසටහන්

| අංකය | පුහුණු වැඩසටහන | වැඩසටහන් ගණන | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | ගිණුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් | 07 | 282 |
| 02 | අපරාධ නීතිය, සිවිල් නීතිය, කාර්යාල කළමනාකරණය සහ විනය කාර්ය පටිපාටිය හා සාමාන්‍ය පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන | 07 | 259 |
| 03 | අධිකරන පවුල් උපදේශන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 04 | 96 |
| 04 | අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට බඳවා ගත් නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 02 | 95 |
| | එකතුව | 20 | 732 |

ආ) ආයතනයෙන් පිටත පවත්වන ලද පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | පැවැත්වූ ස්ථානය | වැඩසටහන් ගණන | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා සහ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරේ සහකම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක තනතුරේ පත්වීම් ලිපි ප්‍රදානය හා පුහුණු වැඩමුළුව | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 01 | 136 |
| 02 | නුවරඑළිය කළාප පුහුණු වැඩසටහන | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 100 |
| 03 | බදුල්ල කළාප පුහුණු වැඩසටහන | බණ්ඩාරවෙල කැන්මාර්ක් හෝටලය | 01 | 136 |
| 04 | අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට බඳවා ගත් නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන (විවෘත) ප්‍රායෝගික පුහුනු වැඩසටහන | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය | 01 | 50 |
| 05 | අධිකරණ භාෂණ පරිවර්ථක III ශ්‍රේණියට බඳවා ගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය | 01 | 17 |
| 06 | මඩකළපුව කළාප පුහුණු වැඩසටහන | මඩකළපුව මහාධිකරණ සංකීර්ණය | 01 | 105 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | කල්මුණේ කළාප පුහුණු වැඩසටහන | කල්මුණේ සායින්ද මරුදූ ජාතික තරුණ සේවා සභා ශාලාව | 01 | 113 |
| 08 | හම්බන්තොට කළාප පුහුණු වැඩසටහන | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය | 01 | 120 |
| 09 | ඇඹිලිපිටිය කළාප පුහුණු වැඩසටහන | ඇඹිලිපිටිය සෙන්චූරියා ලේක් හෝටලය | 01 | 120 |
| | **එකතුව** | | **09** | **897** |

**6.11.3 <u>2018.01.01 දින සිට 2018.12.31</u> දක්වා <u>මූල්‍ය ප්‍රගතිය</u>**

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 8.00 | 5.75 | 72% |
| ප්‍රාග්ධන වියදම | 6.00 | 0.01 | 0.07% |
| **එකතුව** | **14.00** | **5.76** | **26%** |

## 6.12 ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ (ඇපයෙන් සීමිත) සමාගම (SLIAC)

අධිකරණ අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22වන මහලේ කොටසක් බදු පදනම මත ලබාගත් අතර, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා එය අලුත්වැඩියා කරන ලදී. ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015 ජුනි මස 05 වන දින ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ඉන් අනතුරුව, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස 2016 දෙසැම්බර් 20 වන දින සාර්ථක ලෙස සංස්ථාගත කරන ලදී. සමාගම් ව්‍යවස්ථාවලිය යටතේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ.

- ආචාර්ය අසංග ගුණවංශ - සභාපති (වැඩ බලන)
- ජනාධිපති නීතිඥ දිලාල් පිලිප්ස් මහතා
- ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
- නෙවිල් ඒ. අබේරත්න
- සාරදා ද සිල්වා මහතා
- සුදත් ජයසුන්දර මහතා
- කුමාර් ඒකරත්න මහතා
- ජනාධිපති නීතිඥ ජී.ජී. අලගරත්නම් මහතා
- ඒ.කේ.ඩී.ඩී.ඩී.අරන්දර මහතා

ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ (ඇපයෙන්සීමිත) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වතාවක් රැස්වන අතර, මධ්‍යස්ථානයේ අවශ්‍යතාවන් සපුරාලීමට හැකිවන පරිදි රජය වෙතින් මූල්‍ය සහාය ලබා ගැනීමේ අරමුණින් දැනට සාකච්ඡා පැවැත්වේ. ඊට අමතරව, අන්තර්ජාතික වශයෙන් පිළිගත් බේරුම්කරුවන් සහ විද්වතුන් මෙන්ම ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ බේරුම්කරණ විශේෂඥයන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පත් කිරීම සඳහා වන යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලමින් පවතී. සාමාජිකයින් විසින් දැනට සලකා බලනු ලබන තැනැත්තන් වන්නේ මහාචාර්ය කජ්හෝබර් මහතා (ස්වීඩනය), නිරූපිල්ලෙයි මහතා (සිංගප්පූරුව), විනායක් ප්‍රධාන් මහතා (මැලේසියාව), ජනාධිපති නීතිඥ ශිබ්ලි අසිස් මහතා (ශ්‍රී ලංකාව), ජනාධිපති නීතිඥ කේ. කනගීස්වරන් මහතා (ශ්‍රී ලංකාව) සහ විනිසුරු ජී.පී.එස් ද සිල්වා මහතාය. (ශ්‍රී ලංකාව)

# 07. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය ආයතන

## 7.1 නීති ආධාර කොමිෂන් සභාව

නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. දරිද්‍රතාවය නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලාංකිකයින් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබාදීම, ඕනෑම පුද්ගලයෙකුට නීති උපදෙස් ලබා දීම, සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීම, නව නීති සම්පාදනයේදී හා නෛතික නීති ප්‍රතිසංස්කරණ වලදී රජයට උපදේශන කාර්යයේ නිරත වීම හා පර්යේෂණ කටයුතු සිදු කිරීම අනෙකුත් කාර්ය භාරය අතර ප්‍රධාන වේ.

### 7.1.1 <u>නීති අංශය</u>

1. යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.
2. ඕනෑම කෙනෙකුට නොමිලේ නීති උපදෙස් ලබාදීම.
3. නව නීති සම්පාදනයේදී හා නීති ප්‍රතිසංස්කරණ වලදී රජයට උපදේශන කාර්යය සිදු කිරීම.

සෘජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නීති ආධාර කාර්යාල 83 ක් වේ. ඒවා දිවයින පුරා පිහිටි අධිකරණ ආශ්‍රිතව පිහිටුවා ඇත. අධිකරණමය කටයුතු වලදී ග්‍රාම නිලධාරිවරයා මඟින් කැඳවූ ආදායම් වාර්තා සලකා බලන නමුත් නඩත්තු, ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව, අපරාධ වින්දිත හා ළමයින් සම්බන්ධ නඩු කටයුතුවල දී ආදායම නොසලකා ඒ සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

අ) <u>**නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර**</u>

| නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|
| 2017 වසරෙන් ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 29,783 |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | 12,723 |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා පැවති මුළු නඩු ගණන | 42,506 |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අවසන් කරනු ලැබූ හා බහා තැබූ නඩු සංඛ්‍යාව | 10,075 |
| 2019 ජනවාරි 01 වන දිනට රැගෙන ගිය නඩු සංඛ්‍යාව | 32,431 |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා දෙනු ලැබූ මුළු උපදේශන | 120,675 |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරනු ලැබූ සමස්ථ සේවය | 163,181 |

## ආ) නඩු සඳහා පෙනී සිටීමේ කාර්යසාධනය

| විස්තරය | එකතුව |
|---|---|
| දික්කසාද | 7,016 |
| නඩත්තු | 23,614 |
| ඉඩම් | 1,115 |
| බෙදුම් | 46 |
| මුදල් අයකර ගැනීම | 1,938 |
| මහාධිකරණවල ගොනු කර ඇති නඩු | 196 |
| අභියාචනාධිකරණවල ගොනු කර ඇති නඩු | 225 |
| අනතුරු | 1,489 |
| ඇප | 364 |
| ළමා අයිතිවාතිවාසිකම් | 684 |
| කම්කරු විනිශ්චය සභා | 1,110 |
| අපරාධ | 986 |
| ශ්‍රේෂ්ඨාධිකරණ | 138 |
| අපරාධ වින්දිතයින් | 1,162 |
| විශේෂ | 325 |
| භාරකාරත්වය හා කුලවද්දා ගැනීම | 93 |
| ගෘහස්ත හිංසනය | 466 |
| අනෙකුත් | 1,539 |
| එකතුව | 42,506 |

## ඇ) නීති ආධාර කොමිෂන් සභාව මගින් පළාත් මට්ටමින් සේවා සැපයීම

| පළාත | 2018.01.01 දිනට පැවති නඩු | අලුත් නඩු 2018.01.01 සිට 2018.12.31දක්වා | එකතුව | අවසන් නඩු 2018.01.01 සිට 2018.12.31දක්වා | බහා තැබූ නඩු 2018.01.01 - 2018.12.31 | 2018.12.31දිනට ඉදිරියට ගෙන යනු ලබන නඩු ප්‍රමාණය | නීති උපදේශන 2018.01.01 - 2018.12.31 |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 7,766 | 2,898 | 10,664 | 1,561 | 590 | 8,513 | 33,881 |
| ඌව | 2,060 | 1,017 | 3,077 | 410 | 234 | 2,433 | 11,075 |
| දකුණ | 3,867 | 1,631 | 5,498 | 869 | 319 | 4,310 | 17,803 |
| උතුර | 2,972 | 1,188 | 4,160 | 739 | 112 | 3,309 | 11,776 |
| සබරගමුව | 2,197 | 1,028 | 3,225 | 499 | 353 | 2,373 | 8,953 |
| වයඹ | 3,154 | 1,308 | 4,462 | 725 | 277 | 3,460 | 16,122 |
| මධ්‍යම | 2,217 | 855 | 3,072 | 879 | 139 | 2,054 | 7,051 |
| නැගෙනහිර | 3,214 | 1,790 | 5,004 | 1,363 | 298 | 3,343 | 8,234 |
| උතුරුමැද | 2,336 | 1,008 | 3,344 | 438 | 270 | 2,636 | 5,780 |
| එකතුව | 29,783 | 12,723 | 42,506 | 7,483 | 2592 | 32,431 | 120,675 |

### 7.1.2 වැඩසටහන් හා ව්‍යාපෘති අංශය

## අ) ජනමාධ්‍ය වැඩසටහන්

| වැඩසටහන | වැඩසටහන් ගණන |
|---|---|
| රූපවාහිනී වැඩසටහන් | 21 |
| ගුවන්විදුලි වැඩසටහන් | 06 |
| පුවත්පත් වැඩසටහන් | 39 |
| එකතුව | 66 |

ආ) දැනුවත් කිරීමේ සහ සමාජ සහභාගීත්වය වෙනුවෙන් පවත්වන වැඩසටහන්

| වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|
| නෛතික දැනුම ලබා දීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, වරප්‍රසාද ලබා ගැනීමට සහයෝගය දැක්වීම උදෙසා ළමයින්, කාන්තාවන්, වැඩිහිටියන් හා අබාධිත ප්‍රජාව කේන්ද්‍ර කොට ගනිමින් පැවැත්වූ වැඩසටහන් | 28 |
| නෛතික දැනුම ලබා දීම, ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ළඟා කර ගැනීම | 05 |
| ආරාධිත දේශන හා නීති උපදේශන මඟින් සම්පත් දායකත්වය ලබා දුන් වැඩසටහන් (නිල මෙහෙවර ජනපති ජනතා සේවය, තිරසර හෙටක් ජාතික වැඩසටහන, විවෘත ආර්ථිකයේ 40 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන, රුක් රෝපා වැඩසටහන) | 31 |
| වතුකම්කරුවන්, ධීවර ප්‍රජාව, මුඩුක්කු හා පැල්පත් වාසීන් අරමුණු කොට සිදු කරනු ලැබූ වැඩසටහන් | 02 |
| බන්ධනාගාර වැඩසටහන් | **63** |
| නීතිඥවරුන් සඳහා වන වැඩසටහන් | 06 |
| ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම | 13 |
| විදේශ ගත ශ්‍රමිකයින්ගේ පවුල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 01 |
| නීති ආධාර සායන | 13 |
| ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ වැඩමුළු | 02 |
| **එකතුව** | **164** |

## 7.1.3 සංවර්ධන නීති ආධාර අංශය

### අ) විගමනික සංක්‍රමණික සේවකයින් සම්බන්ධයෙන් තොරතුරු ඒකකය

ගැටළු වලට මුහුණ පෑ විගමණික ශ්‍රමිකයින් සඳහා වෙන් වූ මෙම අංශය මගින් විගමනික ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් 2018.05.22 වන දින හලාවත මයික්කුලම හිදී පවත්වන ලදි.

### ආ) බන්ධනාගාර රැඳවියන්ගේ ඒකකය

මෙම වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා නීති ආධාර වැඩසටහන් 47කදී රැඳවියන් 705ක් නීති ආධාර අපේක්ෂා කොට ඇති අතර ඉන් නීති ආධාර ලබා දීම සඳහා රැඳවියන් 680ක් තෝරාගෙන ඇති අතර ඉන් ඇප අයදුම්පත් 320ක් ගොනු කොට මේ වන විට ඇප නියෝග ලබාගත් සංඛ්‍යාව 102කි.

### ඇ) ආධුනික නීතිඥයින් සඳහා වන පුහුණු වැඩසටහන

මෙම වසරේ ජනවාරි සිටදෙසැම්බර් 31 දක්වා කාලය තුල දී කණ්ඩායම් එකක් යටතේ ආධුනික නීතිඥයින් 263 දෙනෙකු පුහුණු කොට ඇති අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රවීණ විද්වත් ජනාධිපති නීතිඥවරුන් ඇතුළු සම්පත් දායකයින් 07 දෙනෙකුගේ බාහිර සේවය කොමිෂන් සභාව විසින් ලබා ගෙන තිබේ.

## 7.1.4 සංවර්ධන හා කළමනාකරණ අංශය

### අ) නිලධාරීන් පුහුණු කිරීම 2018.01.01 සිට 2018.12.31දක්වා

2018.01.01 සිට 2018.12.31 දක්වා කාලය තුළ නීතිඥයින් 07 දෙනෙකු පුහුණු කර ඇත.

**ආ) නව මධ්‍යස්ථාන ආරම්භ කිරීම**

2017 වර්ෂයේ දෙසැම්බර් 31වන විට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතු වූ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ගණන 82ක් වූ අතර එම සංඛ්‍යාව 83 දක්වා වර්ධනය වී ඇත.

| ප්‍රාදේශීය මධ්‍යස්ථානය | විවෘත කල දිනය |
|---|---|
| වත්තල | 2018/09/26 |

**ඇ) වසර තුළ නව බඳවා ගැනීම්**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නීති නිලධාරි | 08 |
| කළමනාකරණ සහකාර | 04 |
| කාර්යාල කාර්ය සහයක | 03 |
| එකතුව | 15 |

**ඇ) ගොඩනැගිලි ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු**

**i. නීති ආධාර මධ්‍යස්ථාන ඉදි කිරීම**

2018 වර්ෂය තුළ කල්මුණේ හා දෙහිඅත්තකණ්ඩිය නව ගොඩනැගිලි ඉදිකර අවසන් කරන ලද අතර කුරුණෑගල නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 30%ක් අවසන් ව ඇත.

**ii. ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති**

තිස්සමහාරාම, වලස්මුල්ල, මාතර, කොළඹ, අත්තනගල්ල, හෙට්ටිපොල, ත්‍රිකුණාමලය, ගාල්ල ගොඩනැගිලිවල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 2018 වර්ෂය තුළ සිදු කරන ලදී.

**iii. ඉදි කිරීම් ආරම්භ කර නොමැති ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | උපදේශක | ප්‍රගතිය |
|---|---|---|
| කළුතර නව ගොඩනැගිල්ල ඉදි කිරීම | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මට අනුමැතිය ලබා ගැනීමට නගර සභාවට ඉදිරිපත් කර ඇත. |
| කඩුවෙල නව ගොඩනැගිල්ල ඉදි කිරීම | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මට අනුමැතිය ලබා ගැනීමට නගර සභාවට ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ භූමියේ වර්ෂ පහක් ඇතුලත නව මිනුමක් සකස් කරන ලද පිඹුරුපතක් ලබා ගැනීමට අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත. |
| දඹුල්ල නව ගොඩනැගිල්ල ඉදි කිරීම | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මට අනුමැතිය ලබා ගැනීමට නගර සභාවට ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ භූමියේ වර්ෂ පහක් ඇතුලත නව මිනුමක් සකස් කරන ලද පිඹුරුපතක් ලබා ගැනීමට අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත. |

### 7.1.5 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.1 දිනට වියදම (රු.මි) | 2018.12.31දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 198.90 | 198.90 | 100% |
| ප්‍රාග්ධන වියදම් | **25.00** | **17.90** | **72%** |
| **මුළු වියදම්** | 223.9 | 216.8 | **98%** |

## 7.2 ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

**දැක්ම**

ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම කළමනාකරණයකින් යුතු මණ්ඩලය බවට පත් කිරීම.

**මෙහෙවර**

පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරිම මඟින් ඒවා භාවිතයට ගන්නා විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, නඩු කියන්නන්, අධිකරණ අමාත්‍යාංශයේ සේවකයින් සහ මාර්ෂල් කාර්යාලයේ සේවකයින්, සෙසු මහජනතාව ඇතුළුව සියළු දෙනාට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉටු කිරීමට සහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය වඩාත් ජන හිතකාමී පරිසරයක් සැකසීම තුළින් ආයතනයේ දර්ශනය සාක්ෂාත් කර ගැනීම.

### 7.2.1 හැඳින්වීම

උපරිමාධිකරණ සංකීර්ණය හා එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගොඩනැගිල්ලට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම හා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 1987 අංක 50 දරණ පනත මගින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය ස්ථාපිත කර ඇත. මෙම මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වෙයි.

- ගරු අග්‍ර විනිශ්චයකාර තුමා
- ගරු අග්‍ර විනිශ්චයකාර තුමා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්
- අභියාචනාධිකරණයේ සභාපති තුමා
- අභියාචනාධිකරණයේ සභාපති තුමා විසින් පත් කරනු ලබන අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්
- අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා
- රාජ්‍ය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයා
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති වරයා
- කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා
- මුදල් විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙක් සහ
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්

### 7.2.2 **2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය**

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

(1) පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම්
ගොඩනැගිලි හා සැලසුම්

- උපරිමාධිකරණ ගොඩනැගිල්ලේ පහත මහලේ ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා ලේඛණාගාරයක් ස්ථාපිත කිරීම.
- උපරිමාධිකරණයේ විනිසුරු නිල නිවාස අළුත්වැඩියා කිරීම.

(2) <u>ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්</u>

- (i) ගෘහ පාලන උපකරණ මිළදී ගැනීම්
- (ii) කාර්යාලීය උපකරණ මිළදී ගැනීම
- (iii) කාර්යාලීය ලීබඩු උපකරණ මිළදී ගැනීම
- (iv) යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම

### 7.2.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 166.02 | 159.352 | 96% |
| ප්‍රාග්ධන වියදම් | 20.00 | 13.85 | 69% |
| එකතුව | 186.02 | 173.20 | 93% |

## 7.3 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

### 7.3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 1985 අංක 46 දරණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනයේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදුවේ. එහි කළමනාකාරිත්වය අගවිනිසුරුතුමා සහ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන අධිකරණ අමාත්‍යාංශය මඟින් වෙන් කරනු ලැබේ.

<u>ආයතනයේ විෂයයන් හා කාර්යයන්</u>

- i. අධිකරණ නිලධාරීන් අතර අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්වීම
- ii. අධිකරණ නිලධරන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරිමේ අදහසින් රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- iii. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම
- iv. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

### 7.3.2 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය

**අ) කාල සීමාව තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර**

| | සම්මන්ත්‍රණ පිළිබඳ විස්තරය | සහභාගි වූ විනිසුරුවරුන්ගේ තනතුරු නාමය | පවත්වන ලද වැඩසටහන් | සහභාගීත්ව සංඛ්‍යාව | දරන ලද වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | ලේඛනමය සාක්ෂි, විද්‍යුත් සාක්ෂි, පිළිගැනීම් සහ පාපොච්චාරණය හා සම්බන්ධ ප්‍රායෝගික ගැටළු | අධිකරණ නිලධාරීන් (I වන II වන සහ III වන ශ්‍රේණි ) | 03 | 186 | 164,900 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් භාවිත කරන නවීන තාක්ෂණය සහ විද්‍යාත්මක උපාය මාර්ග පිළිබඳව විනිශ්වයකාරවරුන් සඳහා විශේෂ පවත්වන ලද සම්මන්ත්‍රණය | අධිකරණ නිලධාරින් | 01 | 27 | 11,250 |
| 03 | ක්වාසි විනිශ්චයකාරවරුන් සඳහා සම්මන්ත්‍රණය | ක්වාසි විනිශ්චයකාරවරුන් | 01 | 61 | 56,900 |
| 04 | මහේස්ත්‍රාත් අධිකරණවල දී දඬුවම් පැනවීම සහ අධිකරණ පරිපාලනයේ වැදගත්කම | අළුතින් බඳවාගන්නා ලද අධිකරණ නිලධාරින් | 01 | 19 | 62,050 |
| 05 | සියළුම දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා බැංකු නීතිය පිළිබඳව එක්දින සම්මන්ත්‍රණය | අධිකරණ නිලධාරින් | 02 | 190 | 1,053,414 |
| | එකතුව | | 08 | 483 | 1,348,514 |

**ආ) කාලසීමාව තුළ පවත්වන ලද වැඩමුළු පිළිබඳ විස්තර**

| | වැඩමුළු පිළිබඳ විස්තර | සහභාගි වු විනිසුරුවරුන්ගේ තනතුරු නාමය | පවත්වන ලද සම්මන්ත්‍රණ සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | දරන ලද වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | පරිගණක අපරාධ සහ විද්‍යුත් සාක්ෂි පිළිබඳව අධිකරණ නිලධාරින් සඳහා පවත්වන ලද නේවාසික වැඩමුළුව (3 වන කණ්ඩායම) | අධිකරණ නිලධාරින් | 01 | 70 | 43,448 |
| 02 | වෙරළබඩ කලාපයේ සේවයේ නියුතු මහේස්ත්‍රාත්වරුන් සඳහා සාගර සම්පත් හා සම්බන්ධ නීති පිළිබඳව නේවාසික වැඩමුළුව | අධිකරණ නිලධාරින් | 02 | 95 | - |
| 03 | ජාත්‍යන්තර මානුෂීයමානව හිතවාදි නීතිය පිළිබඳව අධිකරණ නිලධාරින් සඳහා පවත්වන ලද එක් දින වැඩමුළුව | අධිකරණ නිලධාරින් | 01 | 212 | 17,550 |
| 04 | අධිකරණයේ ශ්‍රේෂ්ඨත්වය සඳහා අන්තර්ජාතික මූලික ව්‍යුහය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහාධිකරණ විනිශ්වයකාරවරුන්, දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා පවත්වන ලද වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරින් | 01 | 60 | 579,940 |
| 05 | මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පිළිබඳ ව්‍යවස්ථා සහ අල්ලස සහ දූෂණය පිළිබඳ පොදු දෘෂ්ටිය | මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරින් | 01 | 78 | 392,750 |
| 06 | කම්කරු විනිශ්වය සහා තීරණ බලාත්මක කිරීම පිළිබඳව කම්කරු විනිශ්වය සහා සභාපතිවරුන් සඳහා පවත්වන ලද වැඩමුළුව | කම්කරු විනිශ්වය සහා සභාපතිවරුන් | 01 | 33 | 812,232 |
| 07 | උතුරු වයඹ සහ උතුරු මැද පළාත්වල මහාධිකරණ විනිශ්වයකාරවරුන්, දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා රජයේ ඉඩම් සම්බන්ධ නීතිමය ගැටළු පිළිබඳ වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරින් | 01 | 35 | 667,400 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | කම්කරු විනිශ්චයසභා සභාපතිවරුන් සඳහා නේවාසික වැඩමුළුව | | 01 | 32 | 871,000 |
| 09 | මහාධිකරණ විනිශ්වයකාරවරුන් සඳහා නේවාසික වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 67 | 3,098,000 |
| 10 | මහාධිකරණ විනිශ්වයකාරවරුන් සඳහා අපරාධවල ලත් මුදල් නඩු කළමනාකරණය පිළිබඳව නේවාසික වැඩමුළුව | මහාධිකරණ විනිසුරුවරුන් | 01 | 65 | - |
| 11 | දිසා විනිසුරු මහේස්ත්‍රාත්වරුන් සඳහා වාර්ෂික වැඩමුළුව | අධිකරණ නිලධාරීන් | 01 | 194 | 5,689,793 |
| | එකතුව | | 12 | 846 | 12,172,113 |

**ඇ) කාලසීමාව තුළ පවත්වන ලද ප්‍රායෝගික පරිශීලන සන්නිවේදන නිපුනතා පාඨමාලාව (Customized Bussinnneess Comunication Skills Course) පිළිබඳ විස්තර**

| | සහභාගි වූ කණ්ඩායම | සහභාගි වූ විනිසුරුවරුන්ගේ තනතුරු නාමය | පවත්වන ලද සැසිවාර | සහභාගී සංඛ්‍යාව | දරන ලද වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | විනිශ්වයකාරවරුන් සඳහා ප්‍රායෝගික පරිශීලන සන්නිවේදන නිපුනතා පාඨමාලාව (Customized Bussinnneess Comunication Skills Course) - 03 වන කණ්ඩායම | මහාධිකරණ විනිශ්වයකාරවරුන් සහ අධිකරණ නිලධාරින් | 02 | 20 | 41,250 |
| 02 | විනිශ්වයකාරවරුන් සඳහා ප්‍රායෝගික පරිශීලන සන්නිවේදන නිපුනතා පාඨමාලාව (Customized Bussinnneess Comunication Skills Course) 04 වන කණ්ඩායම | මහාධිකරණ විනිශ්වයකාරවරුන්, අධිකරණ නිලධාරින් සහ කම්කරු විනිශ්වය සභා සභාපතිවරුන් | 07 | 20 | 144,375 |
| | එකතුව | | 09 | 40 | 185,625 |

**ඇ) කාලසීමාව තුළ පවත්වන ලද ප්‍රායෝගික පරිශීලන සන්නිවේදන නිපුනතා උසස් පාඨමාලාව (Customized Bussinnneess Comunication Skills Course) පිළිබඳ විස්තර**

| | සහභාගි වූ කණ්ඩායම් අංකය | සහභාගි වූ විනිසුරුවරුන්ගේ තනතුරු නාමය | පවත්වන ලද සැසිවාර | සහභාගී සංඛ්‍යාව | දරන ලද වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ විනිශ්වයකාරවරුන් සඳහා ප්‍රායෝගික පරිශීලන සන්නිවේදන නිපුනතා උසස් පාඨමාලාව (Customized Bussinnneess Comunication Skills Course) | මහාධිකරණ විනිශ්වයකාරවරුන්, අධිකරණ නිලධාරින් සහ කම්කරු විනිශ්වය සභා සභාපතිවරුන් | 03 | 20 | 61,875 |
| | එකතුව | | 03 | 20 | 61,875 |

ඉ) කාල සීමාව තුළ  පවත්වන ලද විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

| | වැඩසටහන් පිළිබඳ විස්තරය | සහභාගි වූ විනිසුරුවරුන්ගේ තනතුරු නාමය | පවත්වන ලද වැඩසටහන් | සහභාගි වූ සංඛ්‍යාව | දරන ලද වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | මහාධිකරණ විනිශ්චයකාරවරුන් සඳහා අධිකරණ කළමණාකරණය පිළිබඳ පුහුණුව- රාජ්‍ය පරිපාලන අන්තර්ජාතිකය ලන්ඩන් නුවර එක්සත් රාජධානිය | මහාධිකරණ විනිශ්චයකාරවරුන් | 01 | 14 | 8,842,612 |
| 02 | අපරාධ වැළැක්වීම සහ අපරාධ යුක්තිය පිළිබඳ කොමිසමේ 27 වන සැසිවාරය, වියානා නුවර | මහාධිකරණ විනිශ්චයකාරවරුන් | 01 | 01 | 638,940 |
| 03 | විදේශීය අධිකරණ පුහුණු වැඩසටහන, නවදිල්ලි අධිකරණ ඇකඩමිය, ඉන්දියාව | කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් | 01 | 25 | 19,413,845 |
| 04 | විදේශීය අධිකරණ පුහුණු වැඩසටහන, චන්ඩිගා අධිකරණ ඇකඩමිය, ඉන්දියාව | අධිකරණ නිලධාරින් | 02 | 70 | 42,406,180 |
| 05 | විනිශ්චයකාරවරුන් නීතිඥවරුන් සහ අධ්‍යාපනය ලබා දෙන්නන් සඳහා ජාත්‍යන්තර කම්කරු ප්‍රමිති ටියුරින් නුවර - 2018 | කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් | 01 | 01 | 320,500 |
| 06 | මහාරාෂ්ට්‍ර අධිකරණ ඇකඩමිය සහ ඉන්දීය සමථකරණ මධ්‍යස්ථානය සහ ඉන්දීය පුහුණු ආයතනයේදී විදේශ අධිකරණ පුහුණු වැඩසටහන | මහාධිකරණ විනිශ්චයකාරවරුන් | 01 | 37 | 23,716,532 |
| | එකතුව | | 07 | 148 | 95,338,609 |

### 7.3.3 2018.01.01 සිට 2018.12.31දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 32.00 | 30.8 | 96% |
| ප්‍රාග්ධන වියදම් | 6.00 | 0.22 | 4% |
| **එකතුව** | **38.00** | **31.03** | **19%** |

*අධිකරණ පරිපාලන වැය ශීර්ෂ (228) මගින් 2018 වර්ෂය සඳහා විනිශ්චයකාරවරුන්ගේ ධාරිතා වර්ධනය සඳහා රු.මි. 100ක් වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 98.12ක මුදලක් වැය කර ඇත.

## 7.4 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

### 7.4.1 හැඳින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත.

### 7.4.2 බලතල හා කාර්යභාරය සංක්ෂිප්තව

**a.** බලාත්මක කිරීමේ කාර්යභාරය

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් හා අයිතිවාසිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම.

**b.** අර්ධ අධිකරණ කාර්යභාරය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා විභාග කිරීම, එම උල්ලංඝනයට අදාළව උචිත රාජ්‍ය නිලධාරීන්ට සහ රාජ්‍ය ආයතන වලට නියෝග නිකුත් කිරීම

**c.** සේවා කාර්යභාරය

අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහ සහය සැලසීම, වන්දි ප්‍රදානය කිරීම

**d.** නියාමන කාර්භාරය

නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය, අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම හා විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම, අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම

### 7.4.3 අපරාධයක වින්දිතයෙකුට සහ සාක්ෂිකරුවෙකුට පනත යටතේ ආරක්ෂාව ඉල්ලුම් කළහැකි ආයතන

1) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
2) අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂක කොට්ඨාසය
3) අධිකරණය
4) කොමිෂම - ( මානව හිමිකම් කොමිෂම, අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව සහ පරීක්ෂණ කොමිෂන් සභා පනත් යටතේ පත් කරනු ලබන පරීක්ෂණ සභා හෝ ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභා )
5) ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාට

### 7.4.4 පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

2015 අංක 4 දරන පනත මගින් පිහිටුවන ලද තවත් එක් සුවිශේෂී ඒකකයක් වශයෙන් ජාතික අධිකාරියේ උපදේශනය හා මඟපෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලද "අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය" ලෙස හැඳින්වෙන විශේෂ පොලිස් ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිල බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ පොලිස්

අධිකාරීවරයෙකු මෙම කොට්ඨාශය භාර ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇති අතර 2016 නොවැම්බර් මස 03 වන දින සිට මෙහි කටයුතු ආරම්භ කර ඇත.

ජාතික අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන නියමු උපදේශන අනුගමනය කරමින් "කොට්ඨාශය" පවත්වාගෙන යා යුතු අතර අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම, ඔවුන්ට හා ඔවුන්ගේ දේපල වලට සිදු කරනු ලබන තර්ජන, හානි පැමිණවීම් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳව "කොට්ඨාසය" විසින්ම පොලිස් නිලධරයෙකුගේ සහාය ඇතිව විමර්ශනය කිරීම කොට්ඨාශයේ කාර්ය විය යුතු අතර ඔවුන්ට ආරක්ෂාව සහ සහාය වීම සඳහා අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සැලසීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

### 7.4.5 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය

1. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ මූල්‍ය අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම 2018.02.15 දින සිදු වූ අතර 2018.09.03 වන දින රියදුරු තනතුරු සඳහා තිදෙනෙක් බඳවාගෙන ඇත.
2. අධිකාරියේ වර්තමාන කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය කිරීම උදෙසා විවිධ නිපුණතා සංවර්ධන වැඩමුළු සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් 2018 වර්ෂයේදී යොමු කරන ලදී.
3. 2018 වර්ෂයේ, කළමනාකරණ මණ්ඩල රැස්වීම් සෑම මසකටම දෙවරක් බැගින් රැස්වීම්24ක් ද, විශේෂ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 03ක් ද, විධායක කළමනාකරණ මණ්ඩල රැස්වීම් 06ක් ද පැවැත්විණි.
4. 2018 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි සහිත ලිපි ගණන භෞතික වශයෙන් ගත් කළ 86 ක් වේ. එසේ වුවද එක් ලිපියක ඉල්ලීම් කිහිපයක් පැවති අවස්ථා ද දක්නට ලද බැවින් අදාළ ලිපි ඒවායේ සඳහන් ඉල්ලීම් අනුව පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| ඉල්ලීම්වල ප්‍රගතිය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| අවසන් කරන ලද පැමිණිලි | 8 | 32 | 24 |
| බහාලන ලද පැමිණිලි | 2 | 2 | 3 |
| ආරක්ෂාව සැලසූ පැමිණිලි | 1 | 1 | 5 |
| විමර්ශන පවත්වනු ලබන පැමිණිලි | 1 | 5 | 38 |
| නීතිපතිතුමාට යොමු කරන ලද පැමිණිලි | - | 3 | - |
| නීති උපදෙස් දෙන ලද පැමිණිලි | - | 3 | 4 |
| වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි | - | 1 | 11 |
| වගන්ති 16 යටතේ විමර්ශන පවත්වනු ලබන පැමිණිලි | - | 2 | 1 |
| කොමිෂන් සභාවකින් අණ කරන ලද පැමිණිලි | - | 1 | - |
| වගන්ති 24 යටතේ අවසන් කරන ලද පැමිණිලි | - | 1 | - |
| **අධිකාරියට ලැබී ඇති මුළු පැමිණිලි ගණන** | **12** | **51** | **86** |

5. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) රුපියල් මිලියන 40 ක ප්‍රදානයක් ලබා දුන් අතර එම ගිවිසුම 2017.11.24 දින අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ සභාපති හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ විසින් අත්සන්

කරන ලදී. එම ගිවිසුම ප්‍රකාරව අදාළ මුදල්, අධිකාරියේ ගිණුමට 2018 පෙබරවාරි මස බැර වූ අතර ඒවා යටිතල පහසුකම් සංවර්ධනයට හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොදා ගනු ලැබූ අතර තවදුරටත් එම ප්‍රතිපාදන අධිකාරියේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා විවිධ කාර්යන් සඳහා යොදා ගැනේ.

ඒ අනුව අධිකාරියේ ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය යටතේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වන විවිධ නිලධාරීන් වන,

- පොලිස් ස්ථානාධිපතිවරු හා මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන්
- නිතීඥවරුන්
- අධිකරණ වෛද්‍ය නිලධාරීන්
- බන්ධනාගාර කොමසාරිස්වරුන් සහ අධිකාරිවරුන්

සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් සමස්ථ දිවයින ආවරණය වන පරිදි සාර්ථකව නිම කරන ලදී.

6 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) මගින් අපරාධ වින්දිතයන් ආරක්ෂා කිරීමේ හා සාක්ෂිකරුවන්ට සහය දීමේ පණත හා ඔවුන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් අන්තර්ගත කරමින් මුද්‍රණය කරන ලද අත්පොත් 3000ක් 2018 වර්ෂයේ සපයන ලදී.

7. 2018 වර්ෂයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමග නිරන්තර සබඳතා පවත්වාගෙන යමින් අධිකාරියේ ප්‍රගතිය වාර්තා කරන ලදී.

8. අධිකාරියේ සභාපතිතුමාගේ හා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් බන්ධනාගාර කොමසාරිස්වරුන් සමග ඉදිරි වැඩපිළිවෙල පිළිබඳ විශේෂ වැඩසටහනක් දෙසැම්බර් මස 21වන දින පවත්වන ලදී. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ තාක්ෂණික විශේෂඥවරියද සහභාගි විය.

### 7.4.6 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 32.60 | 31.17 | 96% |
| ප්‍රාග්ධන වියදම් | 15.00 | 9.13 | 61% |
| UNDP අරමුදලින් | 21.66 | 18.70 | 86% |
| **එකතුව** | 69.26 | 59.00 | 85% |

## 7.5 ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය

### 7.5.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය වනාහි 2005 අංක 35 දරන පනතින් සංශෝධිත, 2000 අංක 44 දරණ ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතේ නියමයන් ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

පනතේ නියමයන් ප්‍රකාරව, ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම සඳහා මෙන්ම සමථකරණ සහ බේරුම්කරණ සේවා සැපයීම සඳහා මෙම මධ්‍යස්ථානය වගකීමට බැඳී සිටියි. මධ්‍යස්ථානයේ පරිපාලනය සහ කළමනාකරණ කටයුතු කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරා ඇත.

### 7.5.2 වාණිජ සමථ මධ්‍යස්ථානයේ වගකීම සහ කාර්යභාරය

අ. වාණිජ ආරවුල් විසඳීම හා බේරුම් කිරීම සඳහා, සමථ කිරීම හා සමගි කිරීම පුළුල් ලෙස පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම;

ආ. සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණිජ ආරවුල් විසඳා ගැනීම සඳහා පාර්ශ්වයන් දිරි ගැන්වීම;

ඇ. සමථ කිරීම සහ සමගි කිරීම මගින්, -

(i) වාණිජ ආරවුල් බේරුම් කිරීම ;

(ii) වාණිජ කාරණාවලදී පාර්ශ්වකරුවන් අතර පැන නගින මත භේදයන් තුරන් කිරීම,

### 7.5.4 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 5.85 | | |
| ප්‍රාග්ධන වියදම් | 2.5 | | |
| එකතුව | | | |

## 08. අධිකරණ

පහත පරිදි අධිකරණ හා විනිශ්චය සභා 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක විය.

| අධිකරණය / විනිශ්චය සභාව | සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 01 |
| අභියාචනාධිකරණය | 01 |
| සිවිල් අභියාචනාධිකරණ | 22 |
| වාණිජ මහාධිකරණ | 01 |
| විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ | 02 |
| අපරාධ මහාධිකරණ | 32 |
| දිසා අධිකරණ | 32 |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණ | 50 |
| මහේස්ත්‍රාත් අධිකරණ | 52 |
| ළමා මහේස්ත්‍රාත් අධිකරණ | 02 |
| සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ | 25 |
| කම්කරු විනිශ්චය සභා | 39 |

## 8.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 8.1.1 <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම් පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහාය දක්වන අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ශාස්ත්‍ර තක්සේරු කිරීම.

### 8.1.2 2018.01.01 සිට 2018.12.31 දක්වා නඩු විසඳීමේ කාර්යසාධනය

| නඩු වර්ගය | 2018.01.01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 2018.01.01සිට 2018.12.31 දක්වා ගොනුකල නඩු සංඛ්‍යාව | 2018.01.01 සිට 2018.12.31 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2018.01.01 සිට 2018.12.31 දක්වා අවසන් කළ නඩු සංඛ්‍යාව | 2018.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 1,005 | 428 | 1,433 | 406 | 1,027 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 555 | 454 | 1,009 | 253 | 756 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 59 | 59 | 59 | - |
| අභියාචනා නඩු | 492 | 204 | 696 | 195 | 501 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 217 | 107 | 324 | 23 | 301 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 217 | 116 | 333 | 100 | 233 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 16 | 31 | 47 | 39 | 8 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1,464 | 460 | 1,924 | 488 | 1,436 |
| ප්‍රතිශෝධන නඩු | 15 | 03 | 18 | 09 | 09 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | - | - | - | - | - |
| විවිධ / විශේෂ නඩු | 16 | 06 | 22 | 01 | 21 |
| SC TAB APPEL | 04 | - | 04 | 01 | 03 |
| RULE | 07 | 02 | 09 | 02 | 07 |
| SC/Contempt | 25 | 07 | 32 | 03 | 29 |
| **එකතුව** | 4,033 | 1,877 | 5,910 | 1,579 | 4,331 |

### 8.1.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 175.81 | 163.50 | 93% |
| ප්‍රාග්ධන වියදම් | 8.86 | 4.76 | 54% |
| **එකතුව** | 184.67 | 168.25 | 91% |

## 8.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

### 8.2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණ වල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

### 8.2.2. 2018.01.01 සිට 2018.12.31 දක්වා නඩු විමසීමේ කාර්යසාධනය

| නඩු වර්ගය | 2018.01.01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2018.01.01- 2018.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2018.01.01- 2018.12.31 දක්වා තීරණය වූ නඩු සංඛ්‍යාව | 2018.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1,590 | 469 | 664 | 1,395 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 1,140 | 323 | 525 | 938 |
| (රෙම්) | 4 | - | 4 | 925 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 977 | 273 | 325 | 293 |
| සිවිල් අභියාචනා | 561 | - | 268 | 288 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 349 | 175 | 236 | 15 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පත් | 81 | 155 | 221 | 158 |
| බදු අභියාචනා (TAX) | 146 | 26 | 14 | 39 |
| වෙනත් අයදුම්පත් | 75 | 52 | 88 | |
| **එකතුව** | **4,923** | **1,473** | **2,345** | **4,051** |

### 8.2.3 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 67.72 | 66.94 | 99% |
| ප්‍රාග්ධන වියදම් | 5.17 | 2.01 | 39% |
| **එකතුව** | 72.89 | 68.95 | 94% |

## 8.3 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

### 8.3.1 හැඳින්වීම

කාති උසාවි යනු 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත අනුව පිහිටුවනු ලැබූ විශේෂිත අධිකරණයකි. මුළු දිවයිනේම ක්වාසි උසාවි 65 ක් පිහිටුවා ඇති අතර එමඟින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම සහ එකී පනතේ ක්‍රියාකාරකම් අනුව ක්වාසි විනිසුරුවරුන් ලබා දෙනු ලබන තීන්දු සහ නියෝග සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවන් විසින් එකී තීන්දු සහ නියෝග වලට විරුද්ධව අභියාචනා සහ ප්‍රතිචෝදනා ඉල්ලීම් කිරීමට නීතියෙන් සලස්වා ඇති අභියාචනා උසාවිය වන්නේ ක්වාසි අභියාචනා මණ්ඩලය සභාපති ඇතුළුව සෙසු සාමාජික මහතුන් 05 කුගෙන් සමන්විතය.

අධිකරණ ක්ෂේත්‍රෙය් පිහිටුවා ඇති ක්වාසි උසාවි 65 ට ක්වාසිවරුන් සහ කාති අභියාචනා මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළුව අනෙකුත් සාමාජික මහතුන් 05 දෙනා පත් කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්ය.

### 8.3.2 කාති උසාවි

| | | |
|---|---|---|
| අඬ්ඩාලච්චේන | කල්මුණේ | පාතහේවාහැට |
| අක්කරෙයිපත්තුව | කල්පිටිය | පානදුර |
| අකුරණ | කළුතර | පොලොන්නරුව |
| අනුරාධපුරය | මහනුවර | පොතුවිල් (පානම්පත්තුව) |
| අවිස්සාවේල්ල | කාතන්කුඩි (මන්මුනායිපත්තු) | පුල්මුඩේ |
| බදුල්ල | කෑගල්ල | පුත්තලම සහ හලාවත |
| බලපිටිය සහ ඇල්පිටිය | කින්නියා | රත්නපුර |
| බේරුවල | කුලියාපිටිය | සරණාගත ජනසමූහය (කල්පිටිය -පුත්තලම) |
| බෝරා ජනසමූහය | කුරුණෑගල | සායින්දමරුදු |
| බියගම | මහව | සම්මන්තුරෙයි |
| කොළඹ නැගෙනහිර | මන්නාරම | තඹලගමුව සහ කන්තලේ |
| කොළඹ උතුර | මාතලේ | තංගල්ල |
| කොළඹ දකුණ | මාතර | ත්‍රිකුණාමලය |
| කොළඹ බටහිර | මාවනැල්ල | තුම්පනේ |
| එරාවූර් | මෙමොන් ජනසමූහය | ගම්පොල උඩපලාත |
| ගාල්ල | මොණරාගල | උඩතලවින්න (පහත දුම්බර) |
| ගම්පහ (තිහාරිය) | මුතූර් | උඩුනුවර |
| හම්බන්තොට | නාවලපිටිය | වලච්චේන |
| හාරිස්පත්තුව හා පූජාපිටිය | මීගමුව | වවුනියාව |
| හැටන් | නින්දවූර්පත්තු | යටිනුවර |
| හොරණ | නුවර එළිය | යාපනය |
| ඉරක්කාමම් | ඔට්ටමාවඩි | |

### 8.3.3 කාති අභියාචනා මණ්ඩලයේ නඩු විසඳීමේ කාර්යසාධනය 2015 – 2018

| වර්ෂය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 2015 | 266 | 112 | 154 |
| 2016 | 286 | 98 | 188 |
| 2017 | 262 | 82 | 180 |
| 2018 | 271 | 51 | 220 |

### 8.3.4 කාති උසාවිවල නඩු විසඳීමේ ප්‍රගතිය 2015 – 2018

| කාලය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 2015 | 12,042 | 7,032 | 5,010 |
| 2016 | 15,896 | 8,064 | 7,832 |
| 2017 | 15,960 | 7,965 | 7,995 |
| **2018** | 17,790 | 9,011 | 8,779 |

# 09. අනෙකුත් ආයතන

## 9.1 නීති විද්‍යාලය

### 9.1.1 <u>හැඳින්වීම</u>

නීති අධ්‍යාපනය පාලනය කිරීම සඳහා 1900 අංක 02 දරණ සංස්ථාගත නීති අධ්‍යාපන සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා නීති විද්‍යාලය ක්‍රියා කරනු ලබයි. සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ සභාපතිත්වය ගරු අගවිනිසුරුතුමා විසින් හොබවන අතර ගරු නීතිපතිතුමා, ගරු සොලිසිටර් ජනරාල්තුමා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අගවිනිසුරුතුමා විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන්ද, ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුගෙන් හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සභාව සමන්විත වේ.

ශ්‍රී ලංකා නීති විද්‍යාලය වසර 3 ½ ක පාඨමාලාවක් පවත්වන අතර එක් එක් වසර අවසානයේ හා අප්‍රේල් මාසයේදී පරීක්ෂණ තුනක්, එනම් ප්‍රථම, මධ්‍යම සහ අවසාන වසර සඳහා පවත්වනු ලබයි. එම විභාග සමත්වන අපේක්ෂකයින් නීතිඥයන් ලෙස දිවුරුම්දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර අවුරුදු 08 ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෝෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස 06 ක ආධුනික කාලයක් ගත කිරීම අවශ්‍ය වේ.

මෙම ආයතනය ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වේ. එසේම බාහිර කථිකාචාර්යවරුන් ලෙස නීතිඥ වෘත්තියේ යෙදෙන හා වෙනත් ආයතන වල සේවයේ නියුතු අය බඳවා ගැනේ. ඔවුන් ජනාධිපති නීතිඥවරුන් හෝ පළපුරුදු නීතිඥවරුන් වේ.

### 9.1.2 <u>2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාර්යසාධනය</u>

2018 අප්‍රේල් විභාගය සඳහා සිසුන් 1,483 දෙනෙකු විභාගය සඳහා පෙනී සිටින ලදී. එහිදී සිසුන් 806 ක් විභාගය සමත්ව ඇත. 2018 ඔක්තෝබර් විභාගය සඳහා සිසුන් 1,846 ක් ඉල්ලුම් කර තිබුණි.

2018 අධ්‍යයන වර්ෂයේ දේශීය හා විදේශීය එල්.එල්.බී. උපාධිධාරී හා නීති ප්‍රවේශ විභාගය සමත් වූ ශිෂ්‍යයින් ඇතුලුව 1,151 දෙනෙකු පාඨමාලා සඳහා බඳවා ගෙන ඇත.

2019 වර්ෂයට නීති ශිෂ්‍යයින් ඇතුලත් කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් තරග විභාගයක් 2018.09.30 දින පවත්වන ලදී. ඊට අයදුම්කරුවන් 5,206 ක් අතුරින් 231ක් දෙනෙකු සමත්ව ඇත